


ඩබ්. ජයෝද්‍යා බෝදිනී අබේසේකර

# මනඃකල්පිත

## ඩබ්. ජයෝද්‍යා බෝදිනී අබේසේකර

කතා

සන්සුන් සිතුවිලි...

ශුද්ධ වූ පවුලේ බාලිකා මහා විද්‍යාලය කුරුණෑගල

11D

2025-02-08

978-624-208-360-5

# පිදුම

"මනඃකල්පිත"

' මගේ සිතුවිලිවලට ආරම්භය ලැබුනේ මගේ පවුලේ අයගේ සහ මිතුරන්ගේ සන්සුන්

සහයෝගයෙන්. ඔවුන් අසීරු මොහොතේ දී මට අලුත්

ආලෝකයක් ලබා දුන්නා. ඔවුන්ගෙන් ලැබූ ශක්තිය මගේ මනසට

නව උනන්දු රැගත්තා.ඉතින් මේ කෘතිය ඔබේ ජීවිතයට අලුත්

මාවතක් විවර කරනු

නොඅනුමානය..'

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපිපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කලාපරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියනා සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

පටුන..... .•:*¨༺ஓ༻¨ *:•.

පළමු පරිච්ඡේදය

දෙවන පරිච්ඡේදය

තෙවන පරිච්ඡේදය

හතරවන පරිච්ඡේදය

පස්වන පරිච්ඡේදය

හයවන පරිච්ඡේදය

හත්වන පරිච්ඡේදය

අටවන පරිච්ඡේදය

නවවන පරිච්ඡේදය

දහවන පරිච්ඡේදය

එකළොස්වන පරිච්ඡේදය

දොළොස්වන පරිච්ඡේදය

දහතුන්වන පරිච්ඡේදය

දාහතරවන පරිච්ඡේදය

පහළොස්වන පරිච්ඡේදය

දාසයවන පරිච්ඡේදය

දාහත්වන පරිච්ඡේදය

දහඅටවන පරිච්ඡේදය

දහනවවන පරිච්ඡේදය

විසිවන පරිච්ඡේදය

"සහෝදර බැඳීමකින්

වටවූ, ආදරය සහ විශ්වාසය අභිමුව ඇතිවන

අතිමහත්

ගමනක්."

★。゜☁□。★。゜☾゜。★

╚═════════☆♡☆═════════╝

# පළමු පරිච්ඡේදය

චූටි... අනේ නංගි දැන්වත් ඇහැරිනවකෝ..බලනවා දැන් වෙලාව කීයද කියලා...6.30ටත් ලඟයි..7.00 ටවත් පිටත් වෙන්න ඕනෙනේ..

ඒ අපේ ලොකු අයියගේ කටහඬ.ගොඩ දවසකට පස්සේ තමා එයා ඔය මාව උදේ ඇහැරවන්නේ..මොකද එයා marry කරලා අපේ ගෙදරින් ගියාට පස්සේ කවදාවත් මාව උදේට ඇහැරෙව්වේ නෑ.. අම්මෝ......ඉස්සර O/L කාලේ මලකරදරයක් ඒ මනුස්සයගෙන් මට තිබුනේ..පාන්දර 5.00 විතර ඉදලම මාව ඇහැරවනවා..

මොකක්ද ලොකු අයියා.තව වෙලා තියෙනවනේ.මට උපරිම විනාඩි දහයයි යන්නේ ලෑස්ති වෙන්න.ඔහොම කියලා මම අයෙත් බෙඩ්ෂීට් එක පොරවගෙන නිදාගත්තා.. අහ්..මම කව්ද කියලා ඉතින් ඔයාලට කියන්න බැරි උනානේ.මම දිසල්යා රෙශ්මිණි.ගෙදර හැමෝම කතා කරන්නේ චූටි කියලා.වයස අවුරුදු 19 ක දඟකාර වගේම අහිංසකකමත් ටිකක් විතර ගෑවිලා තියෙන ගෑනු ළමයෙක්..මම කුරුණෑගල පාසලක උසස් පෙළ ලියලා දැන් ඉතින් රිසාල්ට් එනකන් ඉන්නේ..

ඉතින් මට අයියල දෙන්නෙක්ම ඉන්නවා.ම්ම්ම්..ලොකු අයියගේ නම දිහස් අකේන්ය..වයස අවුරුදු 28යි.එයා දැන් ඉංජිනේරුවෙක්.. ඒ උනාට එයාගේ පොඩි කාලේ ඉදලා ආසාව තිබිලා තියෙන්නේ ප්රසිද්ධ ගණිත ගුරුවරයෙක් වෙන්න..ඒ හින්දම එයා AL ඉවර උනු දවසේ ඉදලම සාමාන්ය පෙළ ළමයින්ට ගණන් උගන්නලා දැන් ලංකාවේම ප්රසිද්ධ ගණිත ගුරුවරයෙක් වෙලා ඉන්නවා..එයා marry කරේ දුශේනි අහස්යා අක්කව..

__එතකොට මගේ චූටි අයියා..අපි දෙන්නට දෙන්නා අයියා නංගි කියාගන්නේ සාමාන්යෙන් කලාතුරකින්..ඒ තරමට අපි දෙන්නට හදාගත්ත

nicknames.⍰.හැමවෙලේම රණ්ඩු වෙච්ච ගමන්නේ ඉන්නේ අපි දෙන්නා..එයාගේ නම දිනෙත් මෙත්මිණ..අවුරුදු 21 යි. ඔව්..ඔව්..ඒ ඔයාලා හැමෝම දන්න පොඩි මෑන් තමයි..AL වලින් හොද රිසාල්ට් එකක් ඇවිත් කැම්පස් සිලෙක්ට් වෙලා තියෙද්දිත් ක්‍රිකට් ගහන පිස්සු පොර.. හහ්..එයා දැන් ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමෙත් ඉන්නවා..⍰⍰මම හිතනවට වඩා හෙන ප්‍රසිද්ධ චරිතයක්..

# දෙවන පරිච්ඡේදය

චූටි අයියා : නංගි....දැන් තමුසෙට කීදෙනෙක්නම් කතා කරාද කියනවකො..හැබැයි උඹව දාලා යනවා ඈ...

මම : (අඩ නින්දේම) වෙලාව කීයද අනේ..මෙතන බෙරිහන් දෙන්නේ බොරුවට.

චූටි අයියා : වෙලාව..වෙලාව තමයි කියන්න වෙලා තියෙන්නේ දැන්..නැගිටලා බලනවකො ඒකත් මගෙන් අහන්නේ.. පි..ස්..සී.....

අයියා බෙරිහන් දෙන අතරේම මම ෆෝන් එක on කරලා බැලුවේ වෙලාව කීයද කියලා...හපොයි දෙවියනේ..6.50 ත් වෙලා..ඒ වෙලාවෙනම් නැගිට්ටා නෙමෙයි ඉබේටම නැගිටුනා..එහෙම්මම ඇදෙන් පැනලා ඇදගෙන යන ඇදුනුත් අරන් ගියේ ඉක්මනට wash එකක් දාගෙන එන්න...wash දාලා සුපුරුදු පරිදි මගේ black denim එකට red colour t-shurt එක දා ගන්න ගියේ හරියටම විනාඩි දහයයි..ඉතින් ලෑස්ති වෙලා ඉවර උනාට පස්සේ මම අරන් යන bag එකත් අරන් කාමරෙන් එලියට ගියේ I'm ready කියාගෙන..මම එලියට යද්දී හැමෝම යන්න ලෑස්තිත් වෙලා මං දිහා කන්න වගේ බලාගෙන ඉන්නවා.. _නංගි..කීයේ ඉදන්ද ඇහැරවන්නේ කියන්නකෝ..දැන් මෙතන මේ ready ගාගෙන එන්නේ..හරි හරි අනේ හැමදාම වගේ අදත් මම පරක්කුයි..මම ඒක පිලිගන්නවා..

හරියටම වෙලාව උදේ 7.10 යි..කුරුණෑගල ගැට්ටුවාන P&G එක ගාව 7.30 වෙද්දී meet වෙන්න හිටපු අපි ගෙදරින් පිටත් වෙද්දීත් 7.10 යි..මොනවා කරන්නද ඉතින් කලට වෙලාවට වැඩ කරන්නේ නැති එක අපේ

පරම්පරාවෙන් එන ලෙඩක්ද කොහෙදෝ..ඉතින් ගෙවල් දොරවල් lock කරලා එහෙම car එකට නගින්න යද්දී උනේ වෙනද වෙන වැඩේමයි..අපේ මෝඩ චූටි අයියා ගිහින් ඉස්සරහ සීට් එකෙන් ඉදගත්තා...සිරාවටම මූට අමතක වෙලාද දූශේනි අක්කා එයාට වඩා වැඩිමල් කියලා..හහ්...ඒ වෙලාවේ මොකුත් කියන්නේ නැතුව car එකට නැග්ගේ තවත් වෙලා යන හින්දා..හැබැයි මම ගේම අතෑරියේ නෑ...යන මගදී..

ඒයි මෝඩයා...උඹ හිතන් ඉන්නේ උඹ හෙන සීරියස් පොරක් කියලද ඈ...

මොකද බන් වෙලා තියෙන්නේ..කන අස්සේ කෑ ගහන්න එපා ඕහොම.. අක්කා ඔයාට වඩා ගොඩක් වැඩිමල් හරිද..හරි විදිහටනම් අක්කා තමා ඕතන ඉදගන්න ඕනේ..(මමයි චූටි අයියයි උදේට රණ්ඩු උනේ නැත්නම් නිකන් උදේට කෑවේ නෑ වගේ තමයි..අයියා නැත්නම් මම හරි රණ්ඩුවක් ඇදලා ගන්නවා)අයියත් මොකක්දෝ එකක් මට කියාගෙන එන්න හදද්දිම අක්කා කිව්වනේ අනේ කමක් නෑ මල්ලි ඔයා ඉන්න කියලා..ඇත්තට මේ මනුස්සයා ඒ වෙලාවේ මට දාපු කින්ඩි හිනාව තමා මට පෙන්නන්නම බැරි...අක්කත් ඉතින් මොනවා උනත් ගන්නේ ඒ පොල් බූරුවාගේ පැත්ත තමයි...මොනවා කරන්නද ඉතින් අනේ අනිච්චේ වුනු විපතක් කියලා මමත් කට වහගත්තා...අනිත් අය වෙනුවෙන් කට අරින්න යන මටත් හොදම වැඩේ...

හැබැයි අපේ ලොකු අයියනම් කිසිම සද්දයක් නැතුව ආතල් එකේ drive කරන ගමන් ඉන්නේ...  මොකද එයා දන්නවා මගෙයි චූටි අයියගෙයි හැටි.. හිම්දිරි උදෑසනේ ලස්සන සින්දුවක් අහගෙන වාහනේ drive කරනවා කියන්නේ අපේ ලොකු අයියගේ කැමතිම වැඩක්...අනේ මන්ද ඉතින්..එක එක මිනිස්සුන්ගේ එක එක ආශාවල්නේ...

හැබැයි ඒ වෙලාවේ car එකේ ගිය සින්දුවටනම් මමත් ගොඩක් කැමතියි...ඒක ඒ තරමට ලස්සන සින්දුවක්....

සිලිලාර සිත නයනා හෘදේ සිඹිනා......

කෝල නීල වදනා සවන පිනනා......

මේ චන්ද්‍රසූර්ය නගරේ දූවිලි සරනා......

සෙවනැල්ල වෙන්න ප්‍රේමී දාහය නිවනා......⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰

එතකොටම වගේ කෝල් එකක් අවේ ලොකු අයියගේ ෆෝන් එකට.....⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰

# තෙවන පරිච්ඡේදය

මෙන්න ගිහාන් සර් කෝල් කරනවා.අද 7.30 ට meet වෙමු කිව්වෙත් මමමයි.දැන්ටමත් වෙලාව 7.30ත් වෙලා..තවත් ඉතින් විනාඩි 15ක් වත් යනවනේ යන්න..

hello sir good morning..

ගිහාන් සර් : අහ් hello good morning sir..කොයි හරියෙද ඔයාලා ඉන්නේ දැන්..අපි හැමෝම දැන් P&G එක ගාව ඉන්නේ..

ලොකු අයියා : ආ...හරි සර්..තව විනාඩි පහලවක් යද්දී එන්න පුළුවන් අපිටත්..

(විනාඩි පහලවක දුරක් තිබුනට බ්ලොක් එකටත් අහුඋනොත් එහෙම තවත් විනාඩි පහක් දහයක් පරක්කු වෙනවා..)

සර් ලා හැමෝම ඇවිල්ලලු ඉන්නේ..අදත් ඉතින් මම තමයි පරක්කු..ලොකු අයියා එහෙම කිව්වේ මං දිහා අමුතු විදිහට බලන ගමන්.. ඔයාලා බලනවා ඇති ඇයි අයියා එහෙම කිව්වේ කියලා..ඒකටත් ලොකු හේතුවක් තියෙනවා..අපේ අයියා සාමාන්යෙන් class එකක් පටන් ගන්න time එකක් කිව්වොත් ඊට විනාඩි 20 කටවත් පස්සේ තමයි පටන් ගන්නේ..ඒකයි මම කලිනුත් කිව්වේ කලට වෙලාවට වැඩ කරන්නේ නැති එක අපේ පරම්පරාවෙන් එන ලෙඩක්ද කොහේදෝ කියලා..

mmmm...සමහරුනම් දන්නවත් ඇතිනේ ගිහාන් සර් කියන්නේ කව්ද කියල..ලංකාවේ ප්‍රසිද්ධ විද්‍යාව ගුරුවරයෙක්...ලංකාවේ ගොඩක් OL ලියන්න ඉන්න ළමයිගේ හිත දිනාගත්ත ආදරණීය ගුරුවරයෙක් තමයි ගිහාන් සර් කියන්නේ..එයා මේ ගමන යන්න ඇවිත් ඉන්නේ මිහිනි අක්කත් එක්ක..ඒ කියන්නේ එයාගේ wife එක්ක..ම්ම්ම්..මේ ගමන යන්න තව කීපදෙනෙක් එකතු වෙනවා..ඒ තමයි නුරාන් සර් සහ විශ්ව සර්...හැමෝම ඉතින් teachersලා තමා..මොකද අපේ ලොකු අයියට ඉන්න යාලුවන්ගෙන් වැඩිහරියක් ගුරුවරු..

ඉතින් අපි මේ උදේ ඇහැරගෙන යන්නේ කොහෙද කියලා ඔයාලට තවම කිව්වේ නෑනේ..අද සෙනසුරාදා දවසක්..හෙට ඒ කියන්නේ, ඉරිදා රෑ මටයි අයියටයි දෙන්නටම TV program එකක් තියෙනවා..අයියා කියන්නේ මහලොකු cricketer.අම්මටත් ඊයේ හදිස්සියේම කොළඹ එන්න උනා රාජකාරි වැඩකට..ඉතින් අම්මට ඒ වැඩේ ඉවර වෙන්නෙත් ඉරිදා උදේලු..අපේ program එක තියෙන්නේ ඉරිදා රෑ..ඔක්කොම එකම දවසේ වැටුන හින්දා අපි මුලින් plan කරන් හිටියේ හෙට උදේ ඒ කියන්නේ ඉරිදා උදේ කොළඹ එන්න.

නමුත් අපේ ලොකු අයියාට මාස දෙකක් තුනක් එක දිගටම classes කරන්න තිබ්ලා busy උන හින්දයි අයියයි අක්කයි ගොඩක් කාලෙකින් කොහෙවත් ගියේ නැති හින්දයි අපි මේ ගමන අද යන්න දාගත්තා..ලොකු අයියා ඒ විස්තරේ අයියගේ හොදම යාලුවෝ උන ගිහාන් සර් ටයි නුරාන් සර්ටයි විශ්ව සර්ටයි කියද්දී එයාලත් කියලා තිබ්බා ගොඩක් කාලෙකින් කොහෙවත් ගියෙත් නැති හින්දා එයාලත් colombo එන්න join වෙන්නම් කියලා.. ඉතින් අපේ අයියයි අනිත් සර් ලා ටිකයි සෙනසුරාදයි ඉරිදයි දවස් දෙකම ළමයින්ට classes වල නිවාඩු දීලා එහෙම තමා මේ ගමන යන්න ලෑස්ති උනේ...අම්මෝ class එන ලමයිටනම් අවුරුදු වගේ....එකදිගටම classes

වලට ඉදලා ඉදලා එක පාරටම class නෑ කිව්වම එන සතුට දන්නේ ඒක භුක්ති විදලා තියෙන අය විතරනේ..⍰⍰⍰⍰

අයියා වාහනේ කොච්චර වේගෙකින් drive කරාද කියලනම් මම දන්නේ නෑ..හැබැයි විනාඩි 15ක් යන්නත් කලින් අපි P&G එකේ car park එකට දැම්මා..⍰

car park එකේ අපිත් එක්ක යන සර් ලා කට්ටියගේ වාහන වලට අමතරව තව එක වාහනයක් තිබ්බ නිකන් දැකලා හුරු..

# හතරවන පරිච්ඡේදය

අයියේ..අර අතන තියෙන වාහනේ නිකන් දැකලා හුරුයි වගේ නැද්ද..?⍰⍰

කෝ මොන වාහනේද?⍰

අනේ ඇස් පේන්නේ නැද්ද ඕයි.අර කළු පාට BMW එක..(ඒත් එක්කම මගේ ඇඟත් එක්ක නිකන් මොකක්දෝ උනා වගේ..⍰⍰⍰)

ලොකු අයියා : ඔව් ඔව් ඒ එයාගේ වාහනේ තමයි..

මම : හ්මම්ම්...

චූටි අයියා : මෙයාට ඉතින් කාව පෙනුනේ නැතත් එයයි එයාගේ car එකයි නම් හොඳට පේනවා නේද..

දැන්නම් මොකුත් කියලත් බෑ නොකියත් බෑ..ඕන්න ඔහේ කටවහගෙනම ඉන්නවා අනේ...ඕවට මොකුත් කියන්න ගියොත් අන්තිමට මටම තමා හොඳ පදයක් අහගන්න වෙන්නේ..⍰⍰⍰⍰

අම්මෝ...මට දාඩියත් දාලා වගේ නිකන්...හහ්..ඒ එයා තමයි..කොහොමද ඔයාලට එයාව අඳුන්වලා දෙන්නේ..අනේ මන්දා..... ම්ම්ම්ම්ම්ම්..ඇත්තම

කියනවනම් ඒ තමයි අපේ අයියලා දෙන්නගේ වෙන්න ඉන්න එකම මස්සිනා...????

චූටි අයිය : නංගි බහින්නේ නැද්ද?

ඒ වෙලාවේ තමා දැක්කේ හැමෝම වාහනෙන් බැහැලත් එක්ක.සිරාවට මං මේ ලෝකේ නෙමෙයිද හිටියේ..මේ මිනිස්සු ටික බහිනකන් මම දන්නේ නැනේ ඇත්තට..???

ඔන්න ඉතින් මමයි අයියලා දෙන්නයි අක්කයි P&G එකට අවේ කලින් ගිහාන් සර් ලත් එක්ක කතා කරගත්ත විදිහට breakfast ගන්න.. අපේ ලොකු අයියා අක්කගේ අතින් අල්ලගද්දී මං අල්ලගත්තෙ චූටි අයියගේ අතින්.....ඒත් එක්කම මේ මෝඩයා මගේ අත ගසාදැම්මනේ....

චූටි අයියා : අත අරිනවා මගේ අත.වටපිටේ මිනිස්සු හිතයි උඹ මගේ කෙල්ල කියලා..hah...

මම : අනේ වැඩේමනේ මට මේ තෝ වගේ ගස්බල්ලෙක්ගේ කෙල්ල වෙන්න...ඔයත් එක්ක යාලු වෙන්නේ ඉතින් අර ගෙහාෂා වගේ පිස්සු ලලනාවක් තමා...??

චූටි අයියා : මොකක්ද කිව්වේ..අනේ නංගි මේ එයා තමුසේ වගේ නෙමෙයි හරිද?????අනික මනුස්සයෙක්ට ගෞරව කරලා කතා කරන්න ඉගෙන ගන්න..ගෙහාෂා ගෙහාෂා කියලා කතා කරන්න එපා එයාට..(මගේ අත මිරිකමින්)

මම : ඌ..........යී.......අනේ රිදෙනවා...අතඅරිනවකෝ....... පි...ස්....සා.......

චූටි අයියා : අනේ රිදුනද? රිදෙන්න තමයි කරේ.

අනේ උඹලා දෙන්න ඕක නවත්තගන්නකෝ.වාහනෙන් බැහැලා කඩේ ඇතුලට යන ටිකට රණ්ඩුත් වෙනවා...ඉස්සර නම් මම හරි රණ්ඩු බේරනවා..දැන් අම්මා කොහොම ඔයාලව මෙල්ල කරනවද දන්නේ නෑ..දැන් මොකටද ඔය රණ්ඩු වෙන්නේ..ලොකු අයියා කියාගෙන කියාගෙන ගියේ නිකන් රේඩියෝ එකක් වගේ..???

මම : ආ..මේ..රණ්ඩු වෙන්නේද?මම මේ මෙයාට අපේ ගෙහාෂා අක්කව ටිකක් මතක් කරා..ඒකට යකා නැගලනේ මෙයාට.???.

ලොකු අයියා : චූටි..මම ඔයාට කලිනුත් කියලා තියෙනවා ගෙහාෂා නංගිව අල්ලගෙන විහිලු කරන්න එපා කියලා..හැබැයි ආයේ එහෙම අහුවුනොත් මම තැනක් බලන්නේ නෑ ගහනවා හරිද හොඳ පාරක්..

ඊට පස්සේ නම් මම කටවහගත්තා..මොකද මම කොච්චර පණ්ඩිත උනත් ලොකු අයියටනම් ටිකක් විතර බයයි..ටිකක් කිව්වට ටිකකුත් නෙමෙයි ඉතින්..මොකද එයා මට වඩා අවුරුදු 08 ක් විතර වැඩිමල්.. ah..ඔයාලා බලනවා ඇතිනේ කව්ද අර ගෙහාෂා කියන්නේ කියලා..එයාගේ නම ගෙහාෂා වින්සුකි..ඒ තමයි අපේ චූටි අයියගේ මහලොකු ලලනාව..මන් එහෙම කිව්වට එයා හරිම හොදයි..අපේ ලොකු අයියගේ එකම නෑනා පොඩ්ඩ...මගේ නම් ඉතින් දෙවෙනි නෑනා......නෑනා කිව්වට තවම නෑනා වෙලා නෑ හොදේ.....???

# පස්වන පරිච්ඡේදය

ඉතින් ඔන්න අපි P&G ඇතුලට ගියා.අපි යද්දී අනිත් සර් ල ටික ලොකු කයියක..මොකද එයාලත් meet වුනේ ගොඩක් කාලෙකින්..මමනම් ඉතින් ඇතුල් උන ගමන් බැලුවේ සර් ල දිහා නෙමෙයි මගේ අරයා කොහෙද කියලා.. ??එයාව හොයන්න වැඩිය මහන්සි වෙන්න ඕන උනේ නෑ...ඔය ඉන්නේ සර් ලා ටික ඉන්න ටේබල් එකට එහා පැත්තේ ටේබල් එකේම... ?? මටනම් එයාව දකිද්දී අමුතුම හිනාවක් ගියේ..මොකද එයාව මන් මේ දැක්කේ මාසෙකට විතර පස්සේ..මොකද එයා ඉන්නේ කොළඹ අපි ඉන්නේ කුරුණෑගල නේ... ???? වැඩේ කියන්නේ එයා අපිව දැක්කට confuse උනේ වත් නෑනේ..ඒ කියන්නේ එයා දන්නවද අපි ඒ වෙලාවේ එතෙන්ට එනවා කියලා.. ?? ඒත් ඇයි එයා මෙහෙ..කිව්වෙවත් නෑනේ අද එනවා කියලා....ඔන්න ඔහොම ප්‍රශ්න ගොඩක් මැද මම අතරමං උනා..

ඒත් එක්කම අපිව දැකපු සර් ලා ටික අපි ගාවට ඇවිත් කතා කරලා මටයි චූටි අයියටයි අක්කටයි ඉඳගන්න යන්න කියලා ලොකු අයියත් එක්කම ගියේ breakfast order කරන්න..අපි තුන්දෙනා ඉතින් සර් ලගේ wife ලා ඉඳගෙන ඉන්න තැනට යන්න යද්දී අරයත් අපි ඉන්න තැනට නැගිටලා එන්න හැදුවේ..ඒත් ඒ වෙලාවේම එයා order කරපු කෑම එක ආපු හින්දා චූටි අයියා එයාට අතින්ම ඉඟි කරේ ඔයා ඉඳගන්න අපි එන්නම් කියලා..ඉතින් අපි සර් ලගේ wife ලා ටිකටත් කතා කරලා දුශේනි අක්කට එතන ඉන්න කියලා මමයි චූටි අයියයි ආවේ අරයා ඉඳගෙන හිටපු table එක ළඟට...

(අරයා අරයා කිව්වට එයාට නමක් තියෙනවා..ඒක මං පස්සේ කියන්නම්කො)

මම/අයියා : Good morning අයියේ...

: Good morning දෙන්නටම..

චූටි අයියා : ඔන්න එහෙනම් plan එක වැඩ කරා....එක්කෙනෙක් full confused වෙලා ඉන්නේ දැන්..

: ඒකනේ ඒකනේ කියන්නේ...අපි වැඩක් කරොත් එහෙම තමා bokkah.....??

මොකක් මොන plan ද? ඒ කියන්නේ චූටි අයියා දන්නවද එයා අද කුරුණෑගල එනවා කියලා..

මම : මේ මේ මොකක්ද මෙතන වෙන්නේ..දැන් ඔයාලා මට කියන්නේ නැතුව මොකක්ද මේ plan කරේ ඇ....

? : වැඩිය ලොකු දෙයක්නම් නෑ...කොහොමහරි ඔයා සප්රයිස් උනානේ....ඒ ඇති....??

හොද සප්රයිස් එක....මට කියන්නේ නැතුව තව මොන මොනවා කරනවද දන්නේ නෑ මේගොල්ලෝ එකතු වෙලා..???තරහෙන් වගේ කිව්වට හිත ඇතුලින් සිරාවටම අමුතුම සතුටක් තියෙන්නේ..ඇත්තටම සුපිරි සප්රයිස් එකක්..හිතුවෙවත් නැති වෙලාවක එයාව එහෙම හම්බෙන එක ඉතින් සප්රයිස් එකක් තමා...?????

මම : දැන් ඇයි ඔයා අද මෙහෙ ආවේ....

⍰ : ම්ම්..මම අර එක දවසක් කිව්වේ පොඩි වැඩකට අනුරාධපුරේ යන්න ඕනේ කියලා...අද විතරයි පොඩ්ඩක් free තියෙන්නේ..හෙට program එක..ඊට පස්සේ අඟහරුවාදා ඉඳලා ආයේ practice පටන් ගන්නවනේ..ඒකයි හදිස්සියේම අද ආවේ..

දැන් ඔයාලා බලනවා ඇතිනේ කව්ද මේ අරයා කියන්නේ කියලා..කොහොමද එයා අපේ චූටි අයියත් එක්ක මෙච්චර fit උනේ කියලා..නම නම් දැන්මම කියන්නේ නෑ..හැබැයි පොඩි විස්තරයක් කියන්නම්කො...ඇත්තටම මට කලින් අපේ චූටි අයියට තමයි එයාව හම්බුනේ..අපේ චූටි අයියගේ හොඳම යාළුවා තමා ඒ.. හැබැයි අයියට වඩා අවුරුදු දෙකක් නම් වැඩිමල් එයා..සමහරවිට ඔයාලට තේරෙනවත් ඇති..එයත් අපේ ජාතික ක්‍රිකට් කණ්ඩායමේ දක්ෂ ක්‍රීඩකයෙක්.. දැනට ඒ ඇති නේද....

කොහොමින් කොහොමහරි අපි කතා කර කර ඉද්දි අපේ ලොකු අයියා ඇවිත් අරයටත් කතා කරලා එහෙම food ordering bill එකත් අපිට දීලා එයා ගියා එයාලගේ ටේබල් එකට...

: නංගි දැන් result එහෙමත් ළඟදීම එයි නේද?

මම : ඔව් අයියේ..අද රෑ එයිද දන්නෙත් නෑ..මට නම් දැන් නිකන් result එක sureත් නෑ නෑ වගේ...

: බය වෙන්න එපා සුදූ...ඔයා අනිවාරෙන් පාස් වෙලා campus ත් select වෙනවා..

එයා මට සුදූ කියද්දී අපේ චූටි අයියටත් කොහේදෝ නැති කැස්සක් ආවනේ ඉතින්..ඔය මෝඩයා කරොත් කරන්නේ ඔහොම වැඩක්මයි.....ඉරිසියාව ඔය තියෙන්නේ වෙන මොකක්ද??

ඉතින් අපි කට්ටියම කාලා එහෙම ඉවර වෙලා අයෙත් කොළඹ එන්න පිටත් උනා..ගමනක් යද්දී ඉතින් පොඩි video clip එකක් story දැම්මේ නැත්නම් වැඩක් නෑනේ...ඉතින් යන අතරමග ගත්ත ලස්සන වීඩියෝ එකකුත් story දාලා එහෙම හෙමින්ම ගියේ wattpad එක පැත්තට..මේ දවස් වල ඉතින් හැමතැනම තියෙන්නේ කස්තුරි සුවඳ ගැනනේ....අන්තිම පරිච්චේද දෙක කියවන්න තිබුන හින්දා ඒකත් කියවලා ඉවර කරලා එහෙම ලස්සන සිංදු ටිකකුත් අහ අහ දවල් 11.00 විතර වෙද්දී අපි කොළඹට ආවා....කුරුණෑගල ඉදලා කොළඹට වැඩි දුරකුත් නැනේ ඉතිම්.... ඔන්න ඉතින් අපි මුලින්ම ගියේ hilton hotel එකට...අපි එතෙන්ට ගිහින් බුක් කරේ double mattress තියෙන rooms දෙකක්..මොකද අපි රෑ ඉන්නනෙ ගියේ..ලොකු අයියනම් කිව්වේ මටයි අක්කටයි එක room එකක ඉන්න කියලයි අයියලා දෙන්නා එකක ඉන්නම් කියලයි...එහෙම කියන්න ලොකුම හේතුව තමයි මමයි චූටි අයියයි හැමවෙලේම රණ්ඩු වෙන එක...ඒත් ඉතින් එහෙම හරි නෑනේ..ඒ හින්දම මමයි චූටි අයියයි පොරොන්දු උනා රණ්ඩු වෙන්නේ නැතුව සාමයෙන් සමගියෙන් ඉන්නම් කියලා... ??

අනිත් සර් ලත් එයාලට අවශ්‍ය විදිහට rooms බුක් කරගත්තා..

ඉතින් අනිත් සර් ලත් එක්ක කතා කරගත්ත විදිහට 2.00 වෙද්දී lunch වලට එන්න හිතාගෙන මමයි අයියයි room එකට ගියා...

අද උදේ කලින් ඇහැරිය හින්දා room එකට ගිය ගමන් කරේ පොඩ්ඩක් නිදාගත්ත එක...ඉතින් ඊට පස්සේ මම wash දාලා trouser එකක් ඇදලා කළු පාට bella t-shurt එකත් ඇදගෙන pony tail එකක් දා ගත්තේ lunch වලට යන්න..ඒත් අයියනම් කිසිම ලෑස්තියක් නෑ..එයා ඉතින් ඇඳ උඩට වෙලා ෆෝන් එක දිහා බලාගෙන තනියම හිනා වෙනවා..අනේ මන්දා මේ මනුස්සයනම්...ඒයි අයියේ..ඉක්මනට ගිහින් wash එකක් දාගෙන එන්න..2.00ටත් ලඟයි ඈ...ඔන්න ඒ වෙලාවේ තමා එයා පියවි ලෝකෙට ආවේ... ෆෝන් එක චාජ් එකට ගහල අදින ඇඳුනුත් අරන් wash දාන්න යන ගමන් මට කියාගෙන ගියේ අම්මටත් කෝල් එකක් දීලා බලන්න කියලා.

ඒ වෙලාවෙනම් අයියගේ මූන දකිද්දී මට දුකත් හිතුනා..සතියේ දවස් පහම practice ගිහින් matches තියෙන දවස් වලට match ගහලා මූන හොදටම මහන්සි පාට....මොනවා කරන්නද ඉතින් හොදට ඉගෙන ගන්න පුළුවන්කම තියෙද්දී ක්‍රිකට් ගහන්නේ එයාගේ කැමත්තටනේ.. ඔන්න ඉතින් විනාඩි 15 ක් විතර යද්දී අයියා එලියට ආවා..white colour denim short එකට black colour mooz t-shurt එක ඇන්දාමනම් කොල්ලා හැම්ඩියා...කිව්වේ නෑ හිතින් හිතුවා විතරයි..මොකද ඕක කිව්වොත් පොර තවත් අඟල් දෙකක් විතර උස යනවා.. ??

# හයවන පරිච්ඡේදය

අපි දෙන්නා lunch buffet එකට යද්දී අනිත් හැමෝම ඇවිත් හිටියේ.අපි කට්ටිය lunch අරන් එහෙම්මම ගියේ galle face එක පැත්තට..beach එක ලඟට වෙලා galle face ඉස්සෝ වඩේ කන ගමන් sunset එක බලනවා කියන්නේ වෙනමම feeling එකක්නේ..හවස 6.00 විතර වෙනකන් beach එක ලඟට වෙලා නිදහසේ ඉඳලා ආයිත් හොටෙල් එකට ඇවිත් dinner වලටවත් ඉන්නේ නැතුව මමයි අයියයි ගියේ නිදාගන්න..මටනම් ඇඳට ගියා විතරයි මතක..ඇහැරුනේ පහුවදා උදේ..ඒකත් අයියා ඇහැරෙව්වේ නැත්නම් මම තවම නිදි..චූටි අයියටනම් උදේම ඇහැරිලා හොඳට හුරුයි..එයා ඉතින් හැමදාම practice යන්න පාන්දරම ඇහැරිනවනේ....මමයි අයියයි විතරක් නෙමෙයි අනිත් හැමෝමත් ඊයේ රෑ dinner වලට ඉඳලා නෑ..ඒ තරමට කට්ටියටම මාරම මහන්සිය..මොකද ඉතින් මේක විනෝද වෙන්න ආපු ගමනකුත් නෙමෙයිනේ..කට්ටිය ටිකක් නිදහසේ කාලේ ගතකරන්න ආපු ගමනක්නේ.

ඉතින් ඔන්න ඉරිදා උදා උනා කියන්නේ අපේ අයියා කියන විදිහටනම් එයාගේ බියකරුම දවසක්ලු..එයා කියන විදිහට එයාගේ first international match එක දවසේවත් ඔහොම බයක් ආවේ නැලු..එයා ඔය බයවෙලා ඉන්නේ මොකේටද දන්නවද? අද රෑ තියෙන live program එකට...?අපි කොළඹ එන්න ප්‍රධානම හේතුවත් ඕකනේ ඉතිං..

ඒකට අපේ අයියට විතරක් නෙමෙයිනේ මටත් එන්න කියලා තියෙනවනේ..අපි විතරක් නෙමෙයි ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ තව දක්ෂ ක්‍රීඩකයෝ කිහිපදෙනෙකුටයි එයාලගේ පවුලෙන් තව එක්කෙනේකු ගානෙයි තමා ඔය ප්‍රෝග්‍රෑම් එකට ආරාධනා කරලා තියෙන්නේ..ඉතින් ඕකට යන්න තමා අපේ අයියා ඔය පණ බයේ ඉන්නේ...මොකද එයාගේ පලවෙනි live program එක තමයි ඕක..මට නම්

ඉතින් එහෙම ලොකු බයක් නෑ.මොකද මමත් මෙහෙම හිටියට ටිකක් ප්‍රසිද්ධ චරිතයක්...ටිකක් කිව්වට ටිකකුත් නෙමෙයි..මොකද මීට අවුරුදු දෙකකට විතර කලින් මට අහම්බෙන් film එකක රඟපාන්න හම්බුනා..ඇත්තම කියනවනම් ඒ ෆිල්ම් එකේ ප්‍රධාන චරිතේ තමයි මට කරන්න හම්බුනේ..අපි කවුරුත්ම හිතුවේ නැති විදිහට ඒ ෆිල්ම් එක ලංකාවේ ජනප්‍රිය උනා...කොච්චරද කියනවනම් අන්තිමේදී ඒ ෆිල්ම් එක හින්දි වලට පරිවර්තනය කරලා ඉන්දියාවේත් ඒ ෆිල්ම් එක තිරගත උනා. ඔන්න ඔය හේතු නිසා මාව ගොඩක් tv channels වලින් එහෙම ගෙන්නුවා.. ?

මට නම් මේ වෙලාවේ හිතුනේ එකම එක දෙයයි.මිනිස්සු දෙදාහක් විතර ඉන්න තැනක මුළු ලෝකයක් බලාගෙන ඉන්න තැනක cricket ගහන්න පුලුවන්නම්, කිසිම සද්දයක් නැති තමන් දන්නම මිනිස්සු ටිකක් සහභාගී වෙන තැනකට යන්න බයයි කියන්නේ අපේ අයියගෙත් බොරු මරිසිනේ.. ?

එදා දවස නම් මාරම ඉක්මනට ගෙවුනේ...ඒ අස්සේ යාලුවෝ මැසේජ් එවනවා අද රෑ රිසාල්ට් එන කතාවක් තියෙනවා කියලා...ඒ වෙලාවෙනම් මොකක්දෝ උනා..අපි ප්‍රෝග්‍රෑම් එකේ ඉද්දි රිසාල්ට් ආවොත් එහෙම මන් ඉවරයි.....

ඉතින් ඔන්න හවස 6.00 ත් උනා..අම්මත් අපි ඉන්න තැනට දවල් 1.00 විතර වෙද්දී ආවා.ම්ම්ම්..දැන් නම් ඉතින් අපි හොටෙල් එකෙන් checkout වෙන්න යන්නේ..අපි කෙලින්ම යන්නේ ප්‍රෝග්‍රෑම් එක තියෙන තැනටනේ..අනිත් සර් ලනම් කෙලින්ම ගෙවල් වලට යනවා කියලා තමා කිව්වේ.. ?මොකද අද රෑ තියෙන ප්‍රෝග්‍රෑම් එක එයාලත් බලන්න ඕනෙනේ.. ම්ම්.ප්‍රෝග්‍රෑම් එක පටන් ගන්නේනම් රෑ 10.00 ට...

මමනම් ඉතින් ඇන්දේ ලස්සන කළු පාට ඉරි තියෙන දනිහිස ගාවට දිග තියෙන ගව්මක්....ගව්මට ලස්සන shoes දෙකක් දාලා ලස්සනම ලස්සන hair style එකක් දාලා චුට්ටක් මේකප් කරාම කෙල්ල ලස්සනට හිටියා...අයියනම් ඉතින් කළු පාට ඩෙනිමට තනි සුදු t-shurt එකක් දාලා තමයි ගියේ.. එතනට ගියාට පස්සේ තමයි දැක්කේ ඇවිත් හිටපු හැම cricketer කෙනෙක්ම වගේ ඇඳලා හිටියේ black denim & white t-shurts....ඒ වෙලාවේ තමයි දැනගත්තේ ඒ ගොල්ලෝ කතා වෙලා එකම විදිහට ඇඳුම් ඇඳලා තියෙන්නේ කියලා.. ??

අනෙහ්..අරයගෙ ලස්සන....එයා ඇවිත් හිටියේ එයාගේ අයියත් එක්ක... ම්ම්ම්........අනිත් අයත් ඉතින් එයාලගේ අයියලා මල්ලිලා අක්කලා එක්ක ඇවිත් හිටියේ..මන් තමා මෙතන හිටපු පොඩිම එකා....නංගි කෙනෙක්ට ඉන්නේ මන් විතරනේ බලන් යද්දී...කමක් නෑ..ඒකත් ගැම්මක් නෙ......

ඔන්න ඉතින් ප්රෝග්රෑම් එකත් පටන් ගත්තා..මම ෆෝන් එකත් off කරා..මොකද ඔය වෙලාවේ කෝල් එකක් ඒම ආවොත් වාටර් නෙ.....මට සාමන්යෙන් වෙන්නෙත් ඔය වගේ වැඩ..?හැබැයි ලස්සනට ප්රෝග්රෑම් එකත් කෙරීගෙන ගියා..එදා ඒක ගොඩක් දෙනෙක් live බලන ගමන් හිටියේ..මොකද ඉතින් cricketersලනේ හැමෝම වගේ හිටියේ...ලංකාවේ ඉතින් ක්රිකට් පිස්සුවක් වෙලානේ තියෙන්නේ..

ශේප් එකේ වැඩේ යද්දී හරියටම රෑ 12.00 පහුවෙලා ටිකක් වෙලා යද්දී ඇත්තටම උනේ චුට්ටක්වත් බලාපොරොත්තු නොවුන දෙයක්.. ප්රෝග්රෑම් එකේ නිවේදකයින්ට හිටපු ඒ අක්කයි අයියයි රෙදි පටි වගයක් අරගෙන අපිට සප්රයිස් එකක් දෙන්න තියෙනවා කියලා අපි හැමෝගෙම ඇස් වහන්න ගත්තා...අනේ දෙවියනේ මේ live එකක් යන අතරමග මේ මොන පිස්සුවක්ද මේ..ඒකත් කමක් නෑ කියමුකෝ..මුලින්ම වැහුවෙත් මගේ

ඇස් දෙක..එතන හිටපු කාටවත් වෙන දේ හිතාගන්න බැරුව හිටියේ..මම නම් බයටම මගේ එහා පැත්තේ සීට් එකේ ඉඳගෙන හිටපු අපේ අයියගේ අත අල්ලගත්තා..කියන්න බැනේ මව කව්රුහරි උස්සගෙනවත් ගියොත්.. ?

මං ඇත්තටම හිතුවේ ඒ වෙලාවේ එතන හිටපු හැම අයියා කෙනෙක්ගෙමයි අක්කා කෙනෙක්ගෙමයි ඇස් වැහුවා කියලා....

ටිකක් වෙලා ඔහොම ඉද්දි එක පාරටම අරයා සින්දුවක් කියන්න ගත්තා...එයාට ලස්සනට සින්දු කියන්නත් පුළුවන්..?

? ? ? ? ? ? ? ? ? ? ? ? ? ?

සෙවනැල්ලක් මඟහැර යන අඳුරේදිත් මා ගාවින් රැඳී..

නුඹ හිටියද හැම සංසාරෙම මේ වාගේ මගෙ ළඟටම වී...

ඔබ හින්දා මං ගැයූ පෙම් වදන් දෝරේ ගලා ගියා දැන්.....

නුඹෙන් මං විඳිමි හැඟුමන් මා හද නිවාලනා.......

දවසක් ඒවි අපිත් අපෙ හීන වලට යාවී......

ඒ හැම මොහොතේ ළඟින් නුඹ හිටියොතින් ඇති.....

දවසක් ඒවි අපිත් අපෙ හීන වලට යාවී.....

ඒ හැම මොහොතේ ළඟින් නුඹ හිටියොතින් ඇති..........................................

එතකොටම මගේ ඇස් බැඳලා තිබ්බ පටියත් ගැලෙව්වා..දෙවියනේ මගේ ඉස්සරහ ලොකු කේක් එකකුත් තියලා..ඒ පටිය ගලවද්දි එකපාරටම චූටි

අයියා මාව තදින් බදාගත්තත් එක්ක..ඒ මනුස්සයාගේ ඇහෙන් කඳුලුත් ගලනවා... මගේ ජීවිතේ පලවෙනි වතාවට චූටි අයියා මාව බදාගත්තේ.???

හැයියා මේ මිනිස්සුන්ට මොකද මේ වෙලා තියෙන්නේ..අද මගේ උපන්දිනෙත් නෙමෙයිනේ..

හපොයි අන්න අම්මයි ලොකු අයියයි අක්කයිත් එනවා ප්රෝග්රෑම් එකට..ඒ වෙලාවේ තමයි කේක් එක දිහා පොඩ්ඩක් බැලුවේ...

දෙවියනේ............................මොකක්..මොකක්ද මේ ලියලා තියෙන්නේ..congratulations Disalya..... කියලා ගහලා ඊට යටින් ලොකුවට දෙකත් ගහලා තියෙනවා....එතකොටම තමයි announce කරන්න හිටපු අක්කා කියන්න ගත්තේ ඔන්න මෙවර අ.පො.ස උසස් පෙළ විභගයට වාණිජ අංශයෙන් පෙනී සිටි අපේ දිසල්යා නංගි ISLAND 2nd වෙලා තියෙනවා කියලා.....අනේ මට කෑ ගහලා අඩන්න හිතුනා.??????.මේක ඇත්තක්ද..නැත්නම් හීනයක්ද..මන් ගිහින් අම්මව බදාගත්තා....ලොකු අයියයි අක්කයිත් ඇවිල්ලා මාව බදාගත්තා.. අම්මෝ ඒ වෙලාවේ දැනුන සතුට..ඉතින් අර තිබ්බ කේක් ගෙඩියත් කපලා එතන හිටපු හැමෝටම කැව්වා මම...අනේ හැමෝම මට wish කරනවා...මේ වගේ දෙයක් live program එකක උන පලවෙනි වතාවද කොහේදෝ මේ......අරයට කේක් කෑල්ලක් කවද්දී එයාගේ මූනේ තිබ්බ සතුට...ඒක ගැනනම් කියන්න වචන නෑ....

# හත්වන පරිච්ඡේදය

අනේ ජීවිතේ හැම දවසක්ම මෙහෙම සතුටින් තියෙනවනම් කොච්චර හොදද නේද?� ඉතින් මගේ රිසාල්ට් එක ප්‍රෝග්‍රෑම් එක වෙලාවේ ආවේ අහම්බෙන් නෙ.... Announcer අක්කා එ වෙලාවේ මට කිව්වා දැන් එ වෙලාවේ ගොඩාක් කට්ටිය live peogram එක බලන හින්දා ඒ හැමෝටම ඇහෙන්න ඔයා ඔය rank එක ගත්ත විදිහ කියන්න කියලා.....

ම්ම්ම්.... මුලින්ම මට මේ රෑන්ක් එක ගන්න උදව් කරපු හැමෝටම බොහොම බොහොම ස්තූතියි කියලා කියන්න ඕනේ... ඇත්තටම මම මේ තැනට එන්න මාරම විදිහට කැපවුනා...♥ ඒක කොච්චරද කියනවනම් මම කියන්නේ මාර ප්‍රශ්න ගොඩාක් මැද්දේ ජීවිතය ගෙවපු එක්කෙනෙක්..ඒත් ඒ ප්‍රශ්න මොකුත් මම මගේ අධ්‍යාපන වැඩකටයුතු වලට බාධාවක් කරගත්තේ නෑ.... මම කියන්නේ කාටවත්ම බැරි නෑ... ම්ම්.. දැන් ඊලග අවුරුද්දේ OL සහ AL කරන්න ඉන්න නංගිලා මල්ලිලා හැමෝටම කියන්න තියෙන්නේ බැරි නෑ ඔයාලට.. කොච්චර වැටුනත් ආයෙත් හිතට ධයිර්ය අරන් නැගිටින්න.. වැටී වැටී නැගිටින්න ඔයාලට කවදාවත් වරදින්නේ නෑ.......

ඇත්තටම මට මේ වචන ටික කියන්නවත් කිසිම ශක්තියක් තිබ්බෙ නෑ.. මොකද මට ඒ තරමට සතුටුයි...

ප්‍රෝග්‍රෑම් එක ඉවර වෙලා අම්මව හම්බුනාම මට ආයෙත් නිකන්ම ඇඩුනා... අනේ අම්මා කොච්චර මහන්සි උනාද මාව මේ තැනට ගේන්න...�

ඔන්න ඉතින් අපි ඔක්කොම වැඩ ඉවර කරලා ආයෙත් ගෙදර එන්න පිටත් උනා... වාහනේ එද්දී මම මුලින්ම අම්මගෙන් ඇහුවෙ කොහොමද ඒ කේක්

එක එච්චර ඉක්මනට ගෙනාවෙ කියලා... රිසාල්ට් ඇවිත් තියෙන්නේ 11.55 ට විතරලු.. ?දොළහයි ගානක් වෙනකන් අපිට කියලා නැත්තේ කේක් එක ගේන්න ගිය හින්දලු.....?

ඒ වෙලාවේ තමයි මම මගේ ෆෝන් එක on කරේ.. මගේ අම්මේ ෆෝන් එක stuck වෙනවා.. ? ඒ තරමට calls යි massages යි.... ? මම මුලින්ම කෝල් එකක් ගත්තේ මගේ හොදම යාලුවට...

???

හෙලෝ දූෂි.. කොහොමද රිසාල්ට්..

මේ මේ මගේ රිසාල්ට් එක නෙමෙයි බං... අනේ බං උබ දන්නවද මට මේ වෙලාවේ එන සතුට... අඩෝ tv එකේ උබේ ඇස් වහද්දීම මට හිතුනා උබ අනිවා සුපිරියටම පාස් ඇති කියලා.. Congratulations කෙල්ලේ..

හයියෝ.. නවත්තගන්නවකෝ ඔය කට... ඉස්සෙල්ල කියහන් රිසාල්ට්...

A3 බං.. Island rank 22..

අඩෙහ් සිරාවට... ඒ කියන්නේ අපි දෙන්නා මවපු හීන... ඒ ඔක්කොම ඇත්ත වෙනවා නේද... අපි දෙන්නට එකම කැම්පස් එකකට යන්න පුළුවන්නෙ ඒ කියන්නේ.. ?

ඔව් බං.. ඒ ඔක්කොම ඉෂ්ට වෙනවා.... අපි දෙන්නගේ යාළුකම දැනට අවුරුදු 14 ක්....ඉස්සරහට එකම කැම්පස් එකකට ගිහින් එකටම ඉදලා ජීවිතේ ගොඩ දාගමු බං....අපි දෙන්නා මෙච්චර කල් එකතු වෙලා ගහපු ගේම.. ඒ ගේම ඉස්සරහටත් ඒ විදිහටම තියාගමු.....❤ 

ආදරෙයි කෙල්ලේ.... මේ මං ඔයාට හෙට උදේ ගන්නද.. අපි මේ දැන් කොළඹින් පිටත් උනේ....

අහ් හරි.... Bye.. Gn sis.. Lv uuuuu❤

අපි වාහනේ මග යන ගමන් කතා කරන්න තියෙන හැමදෙයක් ගැනම කතා කර කර ගිහින් නොදැනීම ගෙවල් ළඟටම ඇවිල්ලා... දැන් නම් වෙලාවේ පාන්දර 3.00 ට විතර ඇති.... අම්මෝ ඒ උනාට ගෙදර දැක්කහම හිතට දැනෙන සැහැල්ලුව...

ගෙදර ගිය ගමන් wash එකක් දාගෙන ඇඳට ගියේ නිදාගන්න හිතාගෙන.. ඒත් ඇඳට ගියාට චුට්ටක්වත් නින්දනම් ගියේ නෑ.......

මම මේ තැනට එන්න මේ රෑන්ක් එක දාන්න මම කාපු කට්ට... ඒවා මට මැවි මැවී පේනවා..

මෙන්න මෙහෙමයි මම මෙතනට එනකන් මගේ ජීවිතේ ගෙවුනේ...

අපේ ලොකු අයියට අවු.10 දී විතර චූටි අයියට අවු.04 දී විතර මට හරියටම අවු.02 දී මහා අඳුරු දවසක මගේ තාත්තා වැඩට ගිහින් එද්දී accident වෙලා තියෙනවා... තාත්තා ICU එකේ දවස් දෙකක් ඉදලා නැති වෙලා.. මටනම් මේ මොකුත් මතක නෑ.. චූටි අයියටත් එහෙම ලොකුවට මතක නැලු.. හැබැයි ලොකු අයියටනම් හොදට මතකයිලු... ඒ අඳුරු දවසේ ඉදලා මගේ තාත්තා උනේ ලොකු අයියා...එයා මට වඩා අවුරුදු 08 ක් විතර වැඩිමල්නේ.. ඉතින් එයා ඒ කාලේ ඉදන්ම මගේ බර අතට ගත්තා....අම්මට කිසිම කරදරයක් නොකර එයා තනියමම පාඩම් කරලා එහෙම OL හොදට පාස් වෙලා ලොකු ස්කෝලෙකට ගිහින් AL පාස් වෙලා කැම්පසුත් ගියා..... චූටි අයියනම් පොඩි කාලේ ඉදලම ලොකු ස්කෝලෙකට ගියේ.... එයාට OL වලට හරියටම මාස

දෙකක් තියෙද්දී එයාට under 19 national team එකත් එක්ක tour එක්ක යන්න හම්බෙනවා... අම්මා මාරම විදිහට කිව්වා ඒකට යන්න එපා කොහොමහරි exam කරගන්න කියලා.. ඒ කාලේ ලොකු අයියා කැම්පස්... ලොකු අයියා එක දවසක් චූටි අයියට ඔය මැච් එකට යන්න එපා කියන්නම ගෙදර ආවා.... ඉතින් කොහොමහරි චූටි අයියත් හොදට OL පාස් වෙලා AL වලට mathematics කරලා හොදම රිසාල්ට් එකක් දාලා කැම්පස් තේරුණා... ඒත් අනේ මන්දා එයාගේ කැමැත්තට එයා කැම්පස් යන්නේ නැතුව දැන් ක්‍රිකට් ගහනවා......

ඉතින් අම්මගේ ඊලග වගකීම උනේ මම...මට OL අනිද්දා කියලා අද හොදටම උන හැදුනා.. ඒ දැනුන වේදනාව... ඇත්තටම මම OL exam එක ලිව්වේ අම්මගෙයි අයියලා දෙන්නගෙයි හයිය නිසා.. එයාලගේ වචන හින්දා...අන්තිමේදී මම OL අන්තිම දවසේ exam ලියලා ගෙදර ඇවිත් ඉද්දි මට නිකන් කලන්තයක් වගේ ඇවිත් මාව hospital admit කරා.. එතකොට තමයී දැනගත්තේ මට ඩෙංගු කියලා... අනේ මම මෙච්චර ලොකු අසනීපයක් තියාගෙනනේ exam ලියලා තියෙන්නේ.... මට ඩෙංගු කියලා දැනගත්ත වෙලාවේ ඉදලම මට හිතුනෙම මම exam එකට හොද ලකුණු අරන් නැතුව ඇති කියලා... ඒත් අන්තිමේදී මට A08 යි B01 යි ආවා...ඔයාලා දන්නවද අද මම මේ island rank එකක් දාලා ඉද්දි දැනුන සතුට වගේම එකක් තමා මට එදා දැනුනේ... මගේ අම්මා අයියලා දෙන්නා... ඒ ගොල්ලෝ නැත්නම් එහෙම මට OL ලියන්න වෙන්නෙත් නෑ.. ⍰ හැමෝම මට AL වලට bio කරන්න කියද්දී මගේ කැමැත්තට තමා මම commerce තෝරගත්තේ.. මොකද මට ඕන උනේ කවදා හරි දවසක charted accounter කෙනෙක් වෙන්න... AL ලං වෙන්න ලං වෙන්න මට මාරම බයක් දැනුනේ.. මට OL ලියද්දි උන දේවල් AL වලදීත් වෙයි කියලා මට පොඩි බයක් ආවා..ඒත් හිතට ශක්තිය අරන් කොහොමහරි මේ ගමන මම යනවා මට මෙච්චර දුර එන්න උදව් කරපු අම්මමගේයි අයියලා දෙන්නගෙයි ඇස් වල මම අනිවාරෙන් සතුටු කදුළු පුරවනවා කියන බලාපොරොත්තුව හිතේ තියාගෙන තමා මම AL ලියන්න ගියේ...

ඉතින් අද වෙද්දී ඒක වෙලා ඉවරයි... මම කලින් කිව්වා වගේ අපේ චූටි අයියා ජීවිතේට මාව බදාගෙන නෑ... ජීවිතේට එයා මං වෙනුවෙන් අඬලා නෑ.. ⍰ඒත් අද..ඔව් අද මම ඒ දේ කරා.....

මාව මේ තැනට ගේන්න මහන්සි උන මගේ අම්මගෙයි මගේ දෙවෙනි තාත්තා උන මගේ ලොකු අයියගෙයි මගේ රණ්ඩු කාරයා චූටි අයියගෙයි ඇස් වල මම අද සතුටු කඳුළු පිරෙව්වා... අනේ මගේ තාත්තත් අද හිටියනම්.. එයා කොච්චර සතුටු වෙයිද...⍰⍰

මට දැන් සතුටයි දුකයි දෙකම එකට එකතු වෙලා තියෙන්නේ.....⍰⍰⍰⍰⍰

අහසින් එහා

තරු මං දිගේ

පියඹන්න දැන්

විහඟෙකු ලෙසින්

අහසින් එහා

සිහිනය දිගේ

පියඹන්න නම්

ආසයි ඉතිං

හිත කළඹමින්

හැඟුමන් එබී

ඔච්චම් කළේ

කවදාක හෝ

නොදැනුණු ලෙසින්

හද ගී පොතේ

සත්සර නැගී

ඒ ආදරේ......❤️❤️

දැන් වෙලාව උදේ 10.30 යි.. දැන් තමයි මට ඇහැරුනේ... ඊයේ රෑ මගේ ඉස්සර දේවල් මතක් වෙද්දී මට නිකන්ම කියවුනේ ඔය සින්දුව... ඒත් එක්කම මට නින්දත් ගිහින්..දැන් තමා ඉතින් ඇහැරුනේ....❤️

# අටවන පරිච්ඡේදය

මම්.. අද ඉතින් හැමෝම ගෙදර... ගෙදර නිකන් අලුත් වෙලා වගේ.. හැමෝගෙම මූනවල් වල සතුට පිරිලා.. උදේට කාලා එහෙම ඉවර වෙලා කෝල් එකක් ගත්තේ දුෂි ට..

හෙලෝ.. Good morning..

උබට දැන්ද morning උනේ... ?

අයියෝ බං.. ඊයේ නිදියද්දී 3.00 ත් පහුඋනා.. ඒකයි ඉතිම්...

හාකෝ හාකෝ.. ඒක නෙමෙයි බං... ඔයාට නදුනි කතා කරාද..

අනේ නැනේ.... එයාගේ රිසාල්ට් එක මොකද දන්නේ නෑ නේද...

ඒක තමා බං මං මේ කියන්න යන්නේ.. එයාටත් A03 තියෙනවලු..

මොකක්... අනේ මරුනේ....... දැන් එයාටත් කෝල් එකක් ගන්න ඕනේ...

මම්ම... මෙ ටීචස්ලට වදින්න යන්නත් ඕනේ නේද...

අහ් ඔව් නේද ඇත්තට.. මොකද කියන්නේ හෙට යමුද??

අහ් හරි.. මට නම් පුළුවන්.. ?

හරි.. මං කෝකටත් අම්මගෙනුත් අහලා ඔයාට මැසේජ් එකක් දාන්නම්කෝ...

අහ් හරි... Bye එහෙනම්...

දූෂි ට කෝල් කරලා ඉවර වෙලා එහෙම්මම ගත්තේ නදුනි ට.... එයාටත් කතා කරලා ඉවර වෙලා එහෙම සාලේ ට යද්දී කට්ටිය ලොකු සාකච්චාවක...

ආ.. දැන් මං නැතුව මොනවද කට්ටිය කතා කරන්නේ ඈ... ඔහොම කියාගෙනම ගිහින් පැන්නේ ලොකු අයියා හිටපු පුටුවට...ඌ හයත් උනා මං පැනපු පාරට.. ඒ විගසම මගේ පිට හරහා සුපිරි පහරක් එල්ල උනා නිකන් එලොව යන්නම..???

මොනවා කරන්නද.. දවසකට කාගෙන් හරි ගුටියක් කන්නේ නැතුවත් බැනේ...

හරි හරි.. දැන් මොනවද කතා කරන්නේ කියන්නකෝ...

චූටි අයියා : දැන් අපි කතා කරන ඒවා ඔයාට අදාල නැනේ චූටි.. ඒවා වැඩිහිටියන්ගේ කතා..

මම : ආ සිරාවට... මේ හලෝ මමත් දැන් කැම්පස් යන්න ඉන්න සුපිරි පහේ කෙල්ලෙක් හරිද?? 

අම්මා : අනේ මේ රණ්ඩු වෙන්නනම් හදන්න එපා හරිද...

ලොකු අයියා : නංගි අපි මේ කතා කර කර හිටියේ දැන් ඔයා exam පාස් උනානේ... අන්න හැමෝම වගේ හෙට අපේ ගෙදර එන්න plan කරලා ඔයාව බලන්න...

මම : මොකක්.. මගේ මොනවා බලන්නද? අනික දැන් කව්රු කව්රුද එන්න හදන්නේ..

ම්ම්.. අපේ සර් ලා සෙට් එක කෝල් එකක් දුන්නා මට හෙට හවස එනවා කියලා.. එතකොට ආදිච් මල්ලිලත් කෝල් එකක් දීලා කියලා තියෙනවා හෙට හවස එනවා කියලා.... එතකොට ආයේ ඉතින් පව්ලේ කට්ටිය තමා...

අනේ ආදිච් අයියත් එනවද? 

මෙයාටනම් ඉතින් ආදිච් එනවනම් ඊට එහා දෙයක් නෑනේ...

අනේ අයියේ මේ...

ඉතින් ඇත්තනේ කිව්වේ.. 

ඔව් මට ඊට එහා දෙයක් නෑ තමයි.. දැන් ඔයාට අවුල් ද ඇ...

අනේ වැඩේමනේ මට අවුල් වෙන්න.. ඒ උනත් ඔයා එයත් එක්ක වැඩී දැන් ඇ...

ඊයේ රැයින් පස්සේ එයා මගේ වෙලා ඉවරයි හරිතේ.....ඔයාට මතකනේ මම දුන්නු පොරොන්දුව.....

ඔව් ඔව් මතකයි....?

හරි හරි දැන් ඔයාලා මොකක්ද කතා කර කර හිටියේ... ඒ ගොල්ලෝ එනවා කියලා ඉතින් අපිට කරන්න දෙයක් නැනේ.. ?

චූටි ඔලුව කොහේ හරි වැදුනද ඔයාගේ... ගෙදරට ආගන්තුකයෝ එද්දී අපි නිකන් ඉදලා හරියන්නේ නැනේ.. ?

ආ ඔව් නේද.... ??

ම්.. ඔය එන හැමෝම එන්නේ හවස නේද.. හෙට උදේ ස්කෝලෙට යන්නත් ඕනේ..

ඔව් හවස තමයි.... ඒ කියන්නේ ඔයා හෙට ස්කොලේ යනවද??මාත් එක්ක යමු එහෙනම්.. මටත් හෙට town එකට යන්න උවමනාවක් තියෙනවා...

Okayyyyyyyy.... ආ මේ ඒක නෙමෙයි.. චූටි අයියේ හෙට ඔයාලට practice පටන් ගන්නවා කිව්වා නේද.. ඒකට මොකද කරන්නේ..

මමයි ආදිච් අයියයි coach ට කතා කරා.. අපිට බදාදා ඉදලා practice එන්න කිව්වා... ඒක අවුලක් නෑ... ?

හ්ම්...

ඔන්න ඉතින් දුෂි ත් එක්ක කතා කරගත්ත විදිහට අගහරුවාදා උදේ ස්කොලේ ගිහින් ටීචස්ලාටත් වැන්දා... අම්මෝ ස්කොලෙන් අපිට තිබ්බ පිළිගැනීම..... ඔව් ඉතිම් island 2nd වෙනවා කියන්නේ ලේසි වැඩක් නෙමේනේ.... මම ගෙදර ආපු ගමන් පටන් ගත්තේ ගෙදර අස් කරන්න... මම එද්දිත් අම්මයි අක්කයි එකතු වෙලා ගෙදර අස් කරන්න අරගෙන... මොකද ඉතින් අද රෑ අපේ ගෙදරට හෙන මිනිස්සු ගොඩාක් එනවනේ.....

හවස 5.00 විතර වෙද්දී මුලින්ම ගෙදරට පා තැබුවේ අපේ ආදිච් අයියා.... ??දැන් නම් ඔයාලට තේරෙනවත් ඇතිනේ කව්ද ආදිච් කියන්නේ කියලා.... ඔව් ඔව් ඒ අරයා තමා.. ???

එයා ඇවිල්ලා මට හෙන ලොකු තෑග්ගක් දුන්නා... අම්මෝ මේ මොකක්ද මේ.........?පෙනුමෙන් නම් ෆොටෝ එකක් වගේ.......... ඒ වෙද්දි ගෙදරට වෙන කව්රුත් ඇවිත් හිටියෙත් නැති හින්දා මමයි,චූටි අයියයි,ආදිච් අයියයි ගියේ පොඩි කයියක් ගහන්න.....මටනම් අර තෑග්ග කඩනකන් ඉවසිල්ලක් නැතුව හිටියේ.. මට කොච්චර ඉවසිල්ලක් නැද්ද කියනවනම් මම ආදිච් අයියත් ඉන්න තැනම ඒ තෑග්ග කැඩුවා... හැබැයි එයත් ඒකට කැමති උනා.... මොකද මගේ reaction එක එතකොට එයාට බලාගන්න පුලුවන්නෙ......

අනේ දෙවියනේ.. ❤️ඒකෙ ලස්සන.....?

ඔයාලා හිතන්නේ ඒක ඇතුලේ මොනවා තියෙන්න ඇතිද??????

මම කලින් හිතුව දේ හරි.. ඒකෙ ඇතුලේ තිබ්බේ ලස්සනම ලස්සන ෆොටෝ එකක්.. ඒකෙ මමයි ආදිව් අයියයි ඉන්නේ.... අනේ මේ අර එදා ගත්ත ෆොටෝ එකක් නේද... ඒ වෙලාවේ එතන ෆොටෝසුත් ගත්තද???

ඔව් ඉතින් ඒ වගේ ලස්සන වෙලාවක ෆොටෝ නොගෙන බෑනේ....

හයියෝ....... ?හැබැයි මාරම ලස්සනයි ඒක......

දැන් ඔයාලා බලනවා ඇති කවදා ගත්ත ෆොටෝ එකක්ද ආදිව් අයියා මට දුන්නේ කියලා......

ඒක ඇතුලේ තිබ්බේ ආදිව් අයියා මුලින්ම මට කැමති කිව්ව දවසේ ගත්ත ෆොටෝ එකක්.... අම්මෝ එදානම්.......මතක් වෙද්දීත් ලැජ්ජයි වගේ....???

ඒ දේ උනේ මීට මාස හයකට විතර කලින්.. හරියටම මට AL ඉවර වෙලා දවස් දෙකකින්...ඒක ඇත්තටම උනේ හරිම අමුතු විදිහකට..?

# නවවන පරිච්ඡේදය

ඔව්.. එදා තිබ්බෙ Sri Lanka vs Australia මැච් එකක්.. ඒ 3rd T20 match එක... 1st match එක SL win කරත් 2nd එක win කරලා තිබ්බෙ ඔසීලා.. ඉතින් මැච් පිස්සෝ නම් දන්නවනේ 3rd එක දවසට තියෙන ගැම්ම... හදගැස්ම.. කව්රු දිනයිද කියලා කව්රුත් දන්නේ නෑ... ඉතින් AL ත් ඉවර වෙලා තිබුන හින්දා එදා 3rd match එක බලන්න මමයි මගේ යාලුවෝ හතරදෙනෙකුයි ගියා...

එදා අපේ චූටි අයියත් squad එකට select වෙලා හිටියේ... එයා විතරක් නෙමෙයි එදා ආදිව් අයියත් මැච් එක play කරන්න හිටියා... ඊට අවුරුදු දෙකකට විතර කලින් තමයි ආදිව් අයියා අපේ අයියගේ හොදම යාළුවා උනේ..ඒ කියන්නේ දැන් ඉදන් බැලුවොත් එහෙම මීට අවුරුදු හතරකට විතර කලින්.. ?

ඉතින් ඒ දවස් වල ආදිව් අයියා මගෙත් හොද යාලුවෙක්... එදා මැච් එකට ඒ ගොල්ලෝ යන්න කලින් මම අපේ අයියටයි ආදිව් අයියටයි කියලා යැව්වේ එදා මැච් එක නිකන් අවුල් වීගෙන වගේ එනවනම් එහෙම ඔයාලා දෙන්නා එකතු වෙලා මැච් එක ගොඩ දාලා දෙන්න ඕනේ කියලා..මොකද අපේ අයියයි ආදිව් අයියයි තමා අග පෙළ පිතිකරුවෝ විදිහට හිටියේ.. ඒ දෙන්නම allrounders ලා.. ඒ උනාට වැඩියෙන් කරන්නේ බෝල් කරන එක.... මම ඒ දෙන්නට කිව්වහම කොහොමහරි මැච් එක ගොඩ දාන්න කියලා චූටි අයියා එකපාරටම ඇහුවා මගෙන් අපි මැච් එක දිනෙව්වොත් ඔයා මොනවද අපිට අරන් දෙන්නේ කියලා.. ? අඩෝ මූ මාර බඩුවක්නේ... දැන් නංගි මොනවහරි අරන් දෙනවනම් විතරද මැච් දිනන්නේ.. අනේ පිස්සු නැතුව හිටහන් බං... ඒ ආදිව් අයියගේ සුමිහිරි වචන පෙළක්..?

ඉතින් කොහොමහරි එදා මැච් එකේ අපිට target කරන්න තිබ්බේ ලකුණු 189 ක්... ඒත් කව්රුත් හිතුවේ නැති විදිහට අන්තිමට අපිට ලකුණු 30 ක් විතර ගහන්න තියෙද්දී අපේ batters ලා හැමෝම වගේ අවුට් උනා..හරියටම ඉතුරු වෙලා තිබ්බෙත් ball 18 යි.....දැන් අන්තිමට ඉතුරු උනේ අපේ අයියයි ආදිච් අයියයි විතරයි...... එදා පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා පිටිය ශ්‍රී ලංකා සහ ඕස්ට්‍රේලියානුවන්ගෙන් පිරී ඉතිරි ගිහින් තිබ්බේ... ලංකාවේ මැච් එකක් තියෙනවා කියන්නේ ඉතින් මුළු stadium එකම ශ්‍රී ලංකා ප්‍රේක්ෂකයන්ගෙන් පිරෙනවා කියන එකනේ... අවසාන වෙලාවේ හැමෝගෙම හදගැස්ම වැඩි වෙලා තිබ්බේ.. ප්‍රේක්ෂකයෝ කව්රුත් කිසි සද්දයක් නෑ... හැමෝම භය වෙලා මාරම උවමනාවෙන් අපේ අයියයි ආදිච් අයියයි ගැන බලාපොරොත්තුවකින් හිටියේ....... මං නම් ඒ වෙලාවේ ප්‍රර්ථනා කරේ මං අර ඉස්සෙල්ල කිව්ව එක හරි මතකේ තිබිල මේ දෙන්නා මැච් එක දිනවන්න ඕනේ කියලා....

අම්මෝ මෙන්න මුන් දෙන්නා ෆෝම් වෙලා වගේ එක දිගට හයේ පාරවලුයි හතරේ එව්වයි ගහන්න ගත්තා.... අන්තිමේදී කව්රුත්ම හිතපු නැති විදිහට එදා මැච් බලපු හැමෝටම heart attack හදවන්න ඔන්න මෙන්න තියලා මැච් එක දින්නා... අන්තිමේදී තරගයේ වීරයා උනේ ආදිච් අයියා... එයා බෝල 08 කින් ලකුණු 22 ක් අරන් තිබ්බා..ඉතින් t20 series එකමත් දිනලා එහෙම මහ රෑ අපිව හම්බුනාට පස්සේ චූටි අයියා මට එක පාරටම කිව්වා අපි දැන් කොල දෙකක ලියලා දෙනවා පොඩි දේවල් ටිකක් ඒවා ඔයා අපිට අරන් දෙන්න ඕනේ කියලා... දැන් ඉතින් බෑ කියන්නත් බෑනේ... අන්තිම වෙලාවේ මේ දෙන්නා හින්දනේ මැච් එක දින්නෙත්... මමත් ඉතින් හා කිව්වා...

මට මුලින්ම දුන්නේ චූටි අයියගේ කොලේ.. මං බය වෙලා හිටියේ මේ මනුස්සයා මොනවා ඉල්ලයිද කියලා... එයා ඉල්ලලා තිබ්බේ මං එක දවසක් එයාට දෙන්නේ නැතුව කාපු අලුත් චොක්ලට් වර්ගෙකින් එකක්....... හයියෝ මේ මනුස්සයනම්... මං ඇත්තටම හිතුවේ ඊට වඩා බරපතල මොනවා හරි ඉල්ලලා ඇති කියලා.. 

දැන් ඉතින් ආදිව් අයියගේ කොලේ... එකේනම් ඉතින් කොහොමත් බරපතල දේවල් නෑ කියලා දන්නවනේ... මම සතුටෙන්ම භාර ගත්තේ එයාගේ කොලේ.. ?ඒත් ඒකෙ ලියලා තිබ්බ එක දැකලා මාව ගල් ගැහුනා... මම ඒ වෙලාවේ කෙලින්ම බැලුවේ චූටි අයියා දිහා... ඒ මනුස්සයා අමුතු විදිහට හිනා වෙනවා මට..... ඒ කොලේ ලියලා තිබ්බේ,

You are my heart..❤

You are my life..?

You are the only person I love the most in life..?

always be mine sis...?

This is my only request.??

අනේ ඒ වෙලාව නම් මට කවදාවත් අමතක වෙන්නෙ නෑ... මගේ හිතෙත් ඉතින් පොඩි පොඩි අමුතු අමුතු විදිහේ අදහස් තිබ්බට මම ඒවා කිව්වේ මගේ යාලුවෝ ටිකට විතරයි.. අඩුම අපේ අයියටවත් කිව්වේ නෑ... ඒත් ඒත් මේ වෙලාවේ ඒ කොලේ තිබ්බ එක දැක්කට පස්සේ නම් මට පොලව පලාගෙන යන්න හිතුනා...එක පැත්තකින් සතුට..අනික් පැත්තෙන් ලැජ්ජාව...?

මම ඒ වෙලාවේ නම් ආදිව් අයියට මොකුත්ම කිව්වේ නෑ... Thanks කියලා එහෙම්මම ආවේ චූටි අයියා හිටපු තැනට.. මං එතන ආදිව් අයියත් එක්ක හිටපු වෙලාවේ ගත්ත ෆොටෝ එකක් තමා අද ආදිව් අයියා මට දුන්නේ... එදා අර වෙලාවේ මම ආදිව් අයියට මොකුත්ම කිව්වේ නැති උනාට පස්සේ යම් යම් දේවල් වෙලා චූටි අයියා හරහම මම එයාට ලස්සන පණිවිඩේකුත් යැව්වා..???

මම පස්සේ අපේ චූටි අයියගෙන් ඇහුවා කෝමද එයා මං ගැන කිව්වේ මුලින්... අනික ඔයා කෝමද එහෙම දේකට කැමති උනේ කියලා..පස්සේ අයියා විස්තරේ කිව්වට තමා දැනගත්තේ කොහොමද මේ දේවල් උනේ කියලා.. අන්තිමේදී මට අපේ අම්මගෙන්වත් කාගෙන්වත් ඒ සම්බන්දෙට අවසර ගන්න ඕනේ උනෙත් නෑ.. ⍰⍰ මම අවසර ගන්න ඉස්සෙල්ල ආදිච් අයියයි චූටි අයියයි ඒකට අවසර අරගෙන... ඇත්තම කියනවනම් ආදිච් අයියා ඒක මට කියන්න කලින් අපේ අම්මගෙනුයි ලොකූ අයියගෙනුයි තමා අහලා තියෙන්නේ... මොකද නැත්නම් අන්තිමේදී මම කැමති වෙලා ගෙදර අය අකමැති උනොත් මම මාර අවුල් යන හින්දා...⍰⍰⍰⍰

# දහවන පරිච්ඡේදය

මං ඉතින් එදා චූටි අයියගෙන් ඇහුවනේ කොහොමද එයා මුලින්ම මං ගැන කිව්වේ කියලා.... ඒක වෙලා තියෙන්නේ මෙන්න මෙහෙම...

මීට අවුරුදු හතරකට විතර කලින් ඒ කියන්නේ මම 10 වසරේ 11 වසරේ වගේ ඉද්දි තමයි අපේ චූටි අයියා SL national cricket team එකට select උනේ.. ඉතින් අපේ අයියා මුලින්ම national ටීම් එකේ අයත් එක්ක ප්රැක්ටිස් කරන්න ගිය දවසේ අපේ අයියට මුලින්ම හම්බෙලා තියෙන්නේ ආදිව් අයියව.... එදා අපේ අයියා practice යන පලවෙනි දවස හින්දා උදේ 8.00 වෙද්දී යන්න ඕනේ එකට උදේ 6.30 විතර වෙද්දී අපේ අයියා ගියා... අයියා යද්දීම ආදිව් අයියා gym එකේ තමා ඉදලා තියෙන්නේ... ඉතින් SLCC එකේ forms එහෙම පුරවලා අපේ අයියා ගිහින් තියෙනවා ආදිව් අයියා ගාවට.. ඊට පස්සේ ඉතින් දෙන්නා කතා කරලා දැනඅඳුන ගෙන එහෙම ඉදලා තියෙනවා.. දැන අඳුන ගත්තට ආදිව් අයියා විතරයි අපේ අයියව අඳුරගෙන තියෙන්නේ.. අපේ අයියා ආදිව් අයියා ගැන ඔක්කොම විස්තර දන්නවා.. එයා ගැන මුළු ලෝකෙම දන්නවා..?

ඉතින් කොහොමහරි දවස් දෙක තුනක් ගියාට පස්සේ විස්තර කතා කර කර ඉද්දි ආදිව් අයියා අපේ අයියගෙන් අහලා තියෙනවා පව්ලේ විස්තර.. එතකොට තමයි අයියා අපි ගැන විස්තර කියලා අපේ ෆොටෝ එහෙමත් පෙන්නලා තිබ්බේ... මගේ ෆොටෝ එක දැක්කට පස්සේ ආදිව් අයියා භයවෙලා වගේ අපේ අයියා දිහා බලලා...අයියා හිතලා තියෙන්නේ මම අර ෆිල්ම් එකක රඟපෑව කිව්වනේ... ඒකෙ හිටපු ගෑනු ළමයා මම කියලා දැනගත්තම ඉතින් ටිකක් confuse වෙනවනේ... ඒ හින්දා ආදිව් අයියා භයවෙලා වගේ ඉන්නවා කියලා....

වැඩේ කියන්නේ එදා ඉඳලා ආදිච් අයියා අපේ අයියත් එක්ක හෙන පිට්.. කොච්චරද කියනවනම් අපේ අයියා සෙනසුරාදා ඉරිදට ගෙදර ආපුහමත් ආදිච් අයියා ගැන කියවනවා......??

ඉතින් ඔහොම අවුරුද්දක් විතර ගෙවෙද්දී ආදිච් අයියා නිතරම වගේ මං ගැන විස්තර අහලා තියෙනවා අපේ චූටි අයියගෙන්.... පස්සේ පස්සේ වෙද්දී චූටි අයියටත් නිකන් ට්රැක පැනල වගේ එක පාරටම ආදිච් අයියගෙන් අහලා ඇයි ඔයා ඔච්චර අපේ නංගි ගැන අහන්නේ කියලා... දැන් ඉතින් ඒ දෙන්නා හොඳම යාලුවෝ දෙන්නනේ.. ඒ හින්දා ආදිච් අයියත් විස්තරේ කියලා...

මම අර ෆිල්ම් එකේ රඟපෑවේ අවු. 15 දි විතරනේ ඒ වෙද්දී ආදිච් අයියට වයස 19 යිලු... ආදිච් අයියා මාරම ආසාවෙන් තමයි ඒ ෆිල්ම් එක බලලා තියෙන්නේ..?එයා ඒ ෆිල්ම් එකෙන් මාව දැකපු දවසේ ඉඳලා මං ගැන ගොඩාක් විස්තර හොයලා.. ඒත් එයාට වැඩි විස්තරයක් හොයාගන්න හම්බෙලා නෑ.. මොකද ඉතින් මට කියලා ඒ කාලේ ෆෝන් එකක් එහෙම තිබ්බේ නැනේ FB, Inster එහෙම පොස්ට් දාන්න... මගේ විස්තර ගොඩාක් සමාජේ මිනිස්සු දැනගත්තේ මාව අර ගෙන්නපු tv programmes හින්දා.... ආදිච් අයියා මං ගැන එයාගේ යාළුවොන්ටත් කියලා ගොඩාක් මං ගැන හොයන්න තව තව උත්සහ කරලා... යාලුවෝ කියන්නේ national team එකේ අනික් අයත් එක්ක... ඉතින් මං ගැන වැඩිය විස්තර හොයාගන්න බැරි උන හින්දම එයා මාව හිතේ තියාගෙන කවදා හරි මාව හොයාගන්නවා කියලා ලොකු බලාපොරොත්තුවකින් තමයි ඉඳලා තියෙන්නේ... ඔහොම ඉද්දි තමා අපේ අයියාත් national team select වුනේ... දැන් ඉතින් හැමෝම විස්තරේ දන්නවනේ... අපේ චූටි අයියටත් ඉතින් මාරම චූන් එකේ ඉඳලා තියෙන්නේ ආදිච් අයියා මං ගැන එහෙම කිව්වට පස්සේ.... ටික දවසක් ඔහොම ඉඳලා අපේ අයියා ආදිච් අයියගෙන් අහලා තියෙනවා = අපේ අයියා ආදිච් අයියා ගැන මට කියන්නද කියලා... ඒත් ආදිච් අයියා ඒකට කොහොමත්ම කැමති වෙලා නෑ... අපේ අයියා ඇයි කියලා ඇහුවට පස්සේ තමා ආදිච් අයියා කියලා තියෙන්නේ නංගිට තවම අවු. 16 යිනේ.. මේ

අවුරුද්දදේ OL ත් ලියන්නනේ ඉන්නේ දැන් ඕක කිව්ව ගමන් නංගි OL ත් ඇන ගනී ඒ හින්දා එයාට දැන්මම මොකුත් කියන්න එපා කියලා..... ඒ වෙලාවේ තමයි අපේ අයියටත් ඒක මීටර් වෙලා තියෙන්නේ.... ඒ හින්දම චූටි අයියා ඒ මොකුත්ම විස්තර මට කිව්වේ නෑ....

හැබැයි අන්තිමේදී ආදිව් අයියා අපේ ගෙදරත් යන්න එන්න ගත්තා... ඔය සමහර meetings වලට එහෙම යන්න තියෙන දවස් වලට ආදිව් අයියා අපේ ගෙදර ඇවිත් රෑ ත් එක්ක ඉදලා ගියපු අවස්ථා තිබුනා... වැඩේ කියන්නේ ඒ වත් මට ආදිව් අයියා ගැන මොකුත්ම හිතුනේ නෑනේ...... පස්සේ කොහොමහරි මගේ OL ඉවර උනාට පස්සේ චූටි අයියා ආදිව් අයියගෙන් අහලා තියෙනවා මට කියන්නද කියලා.. ඒත් ආදිව් අයියා කියලා එපා එයා AL කරනකන් අපි ඉමු AL කෙලවගත්තොත් ඔක්කොම ඉවරයිනේ කියලා..... අපේ අයියටනම් ඒ වෙලාවේ පුදුමත් හිතිලා... අයියා අහලා තියෙනවා එයාගෙන් ඔයාට පුලුවන්ද ඔහොම ඉවසගෙන ඉන්න කියලා....

ආදිව් අයියා කියලා තියෙන්නේ, මල්ලි මම ඔයාව හම්බෙන්නත් කලින් ඉදලා දිසල්යා නංගිව හෙව්වේ... ඒ කාලෙත් එක්ක ගත්තහම අදට බැලුවොත් මම අවුරුදු දෙකයි මාස පහක් එයා වෙනුවෙන් මග බලාගෙන හිටියා... ඉතින් එච්චර කල් මම ඉවසපු එකේ තවත් අවුරුදු දෙක්ක එයා වෙනුවෙන් ඉවසනවා කියන එක ඒ හැටි දෙයක් නෙමෙයි....මං කැමති නෑ එයා මං වෙනුවෙන් exam අනාගන්නවා බලන්න.... මට ඔයාව හම්බුන එකම ඇති මේ ටිකට.. ඔයාව හම්බුනේ නැත්නම් මං හිතන්නේ මට කවදාවත් දිසල්යා ව හොයාගන්න බැරි වෙනවා.......... ??? උබ නංගිව පරිස්සම් කරගනින්කෝ එතකන්...♥□

ඔන්න ඔහොම මහ පණ්ඩිත කතා ටිකක් තමයි ආදිව් අයියා අපේ චූටි අයියට කියලා තියෙන්නේ.. ??

ඉතින් AL අවුරුදු දෙක ගෙවෙන අතරමගදී තමයි මටත් නිකන් ආදිච් අයියා ගැන අනං මනං හිතෙන්න ගත්තේ..... එයා ගැන හිතන එක වැඩි උනේ මගේ මෝඩ තකතීරු මගේ ඕනම ගොං වැඩකට උදව් කරන අතිජාත පජාත මිත්‍රයෝ දෙතුන් දෙනා හින්දා.. උං ටික හැම වෙලේම ආදිච් අයියා ගැන කිය කිය මට විහිලු කරද්දී ඉතින් එළියෙන් තරහ ගිහින් වගේ හිටියට යටි හිතින් ආවේ අමුතුම කුජීත සතුටක්..??

ඔය අතර වාරයේ තමා ආදිච් අයියා මං ගැන අපේ අම්මටයි ලොකූ අයියටයිත් කියලා අවසර අරන් තියෙන්නේ.... අපේ අම්ම නම් ආදිච් අයියා අපේ චූටි අයියගේ යාළුවා උන දවසේ ඉදන් එයාව අපේ අම්මගේම පුතෙක් විදිහට හිතලා සැලකුවේ.... අන්තිමේදී ආදිච් අයියා මුලින්ම මස්සිනාල දෙන්නව කැමති කරවගෙන ඊට පස්සේ නැන්දම්මගේ හිත කැමති කරවගෙන අන්තිමේදී මගෙත් හිත නිකන්ම හොරාගත්තා..?❤□?

ඔන්න ඔහොම තමයි ඉතින් අපේ කතාව සිද්ධ උනේ......

ලොකූ අයියා : මේ ඔයාලා කට්ටිය අර පැත්තට පොඩ්ඩක් එන්නකෝ... ගෙදරට ගොඩාක් කට්ටිය ඇවිල්ලත් එක්ක ඉන්නේ දැන්.....

අහ් හරි අයියේ අපි එන්නම්........

අපි තුං දෙනා සාලෙට යද්දී ගෙදර මිනිස්සුන්ගෙන් පිරිලා... සිරාවට මේ මං හින්දනේ මෙච්චර මිනිස්සු ඇවිල්ලා ඉන්නේ.. වෙලාවකට මට හිනත් යනවා... ?

ඉතින් එදා රෑ 1.00 - 2.00 විතර වෙද්දී ආපු හැමෝම වගේ ගියා.. අන්තිමට ඉතුරු උනේ අපේ ගෙදර උදවියයි ආදිච් අයියයි විතරයි.. බදාදා එයාලට

practice  පටන් ගන්න හින්දා දෙන්නම අපේ ගෙදර ඉඳන් යන්න plan කරගෙන...� ඉතින් මහ පාන්දර ice වගේ සීතල වතුරෙන් ඇඟත් හෝදගෙන නිදාගත්තේ හෙටනම් දවල් වෙනකන්ම නිදාගන්නවා කියලා හිතාගෙන...

හයියෝ... මගේ සුවබර නින්දට හෙනයක් පාත් උනා වගේ උදේ පාන්දරම ෆෝන් එකට කෝල් එකක්...

මම නිදිමරගාතේම answer කරේ මොකා කතා කරත් අදනම් හොඳ පදයක් කියනවා කියලා හිතාගෙන....

* Hello good morning රිෂී..

~ මොකාද ඕයි මේ උදේ පාන්දර කෝල් ගන්නේ... උබලට වෙන වෙලාවක් ඇත්තෙම නැද්ද ඇ මේ පාන්දර ගන්නේ... තියනවා ඕයි ෆෝන් එක මං පස්සේ ගන්නම්.. ඇයි යකෝ.. ��

ඔහොම කියලා call එක කට් කරා විතරයි ආයෙත් සැරයක් ෆෝන් එක ring වෙනවා.. මොන කරදරයක්ද අප්පා මේ...මොනවට උදේ පාන්දර ගන්නවද මන්දා.. ඒ සැරේනම් answer කරේ නෑ එහෙම්මම කෝල් එක කට් කරා.. ��

චූටි මෙන්න ඔයාට කෝල් එකක්..

ඒ පාර චූටි අයියා කතා කරනවා.. WTF..�� මුන් එකෙක්වත් මට නිදාගන්න දෙන්නේ නෑනේ ඇත්තට... මේකනම් පෙර කරපු මොකක්ම හරි අකුසලයක් තමා...

මොකා උනත් ඔච්චර කෝල් ගන්නේ මොකක් හරි උවමනාවකටනේ.. ඒ හින්දම මම ඇහැරිලා චූටි අයියා ගෙනත් දුන්න එයාගේ ෆෝන් එකට ආපු කෝල් එක ආන්සවර් කරා...

~ Hello...

* හෙලෝ තමයි.... මොකද උබ අර දෙව්මි ට බැන්නේ කියනවකො... පව් ඕයි... මගේ ෆෝන් එකේ සල්ලි තිබ්බේ නැති හින්දා උබට මැසේජ් දැම්මා.. උබ ඉතින් ඔන්ලයින් එන එකක්යැ... ඒ හින්දා මං දෙව්මි ට කිව්වා උබට කෝල් එකක් අරන් විස්තරේ කියන්න කියලා.. උබ ඒ ළමයට බැනලා..

ඊට පස්සේ මම මේ whatspp කෝල් ගන්න හදනවා උබට උබේ ෆෝන් එක off... ඒ හින්දා අයියගේ එකට ගත්තේ...

~ අඩෝ නෝ...... දෙව්මි ද කෝල් කරේ.. සිරාවටම බං මම තද නින්දේ හිටියේ... ඇයි දැන් කෝල් ගත්තේ කියන්නකෝ...

* මේකයි බං.. අපි හැමෝම exam හොදටම පාස් උනානේ.. ඒ හින්දා ඊයේ රෑ කට්ටියම කතා කරගත්තා අද රෑ ට පොඩි party එකක් දාන්න.. අනික මිහිලැල් අනිද්දා රට යනවලු බං....

~ මොකක්.. ඌ මොකද රට යන්නේ...

* අනේ මන්ද බං.. කිව්ව විදිහටනම් ඌ ආයේ එන්න නෙමෙයි යන්නේ....ඔය ඔක්කොමත් හින්දා තමා අපි අද රෑට පාටියක් දාමු කියලා paln

කරේ.. කොහෙද ඉතින් ඊයේ රෑ තිස්සෙම උබ ඔන්ලයින් නෑනේ... බලහන් ෆෝන් එක දැන්වත්...

~ හපොයි.. හා හරි හරි.. මං දැන් whatsapp online එන්නම්කෝ.. ඔයත් එන්න දැන්..

* හා හා... මං තියනවා ඈ..

අයියට ෆෝන් එක දීලා එයාව කාමරෙන් යවලා අතට ගත්තේ මගේ ෆෝන් එක.. දුෂි කිව්ව කතාව හරි.. මගේ ෆෝන් එක off වෙලා.. අර වෙලාවේ කෝල් එක කට් කරනවා වෙනුවට කෙලින්ම ෆෝන් එක off කරලා මම....�ඕම තමයි ඉතින්.. නින්ද වටිනවනේ ඔක්කොටම වඩා...

# එකලොස්වන පරිච්ඡේදය

කෝමහරි ෆෝන් එකත් on කරගෙන කෙලින්ම ගියේ whatsapp එකට... ගියත් නැතත් ට්‍රිප් කියන group එකේ massage 2K තියෙනවා.. බුදු අම්මෝ... මුං මං නැතුව මෙච්චර මැසේජ් කොරලද? අර ගෲප් එකේ නම දැම්මේ අපේ අනර්ඝ කොලුවා.. ඌ දැම්මොත් දාන්නේ ඔය වගේ කොහට්ටවත් නැති නමක්... හැබැයි කොහට්ටවත් නෑ කියන්නත් බෑ.. මොකද ඔය ගෲප් එකෙන් ට්‍රිප් එකක් plan කරොත් එහෙම ඒක යන්නේ හීනෙන් තමා.. කවදාවත් යන්න වෙන්නෙ නෑ.... හැබැයි අනිත් plan කරන හැමවැඩක්ම නම් තක්කෙටම හරියන ගෲප් එකක් ඒක...

? දැන් ඉතින් අර දාලා තියෙන msg 2K ම කියවන්නයැ මම.... ? කෙලින්ම ගියේ දූෂියාගේ chat එකට...

< Hi කෙල්ලේ.. මම ආවා.. දැන් කියන්නකෝ විස්තරේ... අර ගෲප් එකේ ඔක්කොම කියවන්න ගියොත් එහෙම මට තවත් ට්‍රක පනී.. උබ කෙටියෙන් කියහන් ඔක්කොම...

> අහ් hi... මෙහෙමයි හරිද? ඊයේ හවස 5.00 ට විතර මිහිලැල් මැසේජ් එකක් දාලා තිබ්බා ඌ අනිද්දට රට යනවා ඒ හින්දා අද රෑ ට පාටියක් ලෑස්ති කරනවා හැමෝම එන්න කියලා... අපේ ගෲප් එකේ සෙට් එකට විතරයි..

ඉතින් ඊට පස්සේ අපි කට්ටියත් කතා උනා රිසාල්ට් ආවට පස්සේ ගන්න හිටපු පාටියත් අදම ගමු කියලා...

ඔන්න ඕක තමා කෙටිම විස්තරේ...

< අහ් හරි හරි.. මට අද රෑ නම් වැඩක් නෑ.. මට එන්න පුළුවන්...

> එහෙනම් එල...

< ඒත් බං... ඇයි මිහිලැල් රට යන්නේ.. ඌ මීට කලින් අපිත් එක්ක එහෙම කතාවක් කියලවත් නෑනේ.. අනික මේ එකපාරටම.. ⍰

> අනේ මන්දා බං.. අපිත් ඇහුවා ඇයි ඒ එකපාරටම යන්න හිතුනේ කියලා.. ඌ කිව්වෙනම් ඌ ඉදලා තියෙන්නේ රිසාල්ට් එනකන් කියලා.. ⍰

< මම් ඒමද.. උබ උට කෝල් එකක්වත් දුන්නද ඊයේ?

> ඔව් රට යන සීන් එක කිව්වට පස්සේ කෝල් එකක් නම් දුන්නා.. ඌ මාර අවුලෙන් බං කතා කරේ.. මට නම් ඇයි කියලා හිතා ගන්න බෑ....

< මම්.. හාකෝ එහෙනම්.. අද රෑට සෙට් වෙමු..... ඒ මේ.. කොහෙටද බං සෙට් වෙන්නෙ.. ⍰

> සියල්ල තියෙන්නේ මිහිලැල් ලගේ අලුතින් දාපු හොටෙල් එකේ.. ඔක්කොම ඌ ගානේ..⍰

< මරුනේ... ඔච්චර සල්ලි තියෙන එකේ ඉතිම් ඔහොම වැඩක්වත් කරේ නැත්නම් වැඩකුත් නෑනේ ඉතින්... ⍰

> ඔව් ඔව්.

උට ඉතින් පීනන්න සල්ලිනෙ... නැත්නම් ඔහොම හිතුන ගමන් රට යන්න පුළුවන් කාටද....

< හ්ම්... හරි එහෙනම් කෙල්ලේ..මං ගියා.. Bye...⍰

දූෂි ගෙන් විස්තරේ අහගෙන දෙව්ෂි ටත් මැසේජ් එකක් දැම්මා මම අර වෙලාවේ බැනපු එකට sorry කියලා.. නැත්නම් ඕකි අනිවා හිතන්නේ මගේ ලොකුකමට කියලා..... ඒ තරමට tube light පොරක් දෙව්ෂියා..⍰⍰

මැසේජ් කරන්න ඕනි හැමෝටම මැසේජ් දාලා ගියේ කුස්සිය පැත්තට... අම්මයි අක්කයි උයනවා... අයියලා දෙන්නයි ආදිව් අයියයි කුස්සියේම ඉදගෙන ලොකු කයියක්.. ⍰

අම්මේ.... අද රෑ අපේ සෙට් එක පොඩි පාටියක් ලෑස්ති කරලා.. මමත් යනවා ඈ..

කොහෙද තියෙන්නේ... ක්ෂණිකව ප්රශ්නය ලොකු අයියා දෙසින්..⍰

මිහිලැල් ලගේ අලුත් හොටෙල් එකේලු..

ම්ම්ම්.. කමක් නෑ යන්න..

මොකක්.. අපේ අම්මා ජීවිතේ පලවෙනි වතාවට මං යන්න අහපු ගමනකට එක පාරින්ම යන්න කිව්වේ... බලන්න මිනිස්සු වෙනස් වෙන ඉක්මන.. ඒකට ඉස්සර.. මට යන ගමනත් එපා වෙනවා ඒ ප්‍රශ්න වලට උත්තර දීලා ඉවර වෙද්දී..?

ලොකු අයියේ අද ගෙදර යනවද ඔයාලා.?... Mmmmm

ලොකු අයියා : අද යන්න කියලනම් තමා ඉන්නේ.. ඒත් ඔයා පාටියට යනවනම් ඉතින් අපි අදත් ඉදලා හෙටම යන්නම්... ඔයාව අද එක්කන් යන්න කව්රුත් නෑනේ නැත්නම්..

චූටි අයියා : මං ඕනෙනම් අද නංගිව එක්කන් යන්නම්.. ආදිව් අයියත් ඉන්නවනේ... අයියලා යන්න ගෙදර..

දුශේනි අක්කා : ඒත් ඔය දෙන්නා දැන් හෙට උදේම practice යන්න ලෑස්ති වෙන්නත් ඕනෙනේ.. ඒ හින්දා ඔයාලා ගෙදරට වෙලා ඉන්න.. අපි හෙට යන්නම්..

ඒ වෙලාවේ මට මාරම දුකක් ආවේ... නිකන්ම මගේ ඇස් වල කඳුළු පිරුනා... ඒ වෙලාවේ පුලුවන්නම් මම අඬනවා.. ආදිව් අයියත් එතන හිටපු හින්දා පුදුම අමාරුවෙන් ඉවසගෙන දුවගෙන ආවේ මගේ කාමරේට.. මම ඇවිත් කෝට්ටෙ බදාගෙන ඇඬුවා.. ඇඬුවා නෙමෙයි මට ඇඬුනා...????????

ඒත් එක්කම මගේ කාමරේට ආවේ ලොකු අයියා..

* චූටි.. මොකද උනේ... ඇයි අඩන්නේ...

අනේ.. එයා ඒ කියන්නේ දැකලද මගේ ඇහේ අඳුළු තියෙනවා..?

~ මොකුත් නෑ අයියේ...

* මොකුත් නැති වෙන්න විදිහක් නෑනේ... ඇයි මේ එකපාරටම...

~ නෑ ඉතිම්................?මම ලොකූ අයියව බදාගෙන අඩන්න ගත්තා... ආදිච් අයියා ගෙදර හිටියේ නැත්නම් මං බෙරිහන් දිදී අඩනවා...

* ලොකූ අයියා : මං දන්නවා දැන් මොකටද ඔය අඩන්නේ කියලා...

~ ඇයි...

* හෙට චූටි අයියත් යනවා.. එයා එන්නේ ආයේ ඊලග සතියේ.. එතකොට අපිත් හෙට යනවා.. එතකොට ඔයා තනියෙන් හින්දා නේද..?ම්ම්ම්ම්.. ආයේ තව එකක්.. මිහිලැල් රට යන හින්දා.. ☺ □ ☺ □

~ හ්ම්.. ඔව්.... මගේ හිතට මාර දුකක් එන්නේ...ඔයා කෝමද දැනගත්තේ මට ඇඩුනේ ඒකට කියලා...

* මං ඉතින් මගේ චූටිගේ ලොකු අයියනේ.. හැමෝටම වඩා ඔයා ගැන දන්නේ මමනේ ඉතින්..දැන් බොරුවට අඩන්නේ නැතුව අද පාටියට යන්න ලෑස්ති වෙනවා.. අපි හෙට මොකක් හරි කරමු.. ඒම උනොත් අපි හැමෝම හෙට අයියලව දාන්න stadium යමු.. ඊට පස්සේ කොහේ හරි ගිහින් පොඩි රවුමක් ගහලා අපේ ගෙදර යමු.. එහෙත් ටික දවසක් ඉදලා එමු.....

~ ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්.. ඇත්තමද?? ?

* අප්පෝ මූනේ හිනාව.. ඔව් ඔව්.. ඇත්ත තමා.. දැන් මොකක්ද ඇදන් යන්න හිතාගෙන ඉන්නේ.. පෙන්නනවකො ඇදුම....

~ හ්ම්... මෙන්න මේක ඇදන් යන්න හිතන් ඉන්නේ... කළු පාට ඩෙනිම් එකයි කොල පාට tshurt එකකුයි....

* අහ්... ඒක ලස්සනයි... දැන් අඩන්නේ නැතුව ඉන්නවා ඇ..

~ හා හා..???

ඇත්තටම මට තනිකම කියන එකනම් දරාගන්න මාරම අමාරුයි.. දැන් දවස් කීපයක්ම පව්ලේ හැමෝමත් එක්ක එකටම ඉදලා ඒ හැමෝමත් එක්කම එකම දවසේ වෙන් වෙනවා කියන්නේ.... මටනම් එහෙම වෙලාවට දැනෙන දුකට මං සමහර දවස් වලට කෑමවත් කන්නේ නැතුව ඉදලා තියෙනවා.. ?

ඔන්න ඉතින් දැන් වෙලාව හවස 6.00 යි.. මම ලොකු අයියත් එක්ක ආවේ හොටෙල් එක ළඟට... මං යද්දී අපේ සෙට් එකේ හැමෝම වගේ ඇවිත් හිටියේ...

ඒ තමයි මට හම්බුන හොඳම යාලුවෝ ටික.. ඒ සෙට් එකෙන් මගේ බෙස්ටියෝ දෙන්නා තුං දෙනා ඇරෙන්න අනිත් ඔක්කොමල වෙන ස්කොල වල අය... හරියටම අපේ සෙට් එකේ ඉන්නේ 10 දෙනයි.... 05 ක් කොල්ලෝ.. 05 ක් කෙල්ලෝ.. �උං ටික මට හම්බුනේ Accounting clz එකේදී.....

ඉතින් පාටිය ජයටම යද්දී මම හෙමින්ම මිහිලැල් ගෙන් ඇහුවේ ඇයි එක පාරටම රට යන්නේ කියලා.. ඌ හරියට උත්තරයක් දෙන්නෙම නෑනේ අප්පා... හැබැයි පාටිය ඉවර වෙද්දී නම් එයා කිව්වේ කවදාවත් අපි 09 දෙනාව අමතකනම් කරන්නේ නෑ කියලා.. ඉක්මනටම අපිව බලන්න ආයෙත් එන්නම් කියලා.. ඒ වෙලාවේ අපි හැමෝටම ඇඬුනා..... කොල්ලෝ ටිකයි කෙල්ලෝ ටිකයි ඌව බදාගෙන ඇඬුවා හොඳටම..... ���එකටම හිටපු යාලුවෙක් වෙන්වෙනවා කියන්නේ ජිවිතේ අමිහිරිම අවස්ථාවක්.. මට ඒක තේරුනේ ඒ වෙලාවේ........�����

සතුටෙන් පටන් ගත්ත පාටිය අන්තිමේදී ඉවර උනේ මහා ලොකු දුකකින්....��

මමනම් මහන්සිත් හින්දා ගෙදර ආපු ගමන්ම එහෙම්මම නිදාගත්තා... මං එද්දී චූටි අයියයි ආදිච් අයියයිනම් නිදි.. එයාල හෙට උදේම practice යන්නත් ඕනෙනේ...

ඉතින් පහුවදා උදේ හරියටම වෙලාව 5.15 යි.. මගේ කකුල් දෙක අයිස් ගැහුනා වගේ... ඒක මට නුහුරු දෙයක් නෙමෙයි.. අපේ චූටි අයියගේ දින

චර්යාවේ විශේෂම වැඩක් තමයි එයා ගෙදර ඉදන් practice යන දවස් වලට උදේ පාන්දර wash දාලා ඇවිත් අයිස් වගේ සීතල අත් දෙක පිටින් මගේ කකුල් දෙකේ වතුර ගානවා... මුල් දවස් ටිකෙනම් මමත් අතඇරියේ නෑ.. හොද හොද ප්‍රතිප්‍රහාර ටිකක් මමත් එල්ල කරා.. ඒත් මුට ගානක් නෑ.. ඒ වතුර පිටින්ම මගේ මූනෙත් ගානවා වතුර... ඒ හින්දම මම දැන් ප්‍රතිප්‍රහාර එල්ල කිරීමෙන් වැලකී ඉන්නවා....එයා practice යනවා කියලා මමත් ඇහැරින්න ඕනේ කියලා එකක් නෑනේ... මොනවා කරන්නද හැමදාම එයා practice යන දවස් වලට මාවත් ඇහැරවනවා..??

ඉතින් අදනම් මමත් කැමැත්තෙන්ම ඒ වෙලාවේ ඇහැරුනා.. මොකද ඉතින් වෙනදට එයා තනියෙන් ගියාට අද අපි එයාව stadium එකට දාන්න යන්න ඕනෙනේ..??

ඉතින් උදේ පාන්දරම ඇහැරිලා හරියටම උදේ 6.00 ට මමයි ලොකු අයියයි චූටි අයියයි ආදිච් අයියයි පිටත් උනා colombo R . Premadasa satadium එකට යන්න... අම්මවයි දූශේනි අක්කවයි කපාහැරලා තමා අපි මේ ගමන යන්නේ..??

# දොළොස්වන පරිච්ඡේදය

වෙනදට චූටි අයියනේ ඉස්සරහ සීට් එකෙන් ඉදගන්නේ.. ? අද මම එතන.. ?ක්රිකට් ඩබල පිටිපස්සේ..... ?

ම්ම්ම්. ඉතින් හරියටම 8.15 වෙද්දී අපි ආවේ stadium එක ගාවට....

චූටි අයියා car එකෙන් බැහැලා ඇරලා තිබ්බ වීදුරුවෙන් අත දාලා මගේ මූණත් මිරිකලා යනවා පිස්සී කිව්වා.....

හයියෝ... මූන මිරිකන්න එපා අප්පා... ??ඇත්තටම මම ඒ වෙලාවේ එහෙම කිව්වේ තරහෙන් නෙමෙයි.. මට මාරම දුකයි.. ?? ආයේ ඉතින් චූටි අයියා ගෙදර එන්නේ සතියකින් නෙ.. සමහර දවස් වලට සති දෙකක් විතර practice කරලා එන දවසුත් තියෙනවා...?

චූටි අයියටයි ආදිව් අයියටයි යන්නම් කියලා මමයි ලොකු අයියයි කෙලින්ම ගියේ colombo city centre එකට... ඇත්තටම මම හිතුවේ නෑ අයියා මාව ඒකට එක්කන් යයි කියලා.. මොකද ඕකට ගියොත් මට මුළු shopping mall එකේම තියෙන දේවල් ගන්න හිතෙනවානෙ..??

මුලින්ම boba tea දෙකකුත් අරගෙන ඒක බිබී අපි දෙන්නා ගියා පොඩ්ඩක් shopping mall එකේ ඇවිදින්න...ලොකු අයියට dark green tshurt එකක් ගන්න ඕනේ කියලා shopping mall එකේම තිබ්බ shop එහෙකින් අපි tshurt එකක් ගන්න ගියා... අයියට tshurt තෝර තෝර ඉද්දි තමයි මම දැක්කේ දැන් trending යන ඇදුමක් ඒකෙ තියෙනවා......අනේ මට ඒක ඕනේ............. අම්මා හිටියනම් ගන්න තිබ්බා.. ලොකු අයියගෙන් ඉල්ලන

එකත් නිකන් මොකක්දෝ වගේනෙ......ඒ හින්දා මං සද්ද නැතුව හිටියා... අයියට ඕනේ ඇඳුමත් අරගෙන bill කරන්න යද්දී අයියා දැක්කා මං ආසාවෙන් හිටපු ගව්ම...

චූටි අර ගවුමේ අමුතු ලුක් එක්ක තියෙනවා නේද.. මොකද කියන්නේ ගමුද?

මොකක්.. මේ මනුස්සයට මගේ හිතවත් කියවන්න පුලුවන්ද? 

ආ.. ඔව් නේද අයියේ.. ලස්සනයි නම් තමා.. ඒත් දැන් ඕනේ නෑ.....

ආ.. ඒ කියන්නේ දැන් මං කියන එක ඔයා ගන්නේ නෑ....

අනේ ඉතින් ඔච්චරටම අරන් දෙන්න ඕනෙනම් අහ අහ ඉන්නේ අරන් දෙනවකො.. හහ්.....

මොකක්ද චූටි කිව්වේ...

ආ නෑ නෑ... ඒනම් අපි ගමුද ඒ ගවුම...

ඒක තමයි බං කිව්වේ මෙච්චර වෙලා.. යං බලන්න ඒක...

ම්ම්ම්.. ලස්සන colour එකකුත් select කරගෙන ඇඳුමත් අරන් fitting room එකට ගියේ හෙන බයෙන්.. මොකද එතන තිබ්බ එක ඇඳුමක්වත් large size එකෙන් තිබ්බෙ නෑ...  medium ගවුමක් අරන් ගියේ ඇඳලම බලන්නම්කෝ කියලා....

හිතුව තරම් අවුලක් උනේ නෑ... ගානට ඇඟට සෙට් වෙනවා..... ඉතින් ඒකත් අරගෙන අපි ආයෙත් car එක ලඟට එද්දී දවල් 1.00 ට විතර...

අම්මෝ ලොකු bro.. මටනම් දැන් බඩගිනි.... මොනවා හරි කමුකෝ......

මොකක් කිව්වා.... ලොකු bro... ඒ මන්දා ඔයත් නම්... කොහෙන් අමුතු අමුතු වචන අල්ලගන්නවද මන්දා...

Hee heeee⍰⍰

ඉතින් අපි ඊට පස්සේ monsoon එකට ගිහින් කෑම කාලා එහෙම ආයෙත් ගෙදර එන්න පිටත් උනා..... Monsoon කියන්නේ මම කැමතිම කඩයක්........ඒකෙ කෑම ගැන නම් කියලා වැඩක් නෑ....අම්මටයි අක්කටයිත් කන්න පොඩි කෑමක් අරගෙන ඒම තමා ආවේ..... අම්මටයි අක්කටයි කිව්වට ඕකෙනුත් භාගෙකට මම විදිනවා....⍰

එන මගදී තද වැස්සකට අහු උනා අපි දෙන්නා... ලස්සන සිංදුවකුත් අහගෙන ඒ සින්දුව කිය කිය තද වැස්සේ හෙමින් හෙමින් අපි ආයෙත් ගෙදරට ලඟා උනා... වේගෙන් යන්න බෑ ඒ වැස්සේ... පාර පේන්නෙවත් නැති තරමටම වැස්ස....□□□

අහසේ තරු කැන් ඉහිලා දුකකින් වගේ

අඳුරේ හැඬුවා රහසේ

තනිකම ඉහිලුම් නොදේ

ගිලුනා හද මා අඳුරේ

ඔබ පෙරදා ආදරේන් මා ලගින් උන් හැටී

එහි සැමරුම් රූපමයි ජීවිතේ

මතකද හැන්දෑවේ අපි දෙන්නා මන්දාරම්

අඳුරේ දවසක් දා මල් වැස්සේ තෙමුනා

මතකද හැන්දෑවේ අපි දෙන්නා මන්දාරම්

අඳුරේ දවසක් දා මල් වැස්සේ තෙමුනා.......... ❤︎❤︎❤︎❤︎❤︎

| | | | | | | | | |

. • • • • • • • • • • • • • • • • • • •

ගෙදර ඇවිල්ලා සීතල වතුරෙන් wash දාලා එහෙම ලෑස්ති උනේ අපි අර ගෙනාපු කෑම කාලා උනු උනු කෝපි එකක් බොන්න..... කෝපි කියන්නේ මටනම් ආගමක්...

අපි කකා ඉද්දි call එකක් ආවේ චූටි අයියගෙන්..... අම්මත් එක්ක කතා කරලා ඉවර වෙලා චූටි අයියට මට කතා කරන්න ඕනේ කිව්වලු..

ඉතින් මමත් කතා කරා..

* හෙලෝ...

~ආ මේ...මගේ කාමරෙන් එළියේ අර පැළ ටික තියලා තියෙන්නේ.. අනේ ඒ ටික ඇතුලෙන් තියනවකො ඕයි... ඔය වැස්සට ඒ පෝච්චි වල වතුර පිරිලා පැළ ටික සවුත්තු උනොත් එහෙම...

* ආ.. හාකෝ හාකෝ.. මම කන ගමන් ඉන්නේ.. කාලා ඉවර වෙලා ඇතුලෙන් තියන්නම්....

~ අනේ චූටි.... Plz දැන්මම ගිහින් ඇතුලෙන් තියන්න.... අනේ ඒවා සවුත්තු උනොත් මගේ ජීවිතෙන් කොටසක් විනාශ උනා වගේ තමා.. දන්නවනේ ඔයා...

* අනේ අයියේ... තමුසේ ගෙදර ඉද්දිත් මට වද දෙනවා.. දැන් ගෙදර නැති වෙද්දීත් වද දෙනවා.. මල වදේ.....

~ ඇයි ඕයි ඔහොම කතා කරන්නේ..... මං ඔයාට ආදරෙයිනෙ... මං ඔයාට අල ගෙනත් දෙන්නම්...??අනේ මේ ගිහින් ඒ ටික ඇතුලෙන් තියපන් මගෙන් අහගන්නේ නැතුව... ??

* ආ දැන් තර්ජනේ කරන්නත් එනවද?

ඒ වෙලාවේ මගේ එහා පැත්තේ හිටපු ලොකු අයියා මං දිහා අමුතු විදිහට බලපු හින්දා මං චූටි අයියා කිව්ව වැඩේට කැමති වෙලා ෆෝන් එක කට් කරා...?නැත්නම් චූටි අයියට ඉස්සෙල්ල ලොකු අයියගෙන් මට අහගන්න වෙන්නෙ.....

◦ ඇයි මොනවද කියන්නේ එයා....

* අර මොනවදෝ පැළ ටික ඇතුලෙන් තියන්නලු අප්පා.... ?

◦ ඒ..... දැන් ඕකටද ඔය බෑ බෑ කිව්වේ....

* ඔව් ඉතිං... කන්න එපැයි ඔක්කොටම ඉස්සෙල්ල... කාලා ඉවර වෙලා තියන්නම් කිව්වහම කන්න ඉස්සෙල්ල තියන්නලු.. හහ්.. ??????

ඕම කියාගෙන මං ගියේ උඩට.... අයියෝ මේ මෝඩයා හින්දා මට කන්නත් නෑනේ... ????

අයියගේ කාමරෙන් එළියේ තියලා තිබ්බ ඔක්කොම පතොක් පැළ ටික අරන් හෙමීට ඇතුලෙන් තිබ්බා.. එතන පතොක් පැළ 30 කට වඩා තියෙන්න ඇති... එව්වා තියලා මට හතිත් එක්ක.. හරිනම් මෙව්වා කරනවට මට සලකන්න ඕනි.. ඇයි අප්පා...

ඔයාලා බලනවා ඇති මොකක්ද ඒ පතොක් පැළ කතාව කියලා... අපේ චූටි අයියගේ මානසික ලෙඩක් තමා cactus plants හදන එක..... එයාගේ බබාලා ටික තමා ඒ.. ?එයාගේ කාමරේ හැමතැනම වගේ පතොක් පැළ පොඩි පොඩි පෝච්චි වල හදලා තියාගෙන ඉන්නවා... උට මොන මානසික ලෙඩේ තිබ්බත් මට අදාල නෑ.. ඒ උනාට ඒ මනුස්සයා ගෙදර නැති දවස් වලට ඒ පැළ ඔක්කොටම වතුර දාන්න ඕනේ මමනේ.... එතකොට හරිම විදිහට බැලුවොත් එහෙම මම තමා ඒ පැළ නඩත්තු කරන්නෙ.. මොකද ඉතින් අයියා ගෙදර එන්නේ සතියකට සැරයක් වගේනේ...???

ඉතින් පැළ ටික ඇතුලින් තියලා පල්ලෙහට ගිය ටිකට මෙන්න ආයෙත් call එකක් ගන්නවා.....

* ඒ පාර මොකද.. ?

~ පැළ ටික ඇතුලින් තිබ්බද..


* ඔව් ඔව් බං තිබ්බා... දැන් ඇයි ආයෙත් ගත්තේ...

~ නෑ.. ඒ ටික තිබ්බද අහන්න...

* මට යකා නැග්ග පාර අහ් හරි දැන් දැනගත්තනෙ කියලා කෝල් එක කට් කරා..?

දැන්..ඔව් දැන්වත් මම කන්න යනවා.... එච්චර රස කෑමක් කන්න පින නෑනේ සිරාවට............. මගේ ටිකත් එක්ක අනිත් අය කාලද දන්නේ නෑ.. ??

# දහතුන්වන පරිච්ඡේදය




මම යද්දී හැමෝම කාලා බීලත් ඉවරයි.. හැබැයි මගේ කොටසනම් ඉතුරු වෙලා තිබ්බා..⍰මම කාලා එහෙම ඇඳට ගියේ පොඩි නින්දක් දාන්න.. උදේ ඉඳන් ඇවිදලා ඇවිදලා මහන්සිත් එක්කනේ.. අනික හොඳටම වැස්ස හින්දා ඇඳට ගියා විතරයි මතක..රෑ 9.00 ට විතර අම්මා ඇවිත් මාව ඇහැරෙව්වේ රෑට

කන්න එන්න කියන්න.. මට නිදිමත වැඩි හින්දම මම රෑට කන්නෙත් නැතුව නිදාගත්තා.. පහුවදා උදේ අයියයි අක්කයි එයාලගේ ගෙදර යන්න ලෑස්ති වෙද්දී තමා මට ඇහැරුනේ.. එයාල අපේ ගෙදර ඇවිත් දවස් පහකටත් වැඩිද කොහෙදෝ දැන්... ලොකු අයියනම් කිව්වේ මටත් එහෙ එන්න ලෑස්ති වෙන්න කියලා.. අයියා එහෙම කිව්වේ ඊයේ අයියමනේ කිව්වේ කොළඹ stadium එකට ගිහින් චූටි අයියලව දාලා එයාලගේ ගෙදර යමු කියලා.. නමුත් අක්කයි අම්මයි ගෙදර හිටපු හින්දා අපි අයියලාගේ ගෙදර ගියේ නෑ.. ආයෙත් අපේ ගෙදරමයි ආවේ..

ඒත් ඉතිං මම එහෙ ගියොත් එයාලට එයාලගේ වැඩ කරගන්න බැරි වෙනවනේ.. අයියට ක්ලාස් වලට යන්න ඕනේ.. අක්කට office යන්න ඕනේ.. මම ගියොත් එහෙම ආයෙත් ඒ වැඩ මගහැරෙනවා... ඒ හින්දා මම එයාලට යන්න කිව්වා....?

එයාලා ගියාට පස්සේ මම අම්මත් එක්ක පොඩි වැටක් දාගෙන උදේට කෑවා.. ඇත්තටම මම උදේට කෑවේ.. අම්මා දවල්ට කෑවේ.. ? මොකද ඉතින් මම ඇහැරිද්දී 12.00 ත් පහුවෙලානේ...?

ඉතින් කාලා එහෙම ඉවර වෙලා මම ලස්සන කතන්දර පොතක් කියවන්න ගත්තා... ඒක කියව කියව ඉද්දී මෙන්න ෆෝන් එකට එක දිගට මැසේජ් එන්න ගත්තා..හයියෝ.... නිදහසේ පොතක් කියවන්න නැනේ අප්පා.. කව්ද මේ..

ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්.... ආදිව් අයියාගෙන් ඔක්කොම මැසේජ් ටික......

සිරාවට ඇයි මේ මෙච්චර ස්ටිකර්ස් ගොඩාක් එවල... මූට වැදිලවත් ද? ?

~ මොකද අයියේ මේ මෙච්චර ස්ටිකර්ස්...

* ආ.. ඔන්ලයින් ආවද චූටියා....

දැන් ආදිව් අයියත් මට චූටි කියලා කතා කරන්නේ....

~ ඔව් ඔන්ලයින් නම් ආවා.. ඒත් ඇයි මෙච්චර ස්ටිකර්ස් එව්වේ.. ගල් බෝතලයක්වත් වැදුනද? ⍰⍰

* අනේ අනේ මේ.. මං ඔව්වා පාවිච්චි කරන්නේ නෑ... ඔයාව ඔන්ලයින් ගෙන්න ගන්න ඕනේ හින්දා ස්ටිකර්ස් ගොඩාක් එව්වේ... ⍰

~ ආ.. ඔව් නේද.. ඔයාලා පාවිච්චි කරන්නේ branded බඩුනේ...⍰⍰⍰

ඇයි මොකෝ මාව මතක් උනේ.... ප්‍රැක්ටිස් ඉවරද??

* ඔයාව මතක් වෙන්නෙ නැතුව වෙන කාව මතක් වෙන්නද අනේ...⍰⍰

ඔව්.. අද ටිකක් කලින් ප්‍රැක්ටිස් ඉවර උනා.. වැස්ස හොදටම...

~ ආ.. අදත් වහිනවද? අපිටනම් තවම නෑ... ⍰

* ඉතින් මොකද කරන්නේ මැණික..

~ මොකක් කිව්වා.. මැණික.. ??

* මැණික තමා.. ඇයි.. ?

~ නෑ නෑ මොකුත් නෑ...අපේ චූටි අයියට ඒම ඇහෙන්න ඔය නම කියන්න එපා.. ඉන්න හම්බෙන්නේ නෑ මට.. ???.. ??

මම මේ පොතක් කියවන ගමන් හිටියේ..

* ම්ම්ම්.. එහෙමද? එහෙනම් පොත කියවන්න.. මං පස්සේ මැසේජ් එකක් දාන්නම්..

~ අනේ කමක් නෑ අනේ.... පොතනම් පස්සේ හරි කියවන්න බරියෑ...?

* ?මේ අර මම දුන්න ෆොටෝ එක මොකද.. එදා හරියට අහන්නත් බැරි උනානේ ඔයාගෙන්..

~ අනේ... ඒකනම් මාරම ලස්සනයි අයියේ... මට එදා දවසේ උනු ඔක්කොම සිදුවීම් ටික ඒ ෆොටෝ එක දකිද්දී මතක් වෙනවා... ඒ තරමට ඒ ෆොටෝ එක හිතට වැදුනා... ???

· ඔයා දන්නවද.. ඒ ෆොටෝ එක මං ගාවත් frame කරලා තියාගත්තා මම.... ❤️

~ අනේ ෂෝයි නෙ....... ???

ඉතින් ඔන්න ඔහොම පටන් ගත්තු මැසේජ් කිරිල්ල ඉවර උනේ පැය එකහමාරකට විතර පස්සේ.. ??

ෆෝන් එකේ battery  බැස්ස හින්දා ඒකත් චාජ් එකට ගහලා පල්ලෙහට ගියේ තේ බොන්න අම්මා කතා කරපු හින්දා...

◦ අම්මේ අයියලා ගියා කියලා කෝල් කරාද??

^ ආ ඔව්... දැන් පැයක් විතර ඇති කතා කරලා..

◦ ම්ම්ම්ම්.. හ්ම්.... ගෙදර මාර පාලුයි නේද අම්මේ...

^ අනේ එහෙම හිතන්න එපා පුතේ... ඔයා හිතන්න දැන් ඔයා කැම්පස් ගියාම මම ඉන්න විදිහ... එතකොට චූටි අයියත් ප්රැක්ටිස් යන දවසට මම ගෙදර තනියෙන්... ඔයාලා පොඩි කාලේ ඉදලා මේ ගෙදර හැම වෙලාවේම මාරම සද්දේ... සමහර වෙලාවට යුද්ධ පිටියක් වගේ... දැන් අවුරුද්දකට විතර කලින් ඉදලා එහෙම සද්දේ ඇහෙන්නේ කලාතුරකින්.. දැන් ඉතුරු වෙලා තියෙන්නේ ඔයාගේ කියවිල්ල විතරයි.. ඒත් ඔයත් ගියාම..... ?

◦ අනේ අම්මේ......... ඔහොම කියන්න එපා... අම්මා තනිවෙන්නෙ නෑ... කොහොමත් මම කැම්පස් ගියාම ලොකු අයියලා එයි මෙහෙ නවතින්න...

අනික හැමදාටම නෙමෙයිනේ... මම අවුරුදු 04කින් එනවනේ....??? ආයේ ඔය වගේ දුක හිතෙන කතා කියන්න එපා හරිද.. ම්ම්.. ?

^ අම්මෝ මෙයාගේ පණ්ඩිත කතා.. ? ආදිව් පුතා එහෙම මොකද කියන්නේ දැන්..

◦ එහෙම විශේෂ මොකුත් නෑ අම්මේ....චූටි අයියා කතා කරාද??

^ ඔව්.. උදේනම් කතා කරා...උදේ කිව්වෙනම් අහසත් එක්ක කළු කරලලු.. සමහරවිට අද කලින් ප්‍රැක්ටිස් ඉවර වෙයි කියලා..

◦ ඉවර වෙයි නෙමෙයි.. ඉවර වෙලා දැනටමත්.... ආදිව් අයියා මැසේජ් එකක් දාලා තිබ්බා.. ??

^ ආ.. එහෙමද??

◦ හ්ම් හ්ම්...

ඉතින් ඔහොම දවස් දෙක තුනක් ගියා.... මිහිලැල් ගිය දවසේ ඉදලා මැසේජ් එකක්වත් දැම්මේ නෑ.. පොරට කරදරයක් නැතුව ඇති නේද.. මටත් මේ වැඩ අස්සේ කතා කරන්න බැරි උනානේ...

කෝල් එකක් අරන් බලන්න ඕනේ... හපොයි උගේ පරණ no එකට අරන් බැනේ දැන්.. අලුත් එකක්නේ දැන් තියෙන්නේ...

මම්ම්.. මූ answar කරන්නේ නැනේ.. කුමක් සිදු වි ඇත්ද??? මා සමග මිහිලැල් ගඟුලැල් තරහ වී වත් ඇතිද??? 

ඇහ්.. සිරාවට මූ answar කරන්නේ නැත්තේ ඇයි...?

ඔහොම කල්පනා කර කර ඉද්දී මිහිලැල් මට ගත්තා..

× හෙලෝ...

- හෙලෝ මිහිලැල්.. කොහොමද අනේ... දවස් ගානකින් කෝල් එකක්වත් ගන්න බැරි උන හින්දා ගත්තේ.. ඔයාට අවුලක් නෑ නේද??

× මම්ම්.. අවුලක් නෑ.. ඉන්නවා ඔහේ...

- ඔහෙ ඉන්නවා කියන්නේ... ඇත්තටම ඇයි ඔයා රට ගියේ.. මට ඒක ලොකු ප්රශ්නයක් හලෝව්.....

× ඇයි ඔයා ඒක ප්රශ්නයක් කරගෙන ඉන්නේ..

- මොකක්.. ඇයි මිහිලැල් ඔයා එහෙම කතා කරන්නෙ... අනේ එකටම හිටපු යාලුවෙක් හේතුවක් නැතිව එකපාරටම රටත් අතඇරලා ගියාම ඒක ප්‍රශ්නයක් නෙමේද??

× මම්.. ඒකත් ඇත්ත නේද..මට හිතුනා මම ආවා.. එහෙම විශේෂ හේතුවක් නෑ...

- හ්ම් හාකෝ.. කවදා හරි හොයාගන්නම්කො.....

× හරි හරි මේ.. මට වැඩ තියෙනවා... මම තියනවා ඈ..

- අහ් හා හා.. Bye...

මේ කතා කරේ අපේ මිහිලැල්මද.. මූ වෙනස් වෙලානේ.. කතා කරන විදිහ උනත් වෙනස්.... අනික කවදද ඔහොම කෝල් එකක් ගත්තහම ඔච්චර ඉක් මනට කෝල් එක තිබ්බේ... අනේ මන්දා?? ????

ඉතිම් ඕම දවස් ගෙවීගෙන යද්දී එකපාරටම ආදිච් අයියා මට කෝල් එකක් දුන්නා...

= හෙලෝ් අයියේ...

* ආ චූටි.. කෝ අම්මා ඉන්නවද??

= ම්ම්.. ඔව් ඉන්නවා.. ඇයි මොකක්ද ප්රශ්නේ..

* නෑ නෑ.. එහෙම ලොකු අවුලක් නෑ.. අම්මට දෙන්නකෝ ඉක්මනට...

ඇයි මේ කවදාවත් නැතුව ආදිව් අයියා මෙච්චර කලබල වෙලා.. අනික අම්මට ෆෝන් එක දෙන්න කියන්නේ මොකද??

= ආ.. පොඩ්ඩක් ඉන්න...

අම්මේ................. අම්මේ......... මේ ආදිව් අයියා කෝල්..

ඇයි?

අනේ මන්දා ඔයාට දෙන්නලු...

- හෙලෝ පුතේ...

* ආ... අම්මේ දිනෙත් මල්ලිට අද දවල් ප්රැක්ටිස් කර කර ඉන්න ගමන් පොඩි කලන්තයක් වගේ ආවා... ඊට පස්සේ ඩොක්ටර්ස් ලා බලලා ඒ වෙලාවෙනම් අවුලක් නෑ කියලා ටිකක් rest කරන්න කියලා හොටෙල් එකට එව්වා එයාව...

- මොකක් අනේ..... අනේ දැන් මොකද එයාට..

* නෑ.. කලබල වෙන්න එපා... මමත් මේ දැන් ටිකකට ඉස්සෙල්ල ප්රැක්ටිස් ඉවර වෙලා හොටෙල් එකට ආවේ...මම ආපු ගමන් එයා ගාවට ගියේ මොකද කියලා බලන්න..මල්ලිට හොදටම උණ...දැන්නම් ඩොක්ටර්ස් ලා ඇවිත් ආයෙත් එයාව චෙක් කරන ගමන් ඉන්නේ...

- ආ...අනේ පුතේ....

හයියෝ.... මෙතන මොකක්ද වෙන්නෙ කියලා මටනම් තේරෙන්නේ නෑ.... ආදිව් අයියා මොකක්ද අම්මට කියන්නේ..එයාලට මොකක් හරි කරදරයක්වත්ද???අපරාදේ මට phone එක loudspeaker දාලා දෙන්න තිබ්බෙ අම්මට... ඇයි අනේ..... මොකුත් ඇහෙන්නේ නෑනේ...

* කොහොමත් අම්මේ එයාව ගෙදර එක්කන් යන්න වෙයි.. මම අයියටත් කෝල් ගත්තා.. එයාගේ ෆෝන් එක වැඩ නෑ..ඒ හින්දා මේ චූටි ගේ ෆෝන් එකට ගත්තේ......

- ආ එහෙමද? හරි පුතේ එහෙනම්.. මම ලොකු පුතාට දැන් කෝල් එකක් අරගෙන අදම එන්නම්..

* ආ හරි අම්මේ.. බුදුසරණයි..

- බුදුසරණයි පුතේ...

අම්මේ.. මොකද වෙලා තියෙන්නේ.. අනේ කියන්නකෝ........

චූටි අයියට දවල් ප්‍රැක්ටිස් කර කර ඉද්දී කලන්තයක් ඇවිල්ලා... දැන් බලද්දී හොදටම උණලු....

මොකක්.. ඉතින්.. SLCC එකේ ඩොක්ටර්ස් ලා ඉන්නවා නේද අම්මේ.. ඔව්.. ඒකෙ ඩොක්ටර්ස් ලා දැන් එයාව චෙක් කරන ගමන්ලු තියෙන්නේ.... අපි යන්න ඕනේ දැන් එහෙ.. ලොකු අයියට කෝල් එකක් ගන්නකො..

හ්ම්....

ලොකු අයියගේ ෆෝන් එක වැඩ නෑනේ.. ඒක off...

ආදිච් පුතත් අරගෙන.. ඒත් වැඩ නෑලු... අක්කගේ එකට ගන්නකො ඔයා..

ම්ම්.. ඒකටනම් rings යනවා...

හෙලෝ නංගි.....

ආ අක්කේ පොඩ්ඩක් ඉන්න.....

මං අම්මට ෆෝන් එක දුන්නේ අම්මටම විස්තරේ කියන්න කියලා... අයියත් ඒ වෙලාවේ ගෙදරලු... එයාල දැන් අපේ ගෙදර එන ගමන්.... අම්මා ලෑස්ති වෙන්න ගියා....

අම්මේ.. මමත් ලෑස්ති වෙන්නද??

ඔයානම් ඕනේ නෑ.. ඔයයි අක්කයි ගෙදර ඉන්න.. මමයි ලොකු අයියයි ගිහින් එන්නම්...

ම්ම්ම්. හා එහෙනම්....

අඩෝ පැයක්වත් ගියේ නෑ ලොකු අයියලා ආවා.... ආපු ගමන් මාවයි අක්කවයි තියලා අම්මයි අයියයි කොළඹ ගියා....

අක්කේ.. චූටි අයියට ප්‍රශ්නයක් නැතුව ඇති නේද??

නෑ නෑ... අයියට මොකුත් වෙන්නෙ නෑ...

ඇයි දන්නේ නෑ එයා අපිට දවල් කෝල් එකක්වත් දීලා කිව්වෙ නැත්තේ.... දවල් හොටෙල් එකට එව්වා කියන්නේ ඒ වෙලාවේ ඉදලා එයා නිකන් නෙ ඉදලා තියෙන්නේ... නිකමට කෝල් එකක් අරන් කියන්න බැරිද අම්මේ මට මෙහෙම දෙයක් උනා කියලා.... පණ්ඩිතකමනේ.. ඉන්න ඇති සද්ද නැතිව...

අනේ අනේ චූටි.. අපි දන්නේ නැනේ මොකද උනේ කියලා හරියටම.. දැන් අම්මලා ආපුහම බලමු..

හ්ම්....

# දාහතරවන පරිච්ඡේදය

පැය 4කට විතර පස්සේ ඒ කියන්නේ රෑ 8.00 විතර වෙද්දී අයියාවත් එක්කගෙන අම්මලා ආවා... එයා හොදටම වෙනස් වෙලානේ... දවස් ගානක ඉදලා අසනීපෙන් ඉදලා වගේ නිකන්...

චූටි අයියා ආපු ගමන් ගියේ එයාගේ කාමරේට...

* මොකද අම්මේ වෙලා තියෙන්නේ.... අවුලක් නෑ නේද??

◦ ආදිච් පුතා කිව්ව දේ නම් තමා වෙලා තියෙන්නේ... ඒත් එකපාරටම උණ ආවේ ඇයි කියලා තමා ප්රශ්නේ තියෙන්නේ..

* ම්ම්ම්ම්ම්ම්ම්....?

ඊට පස්සේ දවස් දෙකක් විතර යනකන් චූටි අයියට ප්රැක්ටිස් යන්න බැරි උනා... ඒ දවස් හතර ඇතුලත එයාට ගොඩාක් දුරට සනීප උනා... ඒත් එකපාරටම රෑ එයාට අමාරු උනා... අයියගේ උණ වැඩී වෙන්න ගත්තා..... එයාගේ ඇඟ සුදු මැලි වෙලා තිබ්බේ ඒ වෙලාවේ...හොද වෙලාවට එදා චූටි අයියව එක්කන් ඇවිල්ලා ලොකු අයියලා ගියාට පස්සේ අද දවල් එයාලා ආයේ ආවා...අම්මයි ලොකු අයියයි ඉක්මනට එයාව hospital එක්කන් ගියා.... මමයි අක්කයි ගෙදර හිටියේ.. මම නම් හිතුවේ අයියව එදාම බෙහෙත් දීලා ගෙදර එවයි කියලා... ඒත් චූටි අයියව හොස්පිටල් ඇඩ්මිට් කරලා....අම්මා අපිට කෝල් එකක් දීලා අයියව ඇඩ්මිට් කරා කිව්වට පස්සේ

මට මාරම බයක් දැනුනේ.... අයියව ඇඩ්මිට් කරලා කියන්නේ අනිවාරෙන්ම සේලයින් දෙනවා කියන එක.. චූටි අයියා හෙන පොර වගේ හිටියට කටු ගහන වැඩ වලට තමා බයම..?

එයාට හොදටම අමාරු හින්දා එයා ගාව භාරකාරයෙක්ට නවතින්න කියලා තිබ්බා.. ඒ හින්දා අම්මා එයා ගාව නැවතිලා ලොකු අයියා ආවා ගෙදර.. මොකද මමයි අක්කයි විතරනේ රෑ ගෙදර හිටියේ... අයියව ඇඩ්මිට් කරලා තිබ්බේ මහනුවර ආසිරි හොස්පිටල් එකේ..මොකද අපේ ගෙදර ඉදලා කුරුණෑගල හොස්පිටල් එකට යනවට වඩා නුවර හොස්පිටල් එකට යන එක ලඟයි..පහුවදා උදේම චූටි අයියගේ ඇදුනුයි අම්මගේ ඇදුනුයි කෑමයි අරගෙන අපි තුන්දෙනා ගියා හොස්පිටල් එකට..අපි යද්දී චූටි අයියගේ reports ඇවිත් තිබ්බා... ඒ මනුස්සයට හොදටම අසනීපයි.. ප්ලේට්ලට් හොදටම බැහැලා..අනේ කටු ගහලත් එක්ක.. සේලයිනුත් දෙනවා..???

හරියටම දවස් හතරක් චූටි අයියව හොස්පිටල් ඇඩ්මිට් කරලා තිබ්බා.. ඒ අතර මගදී අයියගේ යාලුවෝ එතකොට ක්‍රිකට් ටීම් එකේ අයියලා වගේ ගොඩාක් කට්ටිය චූටි අයියව බලන්න හොස්පිටල් එකට ආවා...දෙවෙනි දවසේ අම්මත් ගෙදර ආවා.. ඒ වෙද්දී අයියට කලින් තරම් අමාරුවක් තිබ්බේ නැති හින්දා..තුන්වෙනි දවසේ උදේ මමයි ලොකු අයියයි ආදිච් අයියයි හොස්පිටල් එකට ගියා.. අපි යනකොට ඩොක්ටර් කෙනෙක් අයියව චෙක් කරන ගමන් හිටියේ..




ඒ වෙලාවේ තමයි ඒ ඩොක්ටර් කිව්වේ ඊලග දවසේ අයියව discharge කරන්න පුළුවන් කියලා.. අම්මෝ ඒ වෙලාවේ දැනුන සතුට... මමනම් ඩොක් ටර් අයියව චෙක් කරද්දී මාරම බයෙන් හිටියෙ මොනවා කියයිද කියලා...

ඉතින් අද චූටි අයියව ගෙදර එක්කගෙන ආවා... තව සති තුනකින් දකුණු අප්රිකාවත් එක්ක t20 මැච් තුනකුයි ODI මැච් තුනකුයි තියෙනවා අප්රිකාවේදීම... ඒත් අයියගේ අසනීප තත්වය හින්දා අයියව squad එකට select කරන් තිබ්බෙ නෑ... හැබැයි ආදිව් අයියනම් squad එකේ ඉන්නවා...

හෙට ක්රිකට් ටීම් එක south africa යන්න පිටත් වෙනවා... ඒ හින්දා ආදිච් අයියටනම් ආයේ එන්න වෙන්නෙ නෑ චූටි අයියව බලන්න... අපේ චූටි අයියා මාර අවුලෙන් ඉන්නේ එයාට මැච් එකට යන්න බැරි වෙන එකට... මොකද එයා ගොඩාක් ආසාවෙන් හිටපු මැච් sereis එකක් තමයි southa africa match sereis එක...⍰⍰අයියා ගෙදර ඇවිල්ලත් සතියක් විතර යනකන්ම දියර ජාති විතරයි බිව්වේ... එයා හිටියෙත් නිකන් පියාමැස්සෙක් වගේ.. දැන් නම් හාල්මැස්සෙක් වෙලා..⍰⍰දැන් මගේ ඇගටත් වඩා පොඩි ඇඟක් ද මන්දා උට තියෙන්නේ..⍰⍰

* අම්මේ කොහෙද යන්න යන්නේ... ම්ම්ම්...

◦ ආ.. මමයි ලොකු අයියයි town එකට ගිහින් මොනවා හරි එළවලු ටිකක් එහෙම අරන් එන්නම්.. චූටි අයියා තවම සුප් එහෙමනේ බොන්නේ..

* හ්ම්.. හා... මටත් කන්න මොනවා හරි ගේන්න හොදේ..⍰

◦ හා හා මොනවා හරි අරන් එන්නම්කෝ..⍰

අම්මලා ගියාට පස්සේ මම ලැප් එක on කරගත්තේ ෆිල්ම් එකක් බලන්න...

~ චූටි එන්නකෝ පොඩ්ඩක්..... චූටියෝ.....

* ඇයි මොකද?

~මම ගියේ චූටි අයියගේ කාමරේට..

~ අනේ මාව එලියට එක්කන් යනවකෝ....කාමරේටම වෙලා ඉදලා ඇති වෙලා දැන්..

* අනේ මට බෑ අප්පා... මං ෆිල්ම් එකක් බලන ගමන් හිටියේ..

~ මොකක්ද ඕයි.. ලෙඩ වෙලා ඉන්න වෙලාවටවත් උදව්වක් කරන්න බැරිද??

* දැන් ලෙඩ නෑනේ.... දැන් හොදයිනේ ඔයාට...

~ හොදයි නම් ඔයාට කියන්නේ නෑනේ... මං තනියම යනවනේ..අඩෝ එක්කන් යන්නකෝ..

* ඇයි ඔයාගේ අක්කා ඉන්නේ.. එයාට කියන්නකෝ...

~ මොකක්.. කව්ද දුශේනි අක්කද??

* ඔව්.. ⍰

~ එයාට කියන්න පුලුවන්නම් මම එයාට කියනවනේ...... එයාට කියන්න පුලුවන්ද මාව එලියට එක්කන් යන්න කියලා... තමුසෙට කියන්නේ ඒ හින්දනේ..

* ආ.. තමුසේ..... දැන් ඔය කටත් තියෙන්නේ හොදට...අනික ඇයි එයාට කියන්න බැරි... මතකනේ ලොකු අයියගේ වෙඩින් එක දවසේ මට හෙන පාට් එකක් දැම්මා..

~ ඒ මොකක්ද ඒ...

* ඇයි මතක නැද්ද... වෙඩින් එක දවසේ මට ඇවිල්ලා කිව්වේ දැන් තමුසෙගෙ ලොකුකම් බලන්න ඕනේ නෑ මට.. දැන් මට අක්කෙක් ඉන්නවා.. මං එයාට කියලා ඔක්කොම කරගන්නම් කියලා... හහ්...

~ අයියෝ...... මොකක්ද අනේ විහිලුවටනේ කිව්වේ....

* ආ විහිලුවටද?? එදා කිව්වේ මාව ආයේ එපා කියලනේ.. ඒකනම් හිතට වැදුනා ඈ..

~ අනේ බං මට කතා කරගන්නත් අමාරුයි.. Plzzz එලියට එක්කන් යනවකෝ...

මම හිතලා හිතලා අන්තිමේදී පව්නේ ලෙඩෙක්නේ කියලා හිතලා චූටි අයියව එලියට එක්කන් ගියා..... ඇත්තටම එයාට හොස්පිටල් ඉදලා ආපු දවසේ ඉදලා ස්වභාවික හුලං පොදක් වදින්න නැතුව ඇති..මොකද ඉතින් එලියට

එන්නවත් බැරුවනේ හිටියේ.. දැන් තමා අපි අල්ලගෙන ටිකක් ටිකක් ඇවිදින්නේ...

අනේ මන්දා.. එයාට එකපාරටම එහෙම අසනීප උන එකනම් කාටවත්ම හිතාගන්න බෑ.. ඩොක්ටර්ස්ලනම් කිව්වේ එකදිගට මහන්සි වෙච්ච හින්දා උනු දෙයක් කියලා... අනේ මන්දා ඉතිම්ම්....

# පහළොස්වන පරිච්ඡේදය

චූටි අයියව එලියට එක්කන් ගිහින් මමත් එයා ලගින් ඉදගෙන අපි දෙන්නා පොඩි චැටක් දදා ඉද්දී එක පාරටම වාහනයක් ඇවිත් හෝන් කරා..ලොකු අයියගේ වාහනේ හෝන් එකනම් නෙමෙයි...

චූටි ගිහින් ගේට්ටුව අරින්නකෝ..

හෑ මට බෑ.. කව්ද දන්නෙත් නෑ ආවේ..

අනේ මේ මං දන්නවා ආපු එක්කෙනා ඔයා ගිහින් ගේට්ටුව අරින්නකෝ...

මොකක්.. ඒ මන්දන්නේ නෑ.. හොරුත් එක්ක දැන් ගෙදරට එනවා ඇ..

මං ගිහින් ගේට්ටුව ඇරියා...

ආ..... මේ මෙයානේ....

ඒක තමයි අර කාමරේ ඇතුලෙම හිටපු මනුස්සයා එලියට එන්න ඕනේ කිව්වේ...

ඒ ආවේ ගෙහාෂා අක්කලා.. ගෙහාෂා අක්කයි එයාගේ අක්කයි තමයි ආවේ..

හලෝ චූටි... කොහොමද??

ම්ම්.. අවුලක් නෑ..?ලෙඩාට ගේන දේවල් කාලා බීලා ආතල් එකේ ඉන්නවා..?

ඔයාට හොද චාන්ස් එක නේද ඉතින්.. ?

ගේට්ටුව ඇරපු සද්දෙට දුශේනි අක්කත් එලියට ආවා...

කට්ටියම ගෙදර ඇතුලට යද්දී මම චූටි අයියව අල්ලගෙන ඇතුලට එක්කන් යන්න හැදුවේ... හහ් දැන් එයාට මගේ උදව් ඕනේ නෑ.. ගෙහාෂා අක්කා ඉන්නවනේ දැන් එයාට... අම්මලා ඒ වෙලාවේ ගෙදර නැති හින්දා ඔය ගෙහාෂා අක්කා චූටි අයියව අල්ලගෙන එක්කන් ගියේ.. අම්මලා ඉන්න තැන ඔය මනමාලකම් නෑ..??හැබැයි මරුවට ගැලපෙන කපල් එක.. ඩබලම එකම උස.. ?

අපි ඇතුලට ගිහින් කතා කර කර ටිකක් වෙලා ඉද්දී අම්මලත් ආවා...ඉතින් කට්ටියම තේ එහෙම බීලා හවස 6.00 විතර වෙද්දී ගෙහාෂා අක්කලා ගියා.. මොකද ගෙහාෂා අක්කයි එයාගේ අක්කයි විතරනේ ආවේ.. ගොඩාක් රෑ වෙලා යන්න බැරි හින්දා කලින් ගියා...

ඉතින් තව දවස් දෙකක් තුනක් යද්දී චූටි අයියට හොදටම හොද උනා.. හැබැයි ඉතින් එයා south africa match series එකට ගියේ නැනේ.. ඒ හින්දා ඒ මැච් හයම අපි ගෙදර ඉදන් තමා බැලුවේ... ගොඩාක් කාලෙකට පස්සේ චූටි අයියත් එක්ක tv එකෙන් මැච් එකක් බලන්නේ.. එයා ටීම් එකට

ගිය දවසේ ඉඳලා එක දවසක්වත් අපි කට්ටිය එකට tv එකෙන් මැච් බැලුවේ නෑ... මොකද ඉතින් ground එකේ play කරන මනුස්සයා ඉර්දියෙන් ඇවිත් මැච් එක බලන්නයෑ..??

South africa match sereis දෙකම ශ්‍රී ලංකාව දින්නා... සුපිරම heart attack හැදෙන මැච් ටිකක් මේ දවස් ටිකේ බලන්න හම්බුනේ....




චූටි අයියේ... ඔයාලා මැච් ගහද්දි නිකන් පැරදීගෙන එද්දී ඔයාලට බයක් දැනෙන්නේ නැද්ද?? අපේ අය අවුට් වීගෙන යද්දී ඔය අග පෙළ කට්ටිය ෆෝම් වෙලා ගහන්නේ සමහර වෙලාවට.. හරි පුදුමයිනේ ඒක...

ආයේ එකක් අහනවා ඉතින්... මං හිතන්නේ ක්‍රිකටර්ස් ලා තමා වැඩිම ප්‍රෙෂර් එකක් තියෙද්දී තමන්ගේ ජොබ් එක කරන්නේ... හිතන්නකෝ මුළු රටම අපි දිනයි කියලා අපි දිහා බලන් ඉද්දී ටීම් එකේ අය ෆේල් වෙද්දී දැනෙන වේදනාව.. බලන මිනිස්සුන්ට මැච් එහෙක අන්තිම වෙලාවේ heart attack හැදෙන්න එනවනම් ඒක play කරන අපි කොච්චර ප්‍රෙෂර් එහෙකින්ද මැච් එක ගහන්නේ.. මොනවා උනත් ඔය Back row batsmen ලා ඇවිත් හයේ හතරේ එච්චා ගහනවා කියන්නේ ආයේ ඉතින් රට

වෙනුවෙන්ම තමා.. නැත්නම් ඉතින් ballers ලා කවද්ද සාමාන්යෙන් හයේ හතරේ එව්වා ගහන්න පුරුදු වෙන්නෙ.. එහෙමනම් ඌ allrounder කෙනෙක් වෙන්න ඕනෙනෙ...

ම්ම්ම්.. ඔව් නේද.. ?

අම්මෝ.... ඇහුවේ පොඩි ප්රශ්නයක්... හම්බුන උත්තරේ නිකන් පුස්කොළපතක් වගේ..?? මං ඒ අහපු එකට අපේ අයියට යකා නැග්ගා.. යකා නගින එකත් සාධාරණයිනේ ඉතින්.. මං මහ ගොං ප්රශ්නයක්නෙ ඇහුවේ..? අපේ අයියට තරහ ගියාම එයාගේ ඇහිබැම් දෙක එකට ගැවෙනවා..... ? ලංකාවෙ ගොඩාක් කෙල්ලෝ උට කැමතිත් ඒකයි... හන් එයාල දන්නේ නැනේ පොරගේ හැටි.. එව්වා දැනගන්න ආශ්රය කරලම බලන්න ඕනි..???

මැච් සීරිස් එක ඉවර වෙලා ලංකාවට ආපු ගමන් ආයිත් සැරයක් ආදිව් අයියා ආවා අපේ ගෙදර..... ඇවිත් දවස් දෙකක්ම ඉදලා ගියේ.. ? එයා යද්දී එයත් එක්ක චූටි අයියත් ගියා.. චූටි අයියා මාසෙකට විතර පස්සේ ඔය ප්රැක්ටිස් ගියේ.. මාසෙකටත් වැඩී ද මන්දා..?

අයියලා ආයෙත් ප්රැක්ටිස් යන්න කලින් ආදිව් අයියත් හිටපු එකේ අපි හැමෝම දළදා මාලිගාවට ගියා..විශේෂෙන්ම ගියේ චූටි අයියා හොස්පිටල් හිටපු දවස් වල අපේ අම්මා භාරයක් වෙලා තිබ්ලා... ඒක ඔප්පු කරන්න.... දළදා මාලිගාවට ගියහම දැනෙන නිදහස..???

ඉතින් ඔහොම මාස ගානක් හරි ලස්සනට සාමාන්ය විදිහට අපේ ජීවිත ගෙවුනා...

එක දවසක් මාව කැම්පස් සිලෙක්ට් කරගන්න letter එක ආවා...අම්මෝ අම්මගේ මූනේ තියෙන හිනාව... මොනවා උනත් අම්මගේ හීනෙ මමයි අයියලා දෙන්නයි ඉෂ්ට කරා.. චූටි අයියා කැම්පස් ගියේ නැති උනාට කැම්පස් යන්න තරම් හොද රිසාල්ට් එකක් ආවනේ එයාටත්.. මාව ජපුර කැම්පස් එකට තේරිලා... ඒක දැනගත්ත ගමන් මම ලොකු අයියටයි චූටි අයියටයි ඒ විස්තරේ කෝල් කරලා කිව්වා... මොකද ඉතින් මොන රණ්ඩුව උනත් කොච්චර ගහ මරාගත්තත් උං දෙන්නනේ මගේ පණවල් දෙක.. දැන් ඒ දෙන්නා ළඟටම ඉන්න තව එක්කෙනෙක් තමා ආදිව් අයියා.. එයාට කෝල් කරන්න ඕනි වෙන්නෙ නෑ... මං චූටි අයියට කෝල් කරද්දී ආදිව් අයියත් එයා ලඟමයි ඉදලා තියෙන්නේ.. ?

ඊට පස්සේ ඉතින් මං කෝල් එකක් ගත්තේ දූෂි ට.. ඒ තමා මගේ ඊළඟ සහෝදරිය..එයාට නම් තවම කිසිම දෙයක් හම්බෙලා නෑ... මමනම් බයත් උනා එයාව ජපුරට තේරෙන්නේ නැති වෙයිද කියලා.. ඊට පහුවදාම දූෂි කෝල් එකක් දුන්නා එයත් සිලෙක්ට් වෙලා කියලා... ?දූෂි ට පස්සේ ඉන්නේ නදූනියයි දෙව්මියයි.. නදූනි නම් කරේ bio.. එයා කොළඹ කැම්පස් සිලෙක්ට් වෙලා.. දෙව්මි පේරාදෙණි කැම්පස් එකට සිලෙක්ට් වෙලා තියෙන්නේ.. කමක් නෑ අපි කට්ටිය වෙන් උනාට කවදාවත් අපිට අපිව අමතක වෙන්නෙ නෑ... චූටි කාලේ ඉදලා එකට ඉදලා පිස්සු නටපු අපි දැන් වෙන් වෙනවා... අපි අපේ හීන වලට යන්න ඕනේ හින්දා වෙන් වෙනවා.. මගේ ක්ලාස් එකෙන් සෙට් උන යාලුවන්ගෙන් මිහිලැල් හැර අනිත් හැමෝම කැම්පස් සිලෙක්ට් වෙලා.. එතනින් ලවන් විතරයි අපේ කැම්පස් එකට සිලෙක්ට් වෙලා ඉන්නේ.. අනිත් කට්ටිය රට වටේ තියෙන එක එක කැම්පස් වල....කවදා හරි හීන වෙනුවෙන් වෙන්වුන මගේ යාලුවෝ සෙට් එක තමන්ගේ ජීවිතේ දිනලා ආයෙත් එක දවසක එක තැනකට සෙට් වෙලා ඉස්සර වගේම වැටක් දාන ගමන් ආතල් එකක් ගන්න තිබ්බනම් හොදටම ඇති...?? අපිව කැම්පස් සිලෙක්ට් උනාට අපිට තව මාස පහක්වත් ගෙවල් වලට වෙලා ඉන්න වෙනවා ඉතින් කැම්පස් යන්න.... සිලෙක්ට් උන ගමන් එහෙම කැම්පස් එකට ගන්නේ නෑනේ......?

# දාසයවන පරිච්ඡේදය

~ ආදිව් අයියේ... ඔයාට ඇහුනා නේද චූටි කිව්ව දේ... එයා ජපුර ට තේරිලා.... පුංචි කාලේ ඉදලා තාත්තා කියන චරිතේ හරියට ඇහැටවටත් දැකලා නැතුව ඇති බං එයා.. එයාව මේ තත්වෙට ගේන්න අම්මයි අයියයි කොච්චර මහන්සි උනාද..පව් බං මොනවා උනත්... මෙච්චර කල් මාත් එක්ක රණ්ඩු වෙවී ගහ මරාගෙන හිටපු ඒ පුංචි කෙල්ලත් එක්ක මට ආයේ රණ්ඩු වෙන්න හම්බෙන්නේ නැතිවෙයි නේද..

* අඩෝ ඇයි බං ඔහොම කතා කරන්නේ... එයා කැම්පස් ගියත් කොච්චර ලොකු උනත් ඒ උබලගේ චූටි...ඒක වෙනස් වෙන්නෙ නෑ....

~උබ දන්නවද බං..

නංගිලා කොච්චර අයියලගේ lv වලට සපෝට් කරත් අයියා කෙනෙක් කවදාවත් උගේ නංගිට හිතුමතේට lv කරන්න දෙන්නේ නෑ..උඹ හේතුව දන්නවද??

~මොකද නංගි ආදරේ ගැන දන්නවා උනාට කොල්ලෝ ගැන දන්නේ ඒකිගේ අයියා නිසා..

~ඒකිගේ චූටි අයියා විදිහට මං උබෙන් ඉල්ලන්නේ එක දෙයයි..මං ඒකි ළඟ නැති දවසක් අවොත් ඒකිව ඇස් දෙක වගේ රැකපන් ආදිව්..

~මොනවා උනත් අයියගෙයි මගෙයි පණ ඒකි..ඒකිට කවදාවත් ආදරෙයි කියලා නැති උනාට මගේ කෙල්ලටත් වඩා මං ඒකිට

ආදරෙයි......කොල්ලෙක් වැඩියෙන්ම ආදරේ අම්මට තමා...අම්මා කියන්නේ බං කොල්ලෙක්ගේ ජීවතේ.. හැබැයි බං මගේ නංගි කියන්නේ මගේ පණ... ඒකිව මෙච්චර කාලයක් වෙනකන් පරිස්සම් කරලා උබ මගෙන් නංගි ගැන ඇහුවහම මං උබට අවසර දුන්නෙ උබ ගැන තියෙන විශ්වාසෙට....

~උබ මගේ යාළුවා විදිහට මං ඉල්ලපු උදව්ව කරපන්...

* අනේ බං.... දිසල්යා කියන්නේ උබේ විතරක් නෙමෙයි මගෙත් පණ.... ඔයයි අයියයි තරම්ම මමත් චූටි ට ආදරෙයි...මං මේ ලෝකේ ඉන්නකන් එයාට කිසිම කරදරයක් වෙන්න දෙන්නේ නෑ...හරිද..?❤

~ ම්ම්ම්ම්...

* ඒත් බං උබට ඇයි එකපාරටම ඔහොම දෙයක් කියන්න හිතුනේ..

~ නෑ බං.... පහුගිය දවස් වල කිසිම හේතුවක් නැතුව මාව එක පාරටම අසනීප උනා.. අපිට බං මේ ලෝකේ ගැන හරියට කියන්න බෑ.. මේ දැන් හුස්ම ගන්න මිනිස්සු මේ දැන් හුස්ම නතර කරනවා.... තාත්තා උනත් බලන්නකෝ... එදා හවස අයියා ක්ලාස් ගිහින් හිටියේ.. චූටියි මමයි නිදි.. අම්මා උයනවා... තදටම වැස්ස ඒ වෙලාවේ.. අම්මගේ ෆෝන් එකට කෝල් එකක් ඇවිත් තියෙන්නේ තාත්තගේ නම්බර් එකෙන්... ඒත් කතා කරලා තියෙන්නේ වෙන කව්දෝ මනුස්සයෙක්... ඒ මනුස්සයා තමා අම්මට විස්තරේ කියලා තියෙන්නේ...හිතපන් මටයි, අයියටයි, අම්මටයි අපි තුන්දෙනාටම එකපාරටම මොනවා හරි උනොත් නංගිට මොකක්ද වෙන්නෙ...අම්මා හරි අයියා හරි මං හරි තනි උනොත් අපිට මොකක් හරි කරගන්න පුළුවන්.. ඒත් චූටි.... එයා මොනවා කරන්නද??මෙච්චර කල්

එයාට කිසිම අඩුවක් දැනෙන්න නැතුව තියලා එක පාරටම අර ඔක්කොම මගහැරවපු අඩුපාඩු ටික දැනුනොත් එහෙම...

* අනේ උබ හිතනවා වැඩී බං.. ඔයාලටවත් නංගිටවත් මොකුත්ම වෙන්නෙ නෑ.... දැන් යමු ground එකට.. විනාඩි 30 ක් අපි මෙතන..

~ හ්ම්.. යමු...

_ අම්මේ.... අයියලා අද එයිද ගෙදර...

◦ ම්ම්.. අදනම් එන්නේ නැතිවෙයි... අද ඉතින් එන්න එහෙම විශේෂ හේතුවක් නෑනේ...

_ අහ් නැද්ද.. හාකෝ..

◦ ඒ පාර මොකද අනේ..

_ නෑ ඉතින්.. මං කැම්පස් තේරුන එක විශේෂ දෙයක් නෙමෙයි වෙන්න ඇතිනේ නේද..

◦ ආ.. දැන් රිසාල්ට් ආවට පස්සේ හොද හොද සෙල්ලම් ටිකක් නැටුවේ... මදිද ඒ ටික.. 

_ අනේ අම්මේ මේ....යාලුවෝ සෙට් එක එකතු වෙලා ට්‍රිප් එකකුත් යන්නනේ හිටියේ රිසාල්ට් ආවහම...🥺🥺 ඒකවත් කරගන්න බැරි උනා..

◦ආ ඇත්තට ඒ දවස් වල ට්‍රිප් එකක් ගැන කිය කිය හිටියා නේද?? ඇයි ඒකට මොකද උනේ...

_ මිහිලැල් නැතිව මොන ට්‍රිප් ද අම්මේ.. ඌ රිසාල්ට් ඇවිත් පහුවදාම රට ගියානේ...

◦ඒකනේ නේද.. ඒ ළමයා ඇයි දන්නේ නෑ එකපාරටම රට ගියේ...

_අනේ මන්දා.. එයා ගිය හේතුව දන්නේ එයා විතරයි.. අපි කව්රුත් දන්නේ නෑ..🥺

අම්මගෙයි මගෙයි කතාවට ෆෝන් එක තිත තිබ්බා... කෝල් එකක්....

ම්ම්ම්ම්ම්.. අම්මේ ලොකු අයියා කෝල්...

හෙලෝ අයියේ...

ආ මේ.. හවස් වෙලා එන්නම්කෝ ඔය පැත්තේ ඈ... අම්මට උයන්න එපා කියන්න..

⍰⍰මං නම් හිතුව අද ඔයා එයි කියලා.. මොනවද කන්න ගේන්නේ.. ⍰

මොනවද ඕනේ කියන්නකෝ...

ම්ම්ම්ම්... කෙලින්ම ගේන්න mix rice යි චිකන් කොත්තුවකුයි... පුලුවන්නම් sprite එකක් ගේන්න හොදේ.. ඒ හොදටම ඇති..⍰⍰

අනේ ළමයෝ අයියට වද දෙන්නේ නැතුව ඉන්න.. කෝ දෙන්න ෆෝන් එක මට..

හෙලෝ පුතේ... කඩෙන් කෑම ගේන්න ඕනේ නෑ.. මං කෑම හදන්නම්..

නෑ නෑ අම්මේ... හැමදාම කඩෙන් කන්නෙත් නෑනේ.. අම්මා උයන්න මහන්සි වෙන්නෙ නැතුව ඉන්නකෝ..

අයියලත් එකයි නංගිලත් එකයි.. ඔක්කොමල එක ඉත්තෙ පොල් නෙ ඉතින්...

⍰⍰අම්මෝ අම්මේ... ඔයාට මතකද ඔය වචන ටිකම ඔය විදිහටම ඔයා එක දවසක් චූටි අයියා අතින් කියලා තිබ්බා..

ඒ මොකක්ද අනේ ඒ.. මටනම් මතක නෑ..

අයියෝ අනේ... අර ආදිච් අයියා මං ගැන අම්මගෙන් මුලින්ම අහලා තිබ්බ දවසේ රෑ අම්මයි චූටි අයියයි කතා කර කර ඉද්දී අම්මා ඔය වචන ටිකම කියලා තිබ්බා.. එක ඉත්තෙ පොල් කතාව.. ?

ඔයාට කව්ද ඒක කිව්වේ...

චූටි අයියම තමා ඉතින්...

ආ මං එදා බොරුද කිව්වේ.... ඔයාලා තුන්දෙනාම අවු. 20 වෙන්න කලින් කව්රු හරි එක්ක යාලු උනා... ලොකු අයියත් එහෙමයි චූටි අයියත් එහෙමයි ඔයත් එහෙමයි...

අනේ අම්මේ මේ.. මමනම් යාලු වෙන්න නෙමේ හිටියේ... නිකන්ම ඒක උනා.. හහ්.. ??

ඇත්තටම අම්මේ ලොකු අයියත් යාලු වෙලාද හිටියේ...

නැත්නම්.. ඌ යාලු වෙලා කියලා මං දන්නෙත් නෑ.. යාලු වෙලා තරහ වෙලා ඔක්කොම ඉවර උනාට පස්සේ තමා මං ඒක ගැන දැනගත්තේ....

සිරාවට.... මට තමා පාට් දාන්නේ නේද එයා..?

එහෙම තමා.. මොන පිස්සු වඩේ කරත් එයා දැන් හොදට ඉගෙනගෙන හොද ගුණයහපත් ගැනු ළමයෙකුත් හොයාගෙන හොද ජොබ් එකකුත් කරනවා.... මොනවා උනත් ඔයාලා තුන්දෙනාම ගොඩ ගිය එකටනම් මට සතුටුයි...

ම්ම්ම්ම්ම්ම්ම්ම්.......මොන පිස්සුව නැටුවත් අපි අම්මව ගොඩ දානවා අම්මේ... ඒක ගැන බිය නොවන්න..??

හවස් වෙද්දී අයියයි අක්කයි ආවා.. හවස කිව්වට දැන් වෙලාව 7.30 යි.. අයියට ක්ලාස් එකක් ඉවර වෙලා තියෙන්නේ 6.00 ට.. ඉවර උන ගමන් ගෙදර ගිහින් අක්කවත් දාගෙන එහෙම්මම ඇවිල්ලා තියෙන්නේ... එයා ආපු ගමන් ගියේ wash එකක් දාන්න.... එයත් wash දාලා ආවට පස්සේ අපි කන්න ගත්තා... කන ගමන් මං ලොකු අයියගෙන් ඇහුවා එයා කලින් යාලු වෙලා හිටපු අක්කා ගැන..??අම්මෝ දූශේනි අක්කා අයියා දිහා බලපු විදිහ.....පස්සේ මම කටවගත්තා... මොකද ඉතින් බොරුවට පව්ල් කඩන්න ඕනේ නෑනේ... ඒත් මං පස්සේ තමා දැනගත්තේ ලොකු අයියා දූශේනි අක්කට එයාගේ කලින් අක්කා ගැන කියලා තියෙනවා කියලා..????

කාලා එහෙම ටිකක් වෙලා අපි කතා කර කර ඉද්දී චූටි අයියා අම්මට කෝල් එකක් ගත්තා.... එයා සාමන්යෙන් උදේටයි රෑ ටයි හැමදාම අම්මට කෝල් එකක් ගන්නවා... ආයේ කෝල් ගන්නේ මැච් එකකට යන්න බස් එකෙන් බහින්න යද්දී...

අම්මට කෝල් එකක් අරගෙන බුදුසරණයි කියලා අම්මගේ කටින් අහගෙනම තමා එයා මැච් එක play කරන්න යන්නේ..එයාට මැච් එක play කරන්න ඉස්සෙල්ල අම්මගේ කටහඩ ඇහුනේ නැත්නම් මැච් එක ගැහෙන්නේ නෑලු.. මල කෝලම් ඒ උනාට.. ? හැබැයි අපි මොන වැඩේ කරන්න ගියත් අම්මගෙන් ආශීර්වාද අරන් කරාම තමා ඒක සාර්ථක වෙන්නෙ.. ?❤

චූටි අයියට අපි ලොකු අයියලා ආවා කියලා කිව්වේ නෑ.. ඕක කිව්වහම පොර අවුල් යනවා... මොකද ඉතින් එයා විතරනේ අඩු... ??

මට නම් ඉතින් කෑම වල එහෙම ෆොටෝ ගහලා යවන්න හිතෙනවා.. ඒ උනාට පොඩි එකා පව් හින්දා යැව්වේ නෑ..??

# දාහත්වන පරිච්ඡේදය

අපේ දූෂි ට නම් මරු චාන්ස් එකක් හම්බුනේ.. මොකද ලවනුත් දැන් ජපුර නෙ.. උං දෙන්නගේ ප්රේමවන්ත බැඳීම නිකන් ආත්ම ගානක ඉඳන් එන එකක් වගේ.. ඒ දෙන්නගේ ගෙවලුත් එක ළඟ.. එකම මොන්ටිසෝරියට දෙන්නම ගිහින් තියෙන්නේ.. ස්කොල නම් දෙකකම්. ඒ උනාට අපේ boys collage එකේ ලවන් හිටියේ..එතකොට ක්ලාස් ගියෙත් එකට..AL කරෙත් එකම subjects දැන් එකම කැම්පස් එකේ.. උං දෙන්නා පොඩි කාලේ ඉඳලා එකට හිටියට යාලු උනේ AL කාලේ.. හැබැයි lv කරා කියලා ඉගෙනීම අත්හැරියේ නෑ.. ඩබලම එකට ගොඩ ගියා.. සාමන්යෙන් කලාතුරකින් නෙ එහෙම දේවල් වෙන්නෙ.. ?❤□

ඉතින් ඔහොම තවත් මාස 03 ක් විතර ගෙවිලා ගියා.. හෙට Asia cup matches පටන් ගන්නවා.. ම්ම්ම්... මේ සැරේනම් අපේ කොල්ලෝ ටික අනිවා කප් එක ගනී.. චූටි අයියයි ආදිච් අයියයි දෙන්නම squad එකේ ඉන්නවා මේ සැරේ.. මේ මාසේ අන්තිමට හො ඊලඟ මාසේ මුල තමා asia cup final මැච් එක තියෙන්නේ...ඒ වෙනකන්ම ඉතින් අයියා ගෙදර එන්නේ නෑ.. අපිට මැච් තියෙන stadium වලට යන්න වෙනවා එයාව හම්බෙන්න.. අපි හැමෝම හිතාගෙන ඉන්නේ මේ සැරේ ශ්රී ලංකාව play කරන හැම මැච් එකක්ම බලන්න යන්න...??

ගිය සැරේ asia cup win කරේ පකිස්ථානය.. ඒ හින්දා හරි නම් මේ සැරේ මැච් වලට sponsor country වෙන්න ඕන පකිස්ථානය.. ඒ උනාට ඉන්දියාව පකිස්ථානයට යැම ප්රතික්ෂේප කරපු හින්දා ගිය අවුරුද්දේ runners-up උන ශ්රී ලංකාවට මේ සැරේ matches වලට sponsor කරන්න

හම්බුනා..හෙට SL vs Bangladesh match එක ගැන හීන මව මව ඉද්දී ෆෝන් එකට කෝල් එකක් ආවා..

unkown number..

හෙලෝ...

..........................................

හෙලෝව්... කව්ද කතා කරන්නේ..

කෝල් එක කට් උනා.. මං හිතන්නේ කාටහරි වැරදිලා ආපු කෝල් එකක්.. ටිකක් වෙලා ඉද්දී whatspp එකට massages හෙන ගොඩාක් එන notification වැටුනා.. Whatsapp එකට ගිහින් බලද්දී අර ඉස්සෙල්ල ආපු unkown no එකෙන්මයි.. ෆොටෝස් 08 ක් එවල තියෙන්නේ... ඒ වෙලාවේම කරන්ට් ගිය හින්දා router එක off වෙලා internet connection නැති උනා.. ඒ හින්දා මට ඒ ෆොටෝස් මොනවද කියලා බලන්න බෑ... කොහොමහරි කරන්ට් ආවට පස්සේ මම මුලින්ම කරේ අර unkown no එකෙන් ආපු ෆොටෝ ටික බලපු එක...

මොකක්..... දෙ.. වි.. ය.. නෙ... මේ... මේ... ආදිව් අයියගේ ෆොටෝස් වගයක් නේද???

ඒ.......... ඒ...... නිකන්ම ෆොටෝස් නෙමෙයිනේ... ආදිව් අයියා වෙන කෙල්ලෙක් එක්ක ඉන්න ෆොටෝස් වගයක්.. අ..... නෙ.... මොකක්ද මේ වෙන්නෙ... ???.. ඒ ෆොටෝ බලන්නෙවත් කොහොමද.. මට නිකන්ම

ඇඬුනා... මම ඉක්මනට ගිහින් මගේ කාමරේ දොර වහලා ආවා... මම කෝට්ටේ බදාගෙන ෆෝන් එක දිහා බලාගෙන හොදටම ඇඬුවා..




අම්මා ඇවිත් මට කතා කරත් මං ටිකකින් එන්නම් කියලා එලියට ගියේ නෑ.. මට ඒ ෆොටෝස් දැක්ක වෙලාවේ ඉදලා නිකන් පිස්සු වගේ...මම කවදාවත් ආදිව් අයියගේ එහෙම ෆොටෝ බලාපොරොත්තු උනේ නෑ... හවස් වෙද්දී ලොකු අයියලා අපේ ගෙදර ආපු සද්දේ ඇහුනා මට.. එයාල ආවේ හෙට මැච්

එක බලන්න පල්ලෙකැලේ යන්න ඕනි හින්දා... මටනම් බෑ හෙට මැච් එක බලන්න යන්න...???

මම එලියටවත් ගියේ නැති හින්දද කොහෙදෝ ලොකු අයියයි අක්කයි දෙන්නම මගේ කාමරේට ආවා... මම අඬ අඬ ඉන්නවා දැකලා ඒ දෙන්නට හිතාගන්නවත් බැරුව ඉන්නේ.. මොකද සාමන්යෙන් හේතුවක් නැතුව මං අඬන්නේ නෑ... ඒ දෙන්න ඇවිත් මං ගාවින් ඉදගෙන මගෙන් මාර ප්රශ්න ගොඩක් ඇහුවේ..ඇයි අඬන්නේ.. මොකද උනේ.. මට යකා නැග්ග පාර මං ඒ දෙන්නටම කිව්වා මට වද දෙන්නේ නැතුව දෙන්නම කාමරෙන් යන්න කියලා...මං හිතන්නේ මම ලොකු අයියට එච්චර සැරෙන් කතා කරපු පලවෙනි පාර ඔය.. ?දුශේනි අක්කා කාමරෙන් එලියට ගියත් ලොකු අයියනම් ගියේ නෑ...

චූටි.. අනේ මොකක්ද උනේ කියනවකො.. අම්මා මොනවා හරි කිව්වද..?

නෑ.. අම්මා මොකුත් කිව්වේ නෑ...

එහෙනම් ඇයි මේ... දැන් හෙට මැච් එක බලන්න යන්න ඔයා කොච්චර ආසාවෙන්ද හිටියේ... ඒත්... මෙහෙම අඬන්නේ මොකද.. අනික තරහත් ගිහින් ඉන්නේ..

මොකුත් උනේ නෑ ලොකු අයියේ.. Plz මට නිදහසේ ඉන්න දීලා දැන් යන්න...

ඔයා අඬන හේතුව කියනකන් මං අඩියක්වත් හෙල්ලෙන්නේ නෑ.. එච්චරයි..

අනේ මොකක්ද අප්පා වද දෙන්නේ...

වද දෙන්නේද.. වද දෙන්නේ මං ඔයාගේ අයියා හින්දා.. වෙන මනුස්සයෙක් එහෙමනම් ඔයා අඩන්නේ ඇයි.. මොකක්ද හේතුව කියලා බලන්න එන්නේ නෑනේ.. වෙන අයට ඔයා ඇඬුවත් එකයි නැතත් එකයි.. ඒත් මට එහෙම නෑ.. කියනවා මොකක්ද උනේ කියලා මගෙන් ගුටි කන්නේ නැතුව..

මට අයියගෙන් බේරෙන්න බැරි බව තේරුන හින්දා මං අර ෆොටෝස් ටික අයියට පෙන්නුවා...

මොනවා... මේ ආදිච් නේද?? ඒත් මෙහෙම දෙයක්........???

අයියේ.. දැන් ආදිච් අයියට මොකුත් කියන්න යන්නත් එපා.. අම්මට කියන්නත් එපා චූටි අයියට කියන්නත් එපා.. මොකද ඕක ඇහුව ගමන් චූටි අයියයි ආදිච් අයියයි දෙන්නම කලබල වෙනවා.. ඊට පස්සේ හෙට මැච් එක අවුල් කරගන්නවා.. අම්මට කිව්වොත් අම්මත් අවුල් යනවා.. එතකොට අම්මා අවුල් වෙලා ඉද්දී චූටි අයියා අනිවා අවුල් යනවා.. Plzz එයාලට කියන්නේ නැතුව ඉමුද..

හ්ම්.. අපි එහෙම කරමු.. ඒත් මේකේ ඇත්ත හොයාගන්න ඕනේ...

මොන ඇත්තද අයියේ.. ඔය තියෙන්නේ හරි ලස්සනට ඇත්ත.. ?

චූටි ඔයා කියන්නේ මේ ඇත්තටම ආදිච් කියලද??

⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰

මට ඕක පිළිගන්න බෑ.. ඔය ආදිච් අයියා නෙමෙයි නේද අයියේ... ඔය edit ෆොටෝ ටිකක් නේද... අනේ කියන්නකෝ....
⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰

මටත් හිතෙන්නෙම එඩිට් කියලා.. ඒත් නංගි මේවා එඩිට් කියන්න අමරුයිනේ... ඇත්තම වගේනේ... නමුත් ආදිච් මල්ලි මෙහෙම දෙයක් කරයි කියලනම් කියන්න අමාරුයි....

ම්ම්ම්ම්... අනේ අයියේ....... ⍰⍰⍰

හරි හරි.. දැන් අම්මලා මේව්වා දැනගන්නේ නැතුව ඉන්නනම් ඔයා අඩන්නේ නැතුව ඉන්න ඕනි.. ගිහින් මූන හෝදගෙන එන්නකෝ.. අපි පල්ලෙහට යමු...

හ්ම්.. ⍰

මං ගිහින් මූන හෝදගෙන ආවට පස්සේ අපි පල්ලෙහට ගියා...

අම්මා : ආ... නැගිට්ටද?? මොකද ළමයෝ මෙච්චර වෙලා නිදාගෙනද හිටියේ...

ලොකු අයියා : ඔව්නේ අම්මේ... අපි කාමරේට යද්දිත් හොදටම නිදි.. මං ඉතින් ඇහැරෙව්වා..�

හොද වෙලාවට දුශේනි අක්කා අම්මට මොකුත් කියලා නෑ..����

රෑට කාලා එහෙම නිදාගන්න ඇඳට යද්දී ලොකු අයියත් ආවා කාමරේට... අපි දෙන්නා කතා කර කර ඉද්දී දුශේනි අක්කත් ආවා.. අයියා අක්කට කියලා විස්තරේ.. කොහොමත් අක්කට ඒක නොකියා බෑනේ...�

අයියේ.. හෙට ඔයාලා කට්ටිය මැච් එක බලන්න යන්නකෝ.. අනේ මං එන්නේ නැතුව ඉන්නද??

චූටි.. ඔයා ගියේ නැත්නම් කොහොමත් ඕක ප්රශ්නයක් වෙනවා... අපිට කොච්චර ලොකු ප්රශ්න ආවත් අපි ඒවාට කලබල වෙලා උත්තර හොයලා හරියන්නේ නෑ... ඒක හින්දා අපි හෙට යමු..

ම්ම්ම්.. හ්ම් හාකෝ..��

# දහඅටවන පරිච්ඡේදය

මට එදා රෑ නින්ද ගියේම නෑ...මම තනියම ඇඬුවා.....ගෑනු ළමයෙක් තමන් ආදරේ කරන එක්කෙනා වෙන ගෑනු ළමයෙක් එක්ක වැරදි විදිහට හැසිරෙන ෆොටෝ දැක්කහම දැනෙන වේදනාව..??

පහුවදා දවල් 12.00 ට අපි ගෙදරින් පිටත් වෙන්න හිටියේ... කොහොමහරි ඉතින් මමත් කරන්න දෙයක් නැති හින්දා හෙමින් හෙමින් ලෑස්ති උනා.. මම stadium එකට යනකන්ම වාහනේ අයිනට වෙලා කල්පනා කර කර ගියේ..




අම්මටනම් මගේ වෙනස හොදටම තේරිලා.. අම්මා මගෙන් මොකද කියලා අහද්දී ලොකු අයියා මොකක්දෝ එකක් කියලා අම්මව ශේප් කරා.. මොනවා උනත් අම්මට හංගන එකනම් බොරු.. අපි stadium එකට ගියාට පස්සේ චූටි අයියවයි ආදිව් අයියවයි දෙන්නවම හම්බුනා.. මම ආදිව් අයියා එක්ක තියා චූටි අයියා එක්කවත් හරියට කතා කරේ නෑ.. මම එයාලත් එක්ක කතා කරොත් අනිවාරෙන්ම මට ඇඩෙනවා... අන්තිමේදී අපි ඉදගන්න යද්දී මං දෙන්නටම හොදට play කරන්න කියලා විතරක් කිව්වා.. මම එදා ground එකට ගියාට මැච් එක බැලුවේ.. අයියලා play කරන දිහා බලන් හිටියට කිසිම උවමනාවකින් නෙමෙයි මම බලන් හිටියේ..මැච් එකේ උන කිසිම

දෙයක් මට මතක නෑ... අන්තිමේදී ලංකාව දින්නා කියලනම් මට තේරුනා... මැච් එක ඉවර උනාට පස්සෙත් චූටි අයියව හම්බුනාට පස්සේ මම වචනයක්වත් කතා කරේ නෑ.... හැබැයි ඒ වෙලාවේ තමා මං දැනගත්තේ player of the match වෙලා තියෙන්නේ චූටි අයියා...�චූටි අයියටනම් මගේ ලොකු වෙනසක් තේරිලා.. එයා මගෙන් ඒ ඇයි ඇහුවට මං මොකුත් කිව්වේ නෑ... ඒකටත් ලොකු අයියා මොකක්දෝ කියලා ශේප් කරා.. අඩුම ලොකු අයියා කිව්ව දේ වත් මට මතක නෑ.. �� මම ආදිච් අයියගේ මූන දිහා බලාගෙන හිටියා.. එයා මාරම සතුටින් ඉන්නේ.. ඇත්තටම එයා එහෙම නරක කෙනෙක්ද?? ඒ මුනෙන් එහෙම මොකුත්ම පේන්නේ නෑ..��

අපි එයාලටත් යන්නම් කියලා ආයෙත් ගෙදර එන්න පිටත් උනා... මං අදනම් හිතාගත්තා අයෙනම් මැච් බලන්න එන්නේ නෑ කියලා.. ලංකාව final තේරුනොත් විතරක් එදාට ඇවිත් යන්න එනවා කියලා හිතාගත්තා.. එහෙම හිතුවෙත් චූටි අයියා හින්දා...

ඊලග දවසේ තිබ්බ මැච් එකට අපි ගියේ නෑ.. ලොකු අයියගේ ක්ලාස් එකක් කියලා අපි ශේප් උනා.. ක්ලාස් එකක් කට් කරලා එන්න බෑ කියලා චූටි අයියා හොදටම දන්න හින්දා එයාට අවුලක් උනෙත් නෑ.. Second මැච් එකේදිත් ලංකාව දිනලා.. ඒත් මමනම් tv එකෙන්වත් මැච් එක බැලුවේ නෑ..... දෙවෙනි මැච් එකෙන් පස්සෙ ආයේ SL team එකට මැච් එකක් තියෙන්න තිබ්බෙ තව සතියකින්.. ඉතින් චූටි අයියලටත් ටිකක් free හින්දා ගොඩාක් දවසකින් msg කරපු නැති ආදිච් අයියා මට massage එකක් දාලා තිබ්බා.. මම ඒ මැසේජ් seen කරෙවත් නෑ.. මං හිතන්නේ මට අවශ්‍ය නෑ ඒවා seen කරන්න.. ඒ අතර ලොකු අයියත් ඒ ෆොටෝ වල ඇත්ත විස්තරේ හොයන ගමන් හිටියේ.. මං හැමදාම රෑට අඩනවා.. අන්තිමේදී චූටි අයියා මට මැසේජ් එකක් දාලා අහලා තිබ්බා ඇයි මම ආදිච් අයියා එවන massage වලට reply කරන්නේ නැත්තේ කියලා.. මං එයාට යැව්වා මං හිතන්නේ මට ආයේ එයා එක්ක කිසිම සම්බන්දයක් නැතිවෙයි කියලා... චූටි අයියා ඒ වෙලාවේම මට කෝල් එකක් ගත්තා.. අරගෙන මගෙන් ප්‍රශ්න කරන්න ගත්තා.. මට

කියන්න දේවල් තිබ්බෙත් නැති හින්දා මං ඇත්ත විස්තරේ කිව්වා... මට එව්වා කියලා ඉවර උනාට පස්සේ තමා මං කරපු දේවල් වල බරපතලකම තේරුනේ.. දැන් එයාලත් කලබල වෙලා මැච් ගහන්නත් එක්ක බැරිවෙයිද දන්නේ නෑ එයාලට..?දැන් චූටි අයියා අනිවාරෙන්ම ඕක ආදිච් අයියට කියනවා...තව දවස් දෙකකින් third match එක...හැබැයි ආදිච් අයියා මට මොකුත්ම මැසේජ් එකක් එව්වේ නෑ ඊට පස්සේ.. මට ඒ වෙලාවෙනම් හිතුනෙම ඒ ෆොටෝස් ඇත්ත එව්වා කියලා... ඒ උනාට මගේ යටිහිතෙන් දෝංකාර දුන්නෙම නෑ ඒ එඩිට් ෆොටෝ වගයක් කියලා... ලොකු අයියත් හැමදාම රෑට කතා කරලා මගේ හිත හදනවා.. අන්තිමේදී කොහොමහරි ලොකු අයියා ඒ විස්තරේ දූෂි ට කියලා..දූෂි ඊලග දවසෙම අපේ ගෙදර ආවා...දූෂි එකපාරටම ගෙදරට කඩාපාත් උන එක අම්මට සැක හිතිලා.. අනික මමත් මේ දවස් ටිකේ අවුලෙන් නෙ හිටියේ.. අන්තිමේදී අම්මත් ඔක්කොම විස්තරේ දැනගත්තා...

* දූෂි ඔයා හිතන්නෙත් ඒ ෆොටෝ ඇත්ත එව්වා කියලද??

~ අනේ මන්දා බං... උබ අඩන එක නවත්තගන්නකෝ... මං ඒ ෆොටෝ තවම දැක්කෙත් නෑ...

දූෂි මගේ හොදම හොදම යාළුවා උනත් මං කැමති උනේ නෑ ආදිච් අයියගේ ඒ ෆොටෝ දූෂි ට පෙන්නන්න... කව්ද කැමති තමන් පණ වගේ ආදරේ කරපු මනුස්සයෙක්ගේ වැරදි විදිහේ ෆොටෝ වෙන කෙනෙකුට පෙන්නන්න...

~ මෙහෙමයි බං.. අපිට මිනිස්සු විශ්වාස කරන්න බෑ.... ලොකු අයියා දැනටමත් වැඩේට බැහැලා ඉන්නේ...අපි බලමුකෝ මොකද වෙන්නෙ කියලා.... දැන් ආයේ අඩන්න එපා හරිද..උබ අඩනවා දකිද්දී මට ඉවසගෙන ඉන්න බෑ... අයියා ඔය පණිවිඩේ කියද්දීම මගේ ඇග හිරිවැටිලා ගියා..... ?

* ඒත් ඒවා එඩිට් එව්වනම් ඇයි එහෙම හදන්නේ මිනිස්සු..

~ ඒක තමා බං ප්‍රශ්නේ.. සාමාන්‍යෙන් ඔහොම edit කරලා FB එහෙම publish කරන එකනේ කරන්නේ.. නැත්නම් ඒ ෆොටෝ වල අදාල පුද්ගලයාට යවලා සල්ලි ගන්න එක... ඒත් මෙතන උනේ අසාමාන්‍ය දෙයක්.. ඇයි ඔය ෆොටෝස් ඔයාට එව්වේ...

* හ්ම්.. ඒක තමා බං... ඒ එවපු no එකත් අයියා check කරලා බලලා තිබ්බා.. ඒක දැන් වැඩ නෑ..?

~ හරි හරි.. අපි ඉවසගෙන ඉමුකො...

...??

දැන් ඉතින් හැමෝම මගේ හිත හැදෙන්න එක එක කතා කියනවා... ඒත් කාටවත්ම ඒ ඇත්ත ෆොටෝස් ද එඩිට් එව්වද කියලා හොයාගන්න බැරි උනා...

චූටි අයියා කියන විදිහටනම් එව්වා එඩිට්... ආදිච් අයියා කියන්නෙම ඒ එඩිට් එව්වා ඒ එයා නෙමෙයි කියලලු... එහෙනම් ඒක ආදිච් අයියට පුළුවන්නේ මට කෝල් එකක් දීලා කියන්න.. ඇයි එයා ඒක මට කියන්නේ නැත්තේ.. ?ඒ කියන්නේ ඒ ෆොටෝ වල මොකක් හරි ඇත්තක් තියෙනවද??

කොහොමහරි ලංකාවට ගහන්න තිබ්බ ඊලග මැච් ටිකත් ලංකාව play කරා... ආදිච් අයියා හොදට play කරාද නැද්ද කියලා මං කාගෙන්වත් ඇහුවෙත් නෑ මට ඒ ගැන හොයලා බලන්න උවමනාවක් තිබ්බෙත් නෑ...

ඔය හැම ප්රශ්නයක් එක්කම හරියටම මාසයක් ගෙවුනා... මට නිකන් ඒ ගෙවුන මාසය අවුරුද්දක් ගියා වගේ... මම හැමදාම බලන් හිටියේ අර ෆොටෝ එඩිට් එච්චා කියලා ඔප්පු වෙන දවස වෙනකන්..

ඒත් අන්තිමේදී Sri lanka vs India asia cup final day එකත් උදා උනා.....ලංකාව final තේරුනා කියන්නේ අපිට අනිවාරෙන්ම යන්න වෙනවා......??

හැබැයි මම අද මැච් එක බලන්න යන්නෙත් වැඩි කැමැත්තකින් නෙමෙයි.. ඒත් චූටි අයියා වෙනුවෙන් මං කොහොමහරි යනවා... මම හරියටම මාසෙකට පස්සේ චූටි අයියවයි ආදිච් අයියවයි දකින්නේ.. අඩුම මම tv එකෙන්වත් ඒ දෙන්නව දැක්කේ නෑ... ඇත්තටම මම හිතුවේ ඒ වෙලාවේ අපේ අම්මා ආදිච් අයියට මොනවා හරි කියයි කියලා.. ඒත් අම්මා එයාට වචනයක්වත් කිව්වේ... ආදිච් අයියා මාව දකිද්දීම එයාගේ මූන කළු උනා..

මැච් එක පටන් ගන්න තව පැය තුනයි තියෙන්නේ.. මුළු stadium එකම මිනිස්සුන්ගෙන් පිරිලා.. එයාලට wish කරද්දී මම චූටි අයියට හොදට play කරන්න කියලා wish කරලා හැරුනේ ආදිච් අයියා පැත්තට...

❤ අයියේ.. උනු ප්රශ්න ගැන මොකුත්ම හිතන්නේ නැතුව මැච් එක play කරන්න.. ඔයාට මතකනේ ඔයා මට මුලින්ම කැමති කිව්ව දවස.. අන්න එ දවස වගේම යකෙක් වගේ මැච් එක play කරන්න ඕන හරිද...Good luck.. Love youuuu❤❤❤?? අනිවාරෙන්ම ලංකාවට cup එක ගේමු.. ☺

මම ඒ වෙලාවේ ආදිව් අයියට හිනා වෙලා කතා කරේ මම කැමති නෑ ලංකාව මැච් එක පරදිනවට.. ඒ වගේම මම ආදරේ කරන මිනිස්සු හින්දා මැච් එකක් පරදිනවා බලන්න මම කොහොමටවත්ම කැමති නෑ...

එයා මට thank you චූටි කියලා විතරයි කිව්වේ...


ඊට පස්සේ අයියලා දෙන්නම අපේ අම්මටයි ලොකු අයියටයි අක්කටයි වැන්දට පස්සේ අපිත් ගියා ඉදගන්න.. චූටි අයියා ලොකු අයියට මීට කලින් වැන්දේ එයාගේ first international match එක දවසේ... මොකද චූටි අයියා ක්රිකට් play කරන්න ප්රධානම හේතුව ලොකු අයියා.. ලොකු අයියා නැත්නම් එයා ක්රිකට් ගහන්නේ නෑ... ලොකු අයියා තමා චූටි අයියටයි මටයි දෙන්නටම ක්රිකට් පිස්සුව හැදෙව්වේ... වැඩේ කියන්නේ චූටි අයියට ඒ පිස්සුව උපරිමේට ගියා...??

# දහනවවන පරිච්ඡේදය

අපි ගිහින් ඉදගෙන ටිකක් වෙලා යද්දී මැච් එක පටන් ගත්තා...

අපේ ටීම් එකයි ඉන්දියා ටීම් එකයි ground එක මැද ඉද්දී මුළු stadium එකම මිනිස්සුන්ගෙන් පිරිලා ඉතිරිලා තියෙද්දී අපේ ජාතික ගීය යනකොට දැනෙන හැඟීම...? මං හිතන්නේ එ වෙලාවේ මගේ දුක දෙගුන තෙගුන උනා..එ මදිවට ශ්‍රී ලංකාව අද දිනයිද?? ඉන්දියාව කියන්නෙත් ලේසි පහසු ටීම් එකක් නෙවෙයිනේ.... මුලින් බැට් කරේ අපි..අපේ ටීම් එකේ අය හරියටම 20 over එක ඉවර වෙද්දී ලකුණු 195 ක් ගැහුවා... ඒක අනිත් ටීම් එකට ලොකු ටාගට් එකක්.. ඒ උනාට ඉන්දියාවේ batting ගැන දන්න අය දන්නවා.... අම්මෝ...

විනාඩි 15 ක interval එකෙන් පස්සේ අපේ අය බෝල් කරන්න ගත්තා... මං අර වෙලාවේ කිව්වා වගේම ආදිව් අයියට යකෙක් වැහුනා වගේ.. දාන දාන over එකෙන් විකට් එක ගානේ ගන්නවා... ඉන්දියාවේ හොදම batsmen ව පලවෙනි බෝලෙන් අවුට් කරා එයා.. එයා හරියටම විකට් 05 ක් ගත්තා... ?අපේ




චූටි අයියා 02යි.. තව ballers ලා තුන්දෙනෙක් ඉතුරු විකට් තුන ගත්තා... අන්තිමේදී ලංකාවේ හැමකෙනාගේම මූනවල් වල සතුට පුරවලා භාරත පුත්තුන්ව පරද්දන්න පුළුවන් උනා අපේ සිංහ කොල්ලෝ ටිකට.. මුළු stadium එකේම හිටපු මිනිස්සු කෑ ගහනවා... ඒත් එක්කම මල් වෙඩි... ඒ අස්සේ මං කැමතිම සිංදුවකුත් හයියෙන් යනවා..

ජය බන්දා ලොවේ..

ධජ ලෙලවා අපේ...

අපි එනවා මගේ අම්මේ...

නෑ පැරදුම් ලබා... ලක් මවගේ පුතා..

දිවි දෙනවා පුදා අම්මේ...

අම්මේ....... ලක් අම්මේ.....

සිරි ලක් අම්මේ...........

??????????????

මැච් එක දිනලා කප් එක දීලා මුළු ටීම් එකම ground එක වටේ cup එකත් අරන් ඇවිද්දා.... අපේ චූටි අයියයි ආදිව් අයියයි එකටමයි හිටියේ.. ආදිව් අයියගේ අතේ තමා cup එක තිබ්බේ.. මොකද එයා තමා වැඩියෙන්ම විකට් ගත්තේ.. හැබැයි එයාගේ අතේ වැඩී වෙලා cup එක තිබ්බේ නෑ.. ටීම් එකේ cup පිස්සා ඇවිත් ඒක ගත්තා.. අම්මෝ හැමෝටම ඒ වෙලාවේ හිනා....?

ඉතින් ඔක්කොම කරලා ඉවර උනාට පස්සේ අපිටත් ground එකට යන්න දුන්නා.. Team එකේ හැමෝගෙම පවුල්වල අයට ground එකට යන්න දුන්නා..ආදිව් අයියගෙත් ගෙවල් වල අය ඇවිත් හිටියා.. ඒත් එයාල අර උනු කිසිම ප්රශ්නයක් දන්නේ නෑ... ?

මං ground එකට ගිය ගමන්ම චූටි අයියට pit එකක් දැම්මා.. ආදිව් අයියටත් ඉතින් දැම්මා.. මොනා උනත් තාම මගේනේ.. ???

චූටි... ඔයා දන්නවද අද මට මැච් එක play කරන්න ඔච්චර ශක්තියක් ආවේ කොහොමද කියලා.. ඔයා මට අන්තිම වෙලාවේ කිව්ව වචන හින්දා... ඔයා මට හොදට play කරන්න කියලා කිව්ව වචන ටිකෙන්ම මගේ ඇගටයි හිතටයි මාරම හයියක් ආවේ.. Thank youuuu නංගි..

මං ඒත් වැඩිය මොකුත් කිව්වේ නෑ ආදිච් අයියට... වෙනද වගේ වැඩිය ගනන් ගත්තෙත් නෑ.. එහෙමයි කියලා මං ඒ උන ප්‍රශ්න ගැන අහන්න ගියෙත් නෑ එයාගෙන්..

එයාම තමා පටන් ගත්තේ..

නංගි... ඔයා ඒ ෆොටෝ විශ්වාස කරනවද?? Plz පිළිගන්න ඒ මම නෙමෙයි.. මම... මම ජීවිතේට ඔය වගේ ජරා වැඩ කරන්නේ නෑ.. අනේ ඒ ෆොටෝ edit කියලා මට පෙන්නන්න වෙන්නෙ ඒ එඩිට් කරපු මිනිස්සුන්ගේ කටින් ගත්තොත් විතරයි.. ඒත් ලොකු අයියා ඒ හැම එකක්ම කරන්න බැලුවා.. ඒත් ඒ ෆොටෝ එව්වේ කොහෙන්ද කියලවත් හොයාගන්න බැරි උනා කාටවත්...

ඔයා දන්නවද අයියේ.. මම ජීවිතේ මගේ පවුලේ අයට පස්සේ ආදරේ කරපු සහ වැඩියෙන්ම විශ්වාස කරපු එකම මනුස්සයා ඔයා.. ඔයත් මාව රැවට්ටුවහම මං තව මොනවද කරන්නේ.. මම මේ වෙනකන් ඔයාට වචනයක්වත් කිව්වේ නැත්තේ මගේ හිතේ තියෙන ඒ ආදරේ නැතිවෙන්නේ නැති හින්දා..�ඒත් එව්වා ඇත්තනම් මට කරන්න දෙයක් නෑ.. මට මේ හැමදෙයක්ම අත්හරින්න වෙනවා..

අනේ ඇයි චූටි පිළිගන්නේ නැත්තේ...හැබැයි එව්වා ඇත්ත කියලා කොහෙන් හරි ඔප්පු උනොත් මං ඔයත් එක්ක ආයේ කතා කරන්නේ නැතුව ඉන්නම්.. හැබැයි plz ඒක ඔප්පු වෙනකන් හරි මට ඔයත් එක්ක ඉන්න දෙන්න..

ම්ම්ම්... ඇයි ඔයා මාත් එක්ක කලින් ඔව්වා ගැන කතා කරේ නැත්තේ..

නංගි මම අර දවස් වල මැච් ගැහුවෙත් කිසිම සිහියකින් නෙමෙයි… ඔයාට කියන්න මට මගේ මුළු ජීවිතේම එපා උනා.. ඒත් මම දරාගෙන හිටියේ ඔයා හින්දා.. ඔයාගේ චූටි අයියට මම එක දවසක් ලොකු පොරොන්දුවක් උනා.. ඒක ඉෂ්ට කරන්නනම් මං මේ ලෝකේ ඉන්නම ඕනේ…මට අඩුම ඔයාට කෝල් එකක් දෙන්නවත් හයියක් තිබුනේ නෑ.. ඒ උනාට ඕනෙනම් අයියගෙන් අහලා බලන්න මං හැමදාම ඔයා ගැන හොයලා බැලුවා.. මං හැමදාම බලාගෙන හිටියා ඔයා මැච් එකක් බලන්න එනකන්.. ඒත් ඔයා ආවේ නෑ..?

මො.ක… ක්…… අනේ අයියේ… මං කොච්චර මොනවා කිව්වත් මගේ හිත කියන්නෙම ඒ එඩිට් ෆොටෝස් කියලා.. ඒත් මට තාම හිතාගන්න බෑ…??

ඒත් එක්කම හයියෙන් වහින්න ගත්තා.. අපි හැමෝම stadium එක ඇතුලට ගියා..හොද වෙලාවට වැහි දෙයියෝ මැච් එක ඉවර උනාට පස්සේ ආවේ.. ??

මැච් එක ඉවර උනාට චූටි අයියට අපිත් එක්ක ගෙදර එන්න වෙන්නෙ හෙට හෝ අනිද්දා.. ඉතින් අන්තිමේදී පාන්දර 2.00 ට විතර අපි ගෙදර එන්න පිටත් උනා…

ඇත්තටම මොන දුක තිබ්බත් මැච් එක දිනපු සතුට හින්දා මට ටිකක් විතර පිට්.. අනික මම ආදිච් අයියත් එක්ක මාසෙකට විතර පස්සේ කතත් කරානේ අද.. පාරේ හොදටම බ්ලොක් එක.. ඒ අස්සේ වැස්සත් එක්ක…

මට මහන්සිය වැඩි හින්දම car එකේ අයිනට ගිහින් හොද නින්දක් දාන්න ගියේ… ඒත් උපරිම විනාඩි 15 ක් නිදාගන්න ඇති මම.. දවස් ගානකින් නිදාගත්තු නැති එකට නිදාගන්න ගියාම ඒකටත් මේකි බාධා කරනවනේ..

දුමිගෙන් කෝල් එකක්..

හෙලෝ...

ආ රිෂි මේ අහන්නකො වැඩක්.... (යාලුවෝ ගොඩාක් අය මට කතා කරන්නේ රිෂි කියලා)

මොකක්ද බං.. අහන්න කියන්න එපැයි.. අපි මේ තවම ගෙදර යන මග...

ආ එහෙමද.. ඔයාට කතා කරන්න අමාරුයිද දැන්..

නෑ නෑ.. ඔයා කියන්නකෝ.. ඇයි මේ බය වෙලා වගේ අනික මේ මහ රෑ.. මැච් එක ඉවර වෙලත් පැය ගානක් ගිහිල්ලනේ.. උබ තාම නිදි නැද්ද??

අනේ බං කියන්න දියන්කෝ.. මම නිදාගෙන ඉද්දී එකපාරටම කෝල් එකක් ආවා මිහිලැල්ගෙන්..

මිහිලැල් ගෙන්.. මේ මහ රෑ.... ආ.. උන්ට දවල් වෙන්න ඇති.. ??? උට අමතක වෙලා ගන්න ඇත්තේ අපිට මේ රෑ කියලා..

අනේ නෑ බං.... ඌ ලංකාවට ඇවිල්ලා..

මොකක්.. ලංකාවට.. ඒත් එනවා කියලවත් කිව්වේ නැනේ..අඩුම ඌ ගියාට පස්සේ මට හරියට කතා කරෙවත් නෑ..

ම්ම්ම්... මෙහෙමයි මට කෝල් එකක් දීලා කිව්වා එයා එනවා කියලා.. ඒ වෙද්දිත් airport ඇවිල්ලලු ඉන්නේ flight එකට නගින්න..

ආ ඒමද?? ඒත් ඇයි දැන් උබ බය වෙලා..

අනේ බං ඌ accident වෙලා..



මොනවා... ඒ කොහෙදිද...

කටුනායක ඉදලා ගෙදර එද්දී accident වෙලා තියෙන්නේ.. මට මිහිලැල් ගේ ෆෝන් එකෙන් මිහිලැල් ගේ අක්කා කෝල් එකක් දුන්නේ... උබට කෝල් ගත්තලු උබ අන්ස්වර් කරේ නැලු.. මං කිව්ව ඔයා මැච් එකේ ඉන්න හින්දා වෙන්න ඇති කියලා..

අනේ බං එයාට ප්රශ්නයක් නැතුව ඇති නේද??

අක්කා කිව්ව විදිහටනම් ටිකක් බරපතලයි වගේ බං..

මොකක්.. අනේ...... ඇයි බං මටම මෙහෙම වෙන්නෙ..�

දැන් උබට මොකක්ද උනේ..

නෑ.. මං හිටියේ ඉවසගන්න බැරි ප්රශ්නෙක ඒ ප්රශ්නෙන් මිදිලා දැන් අද පොඩි සතුටක් ආවා විතරයි දැන් ආයෙත් ප්රශ්නයක්..

හරි හරි.. මං මේ උබට පණිවිඩේ දෙන්න ඕන හින්දා කෝල් ගත්තේ.. හෙට උදේ බලමුකෝ..

අහ් හරි බං.. Good night..

මොකද නංගි බය වෙලා වගේ කතා කරේ.. මොකද වෙලා තියෙන්නේ...

අයියේ.... මිහිලැල් රට ඉදන් ඇවිල්ලා.. එයා කටුනායක airport එකේ ඉදලා ගෙදර යන ගමන් ඉද්දී දැන් පොඩ්ඩකට ඉස්සෙල්ල accident වෙලා.... අනේ අයියේ ඇයි එහෙම වෙන්නෙ..

ම්ම්ම්ම්.... පව් අනේ.. ඌ මොනවා උනත් හොද එකා... දැන් මොකද වැඩි අවුලක් නැතුව ඇතිනේ..

මිහිලැල් ගේ අක්කා කියලා තියෙන විදිහටනම් ටිකක් අමාරුයි වගේලු..

අනේ අයියේ අපි හෙට යමුද...

හ්ම්ම්.. හෙට උදේ මොකක් හරි කරමුකෝ අපි....

ගෙදර ගිහින් wash දාලා එහෙම හොදට නිදාගන්න හිටිය මම අන්තිමේදී ඒ රැයත් ගත කරේ මාරම බරක් ඔලුවේ තියාගෙන.. මොනවා උනත් හොද මිනිස්සුන්ට තමා ගොඩක්ම කරදර වෙන්නෙ..???

# විසිවන පරිච්ඡේදය

පහුවදා උදේම මම ෆෝන් එක අතට ගත්තේ මිහිලැල් ගේ අක්කට කෝල් එකක් ගන්න..එයාට කෝල් ගත්තට අන්ස්වර් කරන්නේ නැනේ.. අනේ මිහිලැල් ට මොකක් හරි කරදරයක් ද දන්නේ නෑ... කොච්චර හොඳ දේවල් හිතන්න හැදුවත් හිතෙන්නෙම නරක දේවල්...⍰⍰



කල්පනා කර කර ඉද්දී දුෂි කෝල් එකක් ගත්තා මට..

හෙලෝ...good morning..

Good නම් නෑ වගේ බං.....

අනේ හලෝ.. ඔයා මිහිලැල්ලගේ ගෙදරට කතා කරාද?? මං එයාගේ අක්කට ගත්තට අන්ස්වර් කරන්නේ නෑනේ...

ම්ම්.. එයාල හොස්පිටල් ඇත්තේ... මේ මොකද කියන්නේ හවස යමුද අපි...

අනේ හා යමු..... මොන හොස්පිටල් එකේද ඉන්නේ... අනේ මං මොකුත්ම විස්තරක් දන්නේ නෑනේ...

රිෂාරලගේ තාත්තා මිහිලැල්ලගේ තාත්තට කෝල් එකක් අරන්...එතකොට කියලා මුලින් කට්ටිය එයාව admit කරලා තියෙන්නේ general hospital එකේලු.. ඊට පස්සේ ගෙදර කට්ටිය ගිහින් එයාව private hospital admit කරලා...

ම්ම්ම්.. එහෙමද?? හරි දැන් අපි කොහොමද යන්නේ.. කව්රු කව්රුද යන්නේ

. ක්ලාස් එකේ සෙට් එකම යනවා කිව්වා.. එක එක්කෙනාගේ වාහන වල සෙට් වෙලා යමු බං.. කොළඹ යන්න ඕනෙනේ..

ඔව් ඒක තමා නේද?? අපේ ලොකු අයියා ගෙදර ඉන්නවා.. අපිට ඕනෙනම් එන්න පුළුවන්...

ආ එහෙමද?? හරි එහෙනම් මමයි දෙව්ෂි ඔයාලත් එක්ක යන්න එන්නම්..

හ්ම්.. හරි කීය වෙද්දිද එකතු වෙන්නෙ කියලා මට මැසේජ් එකක් දාන්න ඔයා එහෙනම්..

අහ් හරි හරි...

හවස 2.00 වෙද්දී මමයි ලොකු අයියයි කුරුණෑගලට ගියා.. අපි සෙට් එකේ වාහන තුනක් ගියා.. අපේ වාහනෙයි, අනර්සලගේ එකයි, ලවන්ලගේ එකයි... අපි hospital එකට යද්දී මිහිලැල්ලගේ පව්ලේ හැමෝම වගේ හිටියා.. මිහිලැල් ට සිහිය නෑ.. එයා ඉන්නේ අර machine එකක් ගහලා.. තව දවස් තුනක් බලලා ඒත් මිහිලැල්ට සිහිය ආවේ නැත්නම් ඒ machine ගලවන්න වෙනවලු..????

අනේ... අපිත් එක්ක පිස්සු නට නට හිටපු ළමයා දැන් කිසි සද්දයක් නැතුව ඇදක් උඩට වෙලා ඉන්නවා.... ? ඔහොම වෙන්න එයා මේ ආත්මෙනම් කිසිම වැරද්දක් කරන්න නැතුව ඇති. කලින් ආත්මේ මොකක් හරි හින්දා තමා.. නැත්නම් මෙච්චර පොඩි වයසේදී මෙච්චර බරපතල වෙන්න තරම්.....එදා රෑ අපි කට්ටිය ගෙදර ඇවිල්ලත් කතා කර කර හිටියේ මිහිලැල් ගැන.. එයාව airport එකේ ඉදන් එක්කන් එන්න ගිය driver ට මොකුත්ම වෙලා නෑ.. මිහිලැල් ට විතරයි තුවාල වෙලා තියෙන්නෙත්... මම රෑ බුදුන් වදිද්දී ප්රර්ථනා කරේ මිහිලැල් ට ඉක්මනට සිහිය එන්න කියලා... ඒ වගේම

මගෙයි ආදිච් අයියගෙයි ප්‍රශ්නෙටත් ඉක්මනට උත්තරයක් ලැබෙන්න කියලා...

මං හිතන්නේ අපේ යාලුවෝ සෙට් එකෙන් මං විතරයි මෙච්චර ලොකු බරක් ඔලුවේ තියාගෙන ඉන්නේ....??

දවස් තුනක් නිකන්ම ගියා.. අපි හැමදාම මිහිලැල්ලගේ ගෙවල් වලට කෝල් කරලා එයා ගැන විස්තර ඇහුවා.. ඒත් අන්තිමේදී ලැබුනේ අපි කවදාවත් හිතුවේ නැති කවදාවත් කාටවත්ම වෙන්න කියලවත් හිතන්නේ නැති දෙයක්.. මිහිලැල් ගහලා හිටපු machine ගලවනවලු අද හවස... ඒ කියන්නේ ආයේ අපිට මිහිලැල් එක්ක වචනයක්වත් කතා කරන්න බැරිද?? සෙට් එකේ හිටපු අහිංසකම එක්කෙනක් තමා මිහිලැල්..??????????

ඔව්.. එයා මේ ලෝකේ අතැරලා යන්නම ගිහින්..අපි හැමෝම ඇඩුවා...?කවදාවත් කාටවත්ම කරදයක් කරන්න හිතපු නැති මනුස්සයෙක් අද එකපාරටම අපි අතරින් වෙන් වෙලා ගිහින්...අපේ සෙට් එකෙන් වැඩියෙන්ම සල්ලි තිබ්බේ මිහිලැල් ට.. එයාගේ තාත්තා ලංකාවේ ප්‍රමුඛ පෙලේ ව්‍යාපාරිකයෙක්... එච්චර ලොකු මනුස්සයෙක්ගේ ළමයෙක් වෙලාවත් අන්තිමේදී කාටවත්ම මිහිලැල්ව බේරගන්න බැරි උනා...මට මේක දරාගන්න අමාරුයි.. ????මට තියෙන ලොකුම දුක අන්තිම දවස් වල මිහිලැල් මාත් එක්ක එච්චර හොදින් නෙමෙයි හිටියේ... එකපාරටම රට ගියා..මාත් එක්ක කෝල් එකෙන්වත් හරියට කතා කරේ නෑ....?

අද මිහිලැල් ගේ අවසන් කටයුතු.. අපේ පවුලේ හැමෝම මිහිලැල්ගේ ගෙදර ගියා.. අපිත් එක්ක ආදිච් අයියත් ආවා...?මං හිතන්නේ මම වෙන්න ඇති මේ ලෝකේ වැඩියෙන්ම දරා ගන්න පුළුවන් ළමයා.. මෙච්චර ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙද්දී මෙච්චර මේ අපිත් එක්ක හොදටම හිටපු අපේ හොදම

යාලුවෙක් අපිව අතැරලා ගිහින් තියෙද්දිත් මම මෙහෙම ඉවසගෙන දරාගෙන ඉන්නවා කියන එක මටම පුදුමයි.. මං හිතන්නේ මට ඒ දරගැනීම් ඔක්කොම ඇවිත් තියෙන්නේ අයියලා දෙන්නගෙන්... කොහොමත් ඒ දෙන්නා නැත්නම් මං මෙලහකට ජීවිතෙත් නැතිකරගෙන ප්‍රශ්න ඉවසන්න බැරුව..?

මට රෑ නින්දෙනුත් එක්ක මිහිලැල්ව මැවිලා පේනවා....?

මිහිලැල් ගේ හත්දවසේ පිංකමට කලින් දවසේ අපි හැමෝටම මැසේජස් ආවා ඊලග සති දෙක ඇතුලත කැම්පස් පටන් ගන්නවා කියලා.. මුලින්ම කැම්පස් යන දවසේවත් මට සතුටින් යන්න නෑ.. තවම ආදිව් අයියගේ ප්‍රශ්නේ විසඳුනෙත් නෑ... මම ඇත්තටම හිතුවේ කැම්පස් පටන් ගන්න කලින් ඒ ප්‍රශ්න ඔක්කොම විසදෙයි කියලා....අනේ plz දෙවියනේ කැම්පස් යන්න කලින් මේ ඔක්කොම ප්‍රශ්න විසදලා දෙන්න..???

මිහිලැල්ගේ හත්දවසේ පිංකමුයි ඔක්කොම ඉවර වෙලා දවස් දෙකක් යන්නත් කලින් මිහිලැල්ගේ අක්කා මට කෝල් එකක් ගත්තා.... එයා තවම අවුලෙන් ඉන්නේ.. එයා විතරක් නෙමෙයි අපිත් එහෙම තමා..ඒත් අක්කා තවත් මොනවා හරි බරක් ඔලුවේ තියාගෙන කතා කරනවා වගේ තමා මට දැනුනේ..

නංගි... අනේ නංගි මට ඔයාව හම්බෙන්න ඕනි...

අනේ ඇයි අක්කේ.. මොකක්ද උනේ..

නංගි ඔයයි ඔයාගේ පවුලේ හැමෝමයි ආදිච් මල්ලියි කට්ටියම ඉන්න තැන මට ඔයාලට කියන්න දෙයක් තියෙනවා.. අනේ පුලුවන්නම් හැමෝම ඉන්න දවසක් කියන්න..

අනේ අක්කේ ඒ මොකක්ද?? අපි අනිද්දනම් කට්ටියම ගෙදර ඉන්නේ...ආදිච් අයියටත් ඕනෙනම් එන්න කියන්නම්...

අනේ හරි නංගි.... එහෙනම් අනිද්දට මං ඔයාලගේ ගෙදර එන්නම්..

අක්කට අමාරුයි නම් අපි එන්නම් අක්කේ...

නෑ නෑ නංගි.. මං එන්නම්...?

අහ් හරි අක්කේ..

ඇයි ඒ එකපාරටම මිහිලැල්ගේ අක්කා අපේ ගෙදර එන්නේ... මොකක් හරි ප්රශ්නයක් ද දන්නේ නෑ... මිහිලැල් නැතිවෙලා තවම සති දෙකක්වත් ගියෙත් නෑ.. ??

අද දවල් 12.00 -1.00 වෙද්දී මිහිලැල් ගේ අක්කා එනවා කිව්වා.. ආදිච් අයියත් අපේ ගෙදර ඇවිත් ඉන්නේ.... මං නම් ආදිච් අයියත් එක්ක ඉස්සර වගේ කතා කරන්න ගියේ නෑ...?

මට ප්රශ්නේ තියෙන්නේ ඇයි ඒ අක්කා ආදිච් අයියත් ඉන්න දවසකම එන්න ඕනේ කිව්වේ කියලා..?

මීම්ම්... මිහිලැල්ගේ අක්කා ආවා..අක්කා විතරක් නෙමෙයි මිහිලැල් ගේ අම්මත් ආවා... හැ.. මේ මොකද මේ..?

එයාල ඇවිත් ටිකක් වෙලා කතා කර කර ඉද්දී මම ඇහුවේ දැන් ඇයි මේ එකපාරටම ආවේ කියලා...මොකක් හරි ප්රශ්නයක් ද කියලා...

අනේ නංගී... නංගි අපිට සමාවෙන්න..

සමාවෙන්න.. මේ මොකද අනේ මේ..මොකටද අනේ සමාව...

මොකක්ද දැන් ඔයාලා කරපු වැරැද්ද..

නංගි....මේ ආදිච් මල්ලියි ඔයයි අතර මේ ලගදි මොකක් හරි ප්රශ්නයක් උනාද??

අක්කේ...ඇයි මේ.. අනික ඔයාලා කොහොමද ඒක දන්නේ...

ඒ වෙලාවෙනම් අපේ පවුලේ හැමෝම silent... මම විතරයි කතා කරේ.. හැමෝටම හිතාගන්න බෑ මොකක්ද වෙන්නෙ කියලා...

අනේ නංගී....

අක්කේ.. ඇයි මේ අඩන්නේ..... මොකක්ද උනේ කියන්නකෝ...

මිහිලැල් ගේ අම්මත් සද්දයක් නෑ.. එයා බිම බලාගෙන ඉන්නවා...

නංගි ඔයාට ආදිව් මල්ලිගේ මොනවා හරි ෆොටෝස් ටිකක් ආවා නේද.. ඒ හින්දා නේද ඔයාලා අතර ප්‍රශ්නයක් උනේ..

ඒ වෙලාවෙනම් හැමෝගෙම ඇස් උඩ ගියා.. මගේ හිරිගඩුත් පිපුනා....

ම්ම්ම්.. ඔව් අක්කේ.. එහෙම දෙයක් උනා තමා.. ඒත් අක්කා කොහොමද ඒ විස්තර ඔක්කොම දැනගත්තේ... මං මිහිලැල්ටවත් ඒ ගැන කිව්වේ නෑනේ..⍰

නංගි... ඒ.... ෆොටෝ ඔයාට එවල තියෙන්නේ අපේ ම...... ල්..... ලි.....

⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰
⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰

මො... මො.. මොනවා.. අ... නෙ... අ.. ක්... කේ... ඔයා මොනවද මේ කියන්නේ...⍰⍰⍰

ඔව් නංගි.. අපේ මල්ලි ඒ ඔක්කොම ෆොටෝස් එවල තියෙන්නේ... ඒ ඔක්කොම එඩිට් ඒවා... ඒ එකකටවත් ආදිව් මල්ලි සම්බන්ද නෑ.. ⍰

ඒ.. ත්... අක්කේ......

ඒක තමයි ඇත්ත නංගි...

හරි.. ඒත් කොහොමද ඔයාලා එහෙම කියන්නේ..මිහිලැල් ඔයාට කිව්වද එහෙම කතාවක්....

මම දන්නෙම නැතුව මම අඩනවා.. ආදිව් අයියගෙත් ඇහේ කඳුළු.... මිහිලැල් ගේ අක්කයි අම්මයි දෙන්නමත් අඩනවා..⍰⍰

නෑ නංගි.. අපේ මල්ලි අපිට එහෙම මොකුත් කිව්වේ නෑ... ඒත් එයාගේ personal diary එකේ ඔක්කොම ලියලා තිබ්බා...

⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰⍰

අක්කේ.. ඔයා ඔය ඇත්තමද කියන්නේ....

ඔව් නංගි... එයා ඔයාට ඒ ෆොටෝ එවල තියෙන්නේ රට ඉද්දී.. එයාමයි ඒවා එඩිට් කරලා තියෙන්නේ.. ඔයා දන්නවනේ එයා photography කරා කියලා..⍰⍰

අක්කේ.. ඒත් මිහිලැල් ට මොකක්ද තිබ්බ උවමනාව මට එහෙම ෆොටෝ එවන්න.. ඇයි ආදිව් අයියව ඒකට සම්බන්ද කරගෙන තියෙන්නේ...⍰⍰

Plzzz අක්කේ.. මට හේතුව කියන්න...

නංගි එයා ලියලා තිබ්බ විදිහටනම්,

එයා ඔයාව දැකපු දවසේ ඉඳලා ඔයාට ආදරේ කරලා තියෙනවා..?OL ඉවර වෙලා ඔයාව මුලින්ම ක්ලාස් එකේදී හම්බවෙලා හොඳම යාලුවෝ උනාට පස්සේ එයා හිතලා තියෙන්නේ ඔයත් එයාට කැමති කියලා.. ? එයා AL ඉවර වෙනකන් තමා ඉඳලා තියෙන්නේ ඔයාට කැමති කියන්න… ඒත් එයා හිතුවේ නැති විදිහට ඔයා ආදිව් මල්ලිත් එක්ක යාලු වෙලා….. අන්තිමේදී එයාට ඒක දරාගන්න බැරි හින්දා තමා AL රිසාල්ට් ආපු ගමන් රට ගිහින් තියෙන්නේ..

ඔයා දන්නවද නංගි.. එයා රට ගිය හේතුව අපිවත් දන්නේ නෑ… තාත්තා එයාට ඕනම දෙයක් කරන්න නිදහස දීලා තිබ්බේ.. ඒ හින්දා එයා වෙන කව්රු ගැනවත් හිතුවේ නෑ තනියමම රට ගියා….. එයා ගියාට පස්සේ අම්මත් අසනීප උනා….. අන්තිමේදී එයා මේ ලෝකෙනුත් යන්න ගියා…. අම්මා තාම බෙහෙත් බොනවා නංගි..??

හරි අක්කේ.. දැන් එයා ඇයි මට ආදිව් අයියගේ එහෙම ෆොටෝ එවල තියෙන්නේ…

නංගි එයා ආදිව් එක්ක මාරම වයිරෙකින් ඉඳලා තියෙන්නේ…. ඒක වැඩිවෙලා තියෙන්නේ එදා ඔයාලා tv ප්රෝග්රෑම් එකට ගිහින් ඉද්දී රිසාල්ට් ආපු වෙලාවේ ආදිව් මල්ලිත් ඔයත් එක්ක හිටියනේ.. අන්න ඒ වෙලාවේ…එයා රට ගිහින් ඔයාවයි ආදිව් මල්ලිවයි වෙන් කරන්න ඕනි හින්දා තමා එහෙම අසභ්ය ෆොටෝ හදලා ඔයාට එවල තියෙන්නේ.. එයා ඒක කරලා තියෙන්නෙත් asia cup matches පටන් ගන්න කලින් දවසේ… මොකද එතකොට ඔයත් අවුල් ගිහින් ආදිව්ටත් ඕක කියලා පහුවදා තියෙන මැචුත් ආදිව් අවුල් කරගන්නවනේ.. එයා හිතලා තියෙන්නෙම ඒ ෆොටෝ

දැක්කහම ඔයා ආදිව් ව අතඅරියි කියලා.. ඒත් එයාට හිතාගන්නත් බැරි උනාලු ඔයා කිසිම කලබලයක් කරන්නේ නැතුව හිටපු එකට.. මොකද ආදිව් මල්ලිත් මැච් වලදී කිසිම ප්‍රශ්නයක් නැතුව හොදට සෙල්ලම් කරානේ....එයා එදා ලංකාවට ආවේ අම්මගේ අසනීපෙ හින්දා... නැත්නම් එයා එහෙ ඉදලා තව මොන මොනවා කරන්න හිතාගෙන හිටියද දන්නේ නෑ... ?

මොනවා..... අක්කේ........ ම්........

එච්චර පොඩි වයසට ඔය වගේ මහ ජරා වැඩක් කරන්න තරම මිහිලැල් දරුණු මනුස්සයෙක් උනේ කොහොමද???

එයා මට ඇත්තටම ආදරේ කරානම් මම ආදිව් අයියත් එක්ක ඉන්න විදිහ දැකලා එයා සතුටු වෙලා නිහඩව ඉන්න එක නේද කරන්න ඕනේ...මොකක්ද එයා මේ කරේ කියන්නකෝ.... මං... මං කවදාවත් හිතුවේ නෑ මිහිලැල් ඒ වගේ ජරා වැඩක් කරයි කියලා....

මම කියාගෙන කියාගෙන ගියේ මට ආපු ආවේගේ නතර කරගන්න අමාරු උන හින්දා...

චූටි... අනේ පොඩ්ඩක් සන්සුන් වෙන්නකෝ... දැන් අපි වෙච්ච දේ දැනගත්තනේ.....

????????????????????

අක්කේ ඔයා දන්නවද ඔය ප්‍රශ්නේ හින්දා මම ආදිව් අයියා විතරක් නෙමෙයි අපේ පවුලේ හැමෝම ගොඩාක් මානසිකව වැටුනා.....ආදිව් අයියා ජීවිතෙත්

එක්ක නැති කරගන්න ගිහින් තිබ්බා.... ඒත් එයා එහෙම කරගෙන නැත්තේ එයාට එයා විශ්වාස හින්දයි මං හින්දයි.....

ඔයා හිතන්න අක්කේ ඔය ප්‍රශ්නේ හින්දා එක..... එක... ජීවිතයක් හරි නැතිඋනානම්...

අපිට තේරෙනවා නංගි....අපේ මල්ලි කරලා තියෙන වඩේ ගැන අපිටම කලකිරිලා ඉන්නේ... ඒකයි මේ අපි ඔයාලගේ ගෙදරටම අවේම..??

හ්ම්.. හරි.... ඔයා දන්නවද අක්කේ.. අපේ සෙට් එකෙන් මම වැඩියෙන්ම කැමති උන යාලුවෙක් තමා මිහිලැල්... එයා accident වෙලා කියලා දැනගත්තට පස්සේ මට දැනුන වේදනාව.. එයා නැති උනාට පස්සේ මට දැනුනු වේදනාව කොච්චරද කියනවනම් මට රෑ හීනෙනුත් එක්ක මිහිලැල් ව පෙනුනා........ මම හිතාගෙන හිටියේ මම මැරෙනකන් මගේ හිතින් මිහිලැල් ව අයින් කරනෙන් නෑ කියලා.. ඒ තරමට එයා හොඳ යාලුවෙක් විදිහට අපිත් එක්ක හිටියේ...

ඒත් සොරි අක්කේ.. අද ඉදලා මිහිලැල් කියලා එක්කෙනෙක්ව මම දන්නෙත් නෑ එහෙම කෙනෙක් එක්ක මං කතා කරලත් නෑ...එහෙම කෙනෙක් මගේ හිතේවත් නෑ....

අනේ නංගි...

Plz... ඔයාලා දෙන්නා දැන් ගියොත් හොඳයි තවත් මෙතන ප්‍රශ්න ඇති කරන්නේ නැතුව.....

එයාල ගියාට පස්සේ මම හයියෙන් ඇඬුවා... මම ජීවිතේ පලවෙනි වතාවට ආදිච් අයියව බදාගත්තා....

මම එයාව බදාගෙන ඇඬුවා.. ඔව් මම මහ හයියෙන් කෑ ගහලා ඇඬුවා.....



චූටි අයියා ලොකු අයියා දුශේනි අක්කා අම්මා ඒ හැමෝගෙමත් ඇස් වල කඳුළු පිරිලා.. මොකද ඒ හැමෝම මේ මාසයක් පුරාවට මාරම පීඩනයෙන් හිටියේ....එයාල හැමෝම මේකේ ඇත්ත හෙව්වා.. ඒත් ඒ කාටවටත් ඇත්ත හොයාගන්න බැරි උනා.... අන්තිමේදී ඒ වැරැද්ද කරපු මනුස්සයා මේ ලෝකෙන් යන්නමත් ගියා.....???

හරි හරි.. දැන් හැමෝම අඩන එක නවත්තගන්නකෝ.... දැන් හැමදේම හරිනේ..

ම්ම්ම්ම්ම්....

දූෂි ට කෝල් එකක් දෙන්න ඕනේ ඒ ප්‍රශ්නෙත් ඉවරයි කියන්න.. මොනවා උනත් එයා මාත් එක්ක හිටියා...

ආ.. දැන් අපි ඔයත් එක්ක හිටියේ නැද්ද..

ඇත්තටම ඔයාලා නැත්නම් මම මේ ප්‍රශ්නේ කොහොම දරාගන්නද?? ඒකනේ දෙවියෝ මට හොද අම්මෙකුයි , හොදම හොද අයියලා දෙන්නෙකුයි දීලා තියෙන්නේ.. Love uuuu❤

Adiw : අයියේ, අක්කේ,දිනෙත්,අම්මේ..... මට මුලින්ම තැන්ක්ස් කරන්න ඕනේ ඔයාලට... මෙච්චර ලොකු ප්‍රශ්නයක් වෙලාවේදී මං ගැන වැරදි දේවල් තියෙද්දී ඒකෙන් ලොකුම බලපෑම එන්නේ චූට්ට කියලා දැන දැනත් ඔයාලා මාව අතෑරියේ නෑ... හැමෝම මට උදව් කරා.. හිත රිදෙන්න එක වචනයක් කිව්වේ.... මට ආයෙත් හැමදාම මගේ මැණික ගාව හැමදාටම ඉන්න හම්බුනේ ඔයාලා හින්දා....Thank you thank you sooo much හැමෝටම....❤❤❤

මෙහෙමයි මල්ලි.. අපි දන්නවා අපේ මස්සිනා පොඩ්ඩ එහෙම වැරදි කරන එක්කෙනක් නෙමෙයි කියලා... නැත්නම් ඉතින් මේ පොඩි එකීට ඔයත් එක්ක යාලු වෙන්න දෙන්නේ නෑනේ අපි... හැබැයි ඒ ෆොටෝ දැක්කහම

කියන්න අමාරුම දේ තමා ඒ එඩිට් එච්චා කියලා.. ඒ තරමට එච්චා ඇත්ත වගේනේ..

සල්ලි බලෙයි, දරුණු හිතකුයි තියෙනවනම් මනුස්සයෙක්ට කරන්න බැරි දෙයක් නෑ අයියේ... එයාට සල්ලි තියෙන හින්දා එයා ඒ දේ කරලා හැංගිලා ඉන්න බැලුවා... ඒත් ස්වභාවධර්මයත් එක්ක ඒ සෙල්ලම් බෑ... අන්තිමේදී ස්වභාවධර්මයා විසින්ම එයාට දඬුවම් දුන්නා..???

එළියෙන් හරි අහිංසක හොඳ මනුස්සයෙක් වගේ හිටියට ඒ මිනිස්සුන්ගේ ඇත්ත ස්වරූපේ මතුවෙන්න නම් ඔය වගේ අවස්ථාවක් එන්න ඕනේ...??

අම්මේ.. ආදිච් අයියත් ඉන්න එකේ අපි පන්සල පැත්තේ ගිහින් එමුද... මේ දවස් ටිකේම ප්‍රශ්න ගොඩක ඉඳලා මට දැන් පිස්සු වගේ... අනික කැම්පසුත් පටන් ගන්නවනේ..

ම්ම්ම්.. මමත් කියන්න හිටියේ.. අපි පන්සල පැත්තේ යමුද කියලා...

ආ.. එහෙනම් ඉතින් ඔයාලා කට්ටිය අනුරධපුරේ පැත්තේ ගිහින් එන්නකෝ... මම ගෙදර ඉන්නම්..

අනේ මරුනේ.... යමු යමු...

අනේ අම්මේ මේ.. ඔයත් යමු අනේ....

මේ දවස් ටිකෙම් හරියට වැඩටවත් යන්න බැරි උනානෙ.. මං හෙට වැඩට යන්නත් ඕනේ හින්දා ඔයාලා ගිහින් එන්න...

හරි හරි අම්මේ.... වැඩට යන්න බරියෑ.. අපි අද හවස යමුකෝ...

හ්ම් හ්ම් එහෙනම්..

ආදිච් මල්ලි ඔයාට ප්රශ්නයක් නෑනේ..

මම ඕනම වේලාවක ready..?

එහෙනම් හරිනේ.. හැමෝම යමු අද රුවන්වැලිමහාසෑය ලගට... ගිහින් හිතේ තිබ්බ ඔක්කොම ප්රශ්න වලින් මිදිලා ඔලු ටික නිදහස් කරගෙන එමු...❤ ❤ ❤

කට්ටියම තමන්ගේ වැඩ කරගන්න තැන් තැන් වලට විසිරුනාට පස්සේ මමයි ආදිච් අයියයි ගියේ එලියට..

චූටි.. ආයේ කවදාවත් මාව අත්හරින්න හිතන්නේ නෑ නේද..

අනේ අයියේ... ඔයා දන්නවද මම ඔයත් එක්ක වැඩිය කතා කරන්නේ නැතිව හිටියට ඔයා ගැන මගේ හිතේ තිබ්බ ආදරේ චුට්ටක්වත් අඩු උනේ නෑ.. අපි දෙන්නා හැමදාම එකට ඉන්නවා.. ආයේ ඒක කාටවත්ම වෙනස් කරන්න

බෑ...❤ මම දැන් මේ අල්ලගත්ත ඔයාගේ අත ආයේ අතාරින්නෙ නෑ කවදාවත්...

මමත් දැන් මේ අල්ලගත්ත ඔයාගේ අත කවදාවත් අතාරින්නෙ නෑ.... Love you soo much...❤



"අහස කඩා වැටුණත් හදට  පිවිසෙන්න    පුළුවන්,

ගඟ වියළුණත් මුහුදට සෙරන දිය කඳුලු තියනවා,

අද මට හොඳින්ම තේරුණේ,

ආදරේ ඇත්තටම අසීමිතයි කියලා,

අයියලා දෙන්නෙකුගේ ආදරෙන් ගමන් කරන

නංගි කෙනෙකුගේ හදවතට,

සෙරෙන ආදරේ සදහසින් සවන් දෙනවා.

# නිමි...

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ වෙ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවෙකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂනාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂනය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂනය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘතී රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමාය බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,සෙනෙවිරත්න මහලේකම්

978-624-208-360-5